# සත්‍යෝදය

බෞද්ධයන්ට හිතන්නට
උගන්වන ලිපි පෙළකි



වල්පොළ රාහුල

# සත්‍යෝදය

(බෞද්ධයන්ට හිතන්නට උගන්වන
ලිපි පෙළකි)

කැලණි විශ්වවිද්‍යාලයේ කුලපති අග්ගමහාපණ්ඩිත,
ධර්මශාස්ත්‍රශිරෝමණි, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය
**පූජ්‍ය වල්පොල ශ්‍රී රාහුල**
මහාචාර්යපාදයන් වහන්සේ
විසිනි

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
කොළඹ 10

1992

ප්‍රථම මුද්‍රණය 1992

© වල්පොල රාහුල

කොම්පියුටර් ටයිප්සෙටිං :
සීමාසහිත මල්ටි පැක්ස් (ලං.කා) සමාගම
කොළඹ 7

ඕෆ්සෙට් මුද්‍රණය :
චතුර මුද්‍රණාලය
142, අවිස්සාවේල්ල පාර
වැල්ලම්පිටිය

ප්‍රකාශය :
ඇස්. ගොඩගේ හා සහෝදරයෝ
675, පී.ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10

ISBN 955-20-0823-9

# කර්තෘගේ නිවේදනය

1933 දෙසැම්බර් පටන් 1934 සැප්තැම්බර් දක්වා කාලය තුළ මවිසින් ලියන ලද සත්‍යෝදය නම් පත්‍රිකා හතක් මුද්‍රණය කොට නොමිලයේ බෙදා හරින ලදී. ඒ සඳහා වියදම් දරන ලද්දේ කොළඹ ජේ.ඩී. ප්‍රනාන්දු සමාගමේ රිච්මන්ඩ් ධර්මසේන, වැල්ලවත්තේ යූ.ආර්. ප්‍රනාන්දු, වැල්ලවත්තේ ඩබ්ලිව්. එන්. ප්‍රනාන්දු, දෙමටගොඩ එඩ්මන්ඩ් වීරකෝන් යන මහතුන් සහ ගාල්ලේ ඊ.එල්. කාරියවසම් මැතිණියත් කොළඹ ග්‍රන්ථප්‍රකාශ යන්ත්‍රාලයත් විසිනි. ඒ සියල්ලන්ට මගේ කෘතඥතා පූර්වක අවංක ස්තුතිය හිමි වෙයි.

ඒ කාලයේ මේ පත්‍රිකා කියවූ බොරලැස්ගමුවේ ජී.එච්. පෙරේරා කවිවරයා ප්‍රකාශ කළා "රාහුල හාමුදුරුවෝ අපට හිතන්ට ඉගැන්නුවාය" කියා. මීට අවුරුදු හැටකට පමණ ඉහතදී ලියන ලද නමුත් මේ පත්‍රිකාවල ගැබ්වී ඇති අදහස් හා විවේචන එදටත් වඩා අද අවශ්‍යයි, කාලෝචිතයි. එද බුද්ධශාසන අමාත්‍යාංශයක් තිබුණේ නෑ. මිනිස්සු නිදහස්ව ආගම ඇදහුව. එද සුදු වස්ත්‍ර හැඳගත් (ඕදාතවසන) දසසිල් උපාසිකාවෝ නිදහස්ව පාරේ තොටේ ගමන් කළා. අද කහවස්ත්‍ර හැඳගත් දසසිල් උපාසිකාවන් (මාතාවන්) පොලිස් ආරක්ෂාවරණ ඇතිව "බෝධිපූජා"වලට අරගෙන යනව.

ජී.එච්.පෙරේරා කවිවරයා කීවාක් මෙන් මේ ලියවිලි සිතන්ට උගන්වන පාඩම් මාලාවකි.

ධර්මශාස්ත්‍රෝන්නතිකාමී,
වල්පොළ රාහුල

1992 නොවැම්බර් 5
"කේතුමතී"
බෞද්ධායතන මාවත
කෝට්ටේ

# පටුන


| | පිටුව |
|---|---|
| නියම බුද්ධපූජාව | 1 |
| දේවතාරාධනාව සහ ධර්මපූජාව | 11 |
| ත්‍රිවිධරත්නයට කරන අපහාස | 17 |
| භික්ෂූන්ගේ කුලභේදය | 23 |
| පින්කම් හා ප්‍රාර්ථනා | 28 |
| මතභේදය | 45 |
| සංඝරත්නය හා සාංඝිකය | 61 |

# 1

# නියම බුද්ධ පූජාව

**කියවන්නා:** බුද්ධ පූජාවට ඔබ විරුද්ධය යන ආරංචියක් පැතිරී තිබේ. ඒ ගැන රටේ කැළඹීමක් පවත්නා බැව්ද රහසක් නො වේ. මේ පිළිබඳ සත්‍යය කුමක්දැයි දැන ගැනීමට කැමැත්තෙමි.

**කර්තෘ:** මම කිසිසේත් බුද්ධ පූජාවට විරුද්ධ නොවෙමි: යළි, මම එය කිරීමට බලවත් ලෙස අවවාද කරන්නෙක්මි. ආමිස-ප්‍රතිපත්ති යන ද්විවිධ පූජාවටම තථාගතයන් වහන්සේ තරම් සුදුස්සෙක් නැත. අද බෞද්ධයෝ බුද්ධපූජා නොකෙරෙති: බුදුරජාණන් වහන්සේට සුදුසු පූජා නොපවත්වති: "බුද්ධ පූජා" යන උතුම් ලේබලය පිටතින් අලවා නොඑක් විකාර කරති: විහාර මලුවක පිතුම් ගැසීමත්, නොඑක් විහිළු තහළුවලින් යුත් පෙළහරක් යැමත්, ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පාන වර්ග තැබීමත්, තවත් අනේකප්‍රකාර විකාර කිරීමත් බුද්ධපූජා ලෙස සලකති. නමුත් මේවා උන්වහන්සේට සුදුසු පූජා නොවෙති.

**කියවන්නා:** "බුද්ධ පූජා" යන වචනයෙන් මා අදහස් කෙළේ බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පානවර්ග තැබීමයි. මෙය අපේ පරම්පරාගතව එන චාරිත්‍ර ධර්මයකි. ඔබ ඊට විරුද්ධද?

**කර්තෘ:** විරුද්ධකම කෙසේ වෙතත්, ඒ පිළිබඳ මගේ අදහස අද රටේ පිළිගත් මතයට වෙනස් බව නම් ඇත්තකි.

**කියවන්නා:** ඒ කුමක් ද?

**කර්තෘ:** එය බුද්ධ පූජාවක් නොවේය යනුයි.

**කියවන්නා:** ඔබගේ අදහස භයානකයි, අන්තරායදායකයි, එය මිථ්‍යාදෘෂ්ටියකි.

**කර්තෘ:** ප්‍රිය මිත්‍රය, කලබල නොවනු මැනවි, නොකිපෙනු මැනැවි. යම්කිසි කරුණක් පිළිබඳව, තමාට නුපුරුදු අලුත් මතයක් පිළිබඳව සාකච්ඡා කරන විට ඉවසිල්ලෙන්, මෛත්‍රියෙන් සහ සමාදානයෙන් යුතුව, ශිෂ්ට ධර්මයන් නො ඉක්මවා කළ හැකි නම්, මා සිතන හැටියට, එය, බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ග තැබීමට වඩා උතුම් බුද්ධ පූජාවක් වෙයි. එනිසා නොකිපෙනු මැනවි. මා කියන දෙය ඉවසිල්ලෙන් අසා නුවණින් සිතා බලන්න.

අපේ යම්කිසි ඥාතියකු මළ විට, ඔහු වෙනුවෙන් ආහාරයක් වෙන් කොට තැබුව හොත් එය ඥාති ප්‍රේතයාට බිලි වශයෙනැයි මිනිස්සු කල්පනා කරති. මළගියවුන්ට ආහාර පිදීමේ අදහස එයයි. අපේ ජාතික වීරයකුගේ ප්‍රතිමාවක් ඉදිරියෙහි කෑම බීම තැබුවහොත් එය කෙබඳු දර්ශනයක් වේ දැයි සිතා බලන්න. බෞද්ධයෝ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පාන වර්ගයන් තබා, විහාර කාමරයෙහි දොර වසා, බුදුරජාණන් වහන්සේගේ ආත්මයට නැතහොත් අවතාරයට අවුත් එය ඉඳුල් කරන්නට ඉඩ දෙන්නාක් මෙන් පිටතටවී ස්වල්ප වේලාවක් බලා සිටිති.

සමහර තැන්වල බෞද්ධයෝ ආසනයක් පනවා එහි වැඩ හිඳින ලෙස ප්‍රතිමාවට ආරාධනා කරති. ඊට පසු, මුව දොවන්නට පැන්ද, අනෙක් ආහාර පාන වර්ගයන්ද, දැහැත්ද, පඩික්කමක්ද පිළියෙළ කොට තබති. මෙය කොතරම් සිනහ උපදවන බොළඳ වැඩපිළිවෙළක්දැයි සිතා බලනු මැනැවි.

ආහාර පානාදි බාහිර දේවල් උසස් හැටියට හැඟෙන්නේ අභ්‍යන්තර දියුණුව අඩු පමණටය. තිරිසනාට සියල්ලටම වඩා උතුම් දෙය ආහාරයයි. ඥානයෙන් සහ ගුණයෙන් දියුණු නොවූ කල්හි වැඩුණු මනුෂ්‍යයා තුළද ඒ අදහස එසේමය.

ශීල, සමාධි, ප්‍රඥාවන්ගෙන් අග තැන්පත් බුදුරජාණන් වහන්සේ වැනි උතුමකුට, උන්වහන්සේ පිරිනිවන්පා අවුරුදු දෙදහස් පන්සියයකට පසුත්, ආහාරපාන වර්ගවලින් ගරු කරන්නට සිතීම අපේ අභ්‍යන්තර ගුණ දහම් දියණුවේ අඩුකම විදහා පෑමකි. බාහිර ලෙසකින් උන්වහන්සේට සෑහෙන ගෞරවයක් කරන්නට අපට පුළුවන්කමක් නැත. තමන් වහන්සේට ගෞරවය ප්‍රතිපත්ති පූජාව බව තථාගතයන් වහන්සේ විසින් බලවත් ලෙස දේශනා කරන ලදී.

**කියවන්නා:** එතකොට බාහිර වශයෙන් දානමානාදියෙන් තථාගතයන් වහන්සේට ගරු කිරීම නුවුවමනා ද?

**කර්තෘ:** නැත: එය එසේ නො වේ. බුදුරජාණන් වහන්සේට ආහාර පානයකින් සංග්‍රහ කරන්නට යමෙකුට ඉඩක් ලැබෙතොත්, සැබැවින්ම එය මහත් වාසනාවකි. උන්වහන්සේගේ ශරීරයටද, අනෙක් සත්වයන්ගේ ශරීරයට මෙන්, කෑම්, පීම්, ඉඳුම්, හිටුම්වලින් ප්‍රයෝජනය ලැබේ. ඒ ජීවමානව සිටියදීය. නමුත් අද උන්වහන්සේ ජීවමානව නැති බැව් අපි හොඳින්ම දනිමු. එනිසා ආහාර පානාදියකින් උන්වහන්සේට සංග්‍රහයක් කරන්නට අපට ඉඩක් නොලැබීම මහත් කනගාටුවකි.

**කියවන්නා:** මේ ජීවමාන බුදුන්ය යන හැඟීමෙන් ප්‍රතිමාවකට ආහාර පාන වර්ග පිදුවහොත් එය වැරදිද?

**කර්තෘ:** ප්‍රතිමාවක් පිළිබඳව මේ ජීවමාන බුදුන්ය යන හැඟීමෙන් ගරු සත්කාර කරන බැව් බොහෝ අය කියති. එය එසේම දැයි මට තේරුම් ගත නොහැක. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදී, උන්වහන්සේගේ අසනීපයකට බෙහෙතක් සපයන්නට අපට අවස්ථාවක් ලැබුණි නම්, අහෝ! එය කෙතරම් වාසනාවක්ද! අද උන්වහන්සේ ජීවමානව නැති බැවින් උන්වහන්සේගේ රෝගයකට අපට බෙහෙත් කරන්නට ඉඩක් නැත. නමුත් යම් කිසි ශ්‍රද්ධාවතෙක් ප්‍රතිමාවකට

රෝගයක් වැළැඳුනාක් මෙන් සිතා ගෙන, හොඳ හැටි ඇඳක් සරසා, ප්‍රතිමාව එහි සතප්පවා, සිවුරක් පොරවා, "වරෝ! බුදුහාමුදුරුවන්ට අසනීපයක් හැදිලාය" කියා, වියදම් කොට වෛද්‍යවරයන් ගෙන්වා, කෂාය උණු කොට ප්‍රතිමාවට පිළිගන්වයි නම්, මෙය මොන තත්ත්වයේ විහිළුවක් වේදැයි සිතා බැලිය යුතුයි.

බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදී කළ හැකි හැම සත්කාරයම උන්වහන්සේ පිරිනිවි පසුත් කරන්නට නුපුළුවන් බැව් සැලකිය යුතුයි. දැන් අපට කළ හැකි සත්කාර මොනවා දැයි සොයා බැලීම නුවණැතියන්ගේ පිරිතයි.

**කියවන්නා:** එතකොට අප විසින් ඒ ගැන කුමක් කළ යුතුද?

**කර්තෘ:** ගිලනුන්ට, රෝගීන්ට උපස්ථාන කිරීම තමන් වහන්සේට කරන උපස්ථානයකැයි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී. උන්වහන්සේගේ අසනීපයකට අද අපට උවැටන් කරන්නට නුපුළුවන් බැවින්, උන්වහන්සේගේ වචනයට අනුව අප විසින් අසරණ, දුප්පත් රෝගීන්ට කරුණාවෙන් සංග්‍රහ කළ යුතුයි. එය උන්වහන්සේට පූජාවයි.

එසේම, අද අපට උන්වහන්සේගේ ප්‍රයෝජනය පිණිස දානයක් දිය නොහැකි බැවින්, අප විසින් කළ යුත්තේ නිරාහාරව කුස ගින්නෙන් පෙළෙන අසරණයන්ට ඒ වෙනුවෙන් සංග්‍රහ කිරීමයි. එය උන්වහන්සේට කරන ගෞරවයකි.

බෞද්ධයන් නුවණ මෙහෙයා ක්‍රියා කළ යුතුයි. ආහාරය වුවමනා කරන්නේ එය පරිභෝග කළ හැකි පුද්ගලයකුටය. යමක් දිය යුත්තේ ප්‍රයෝජනය ගත හැකි පුද්ගලයකුටය. ප්‍රතිමාවකට ආහාරයෙන් ප්‍රයෝජනය නැති බැව් අපි හොඳින්ම දනිමු.

එක්තරා පාසැලක් අසල පිහිටි විහාරස්ථානයක විශාල ලෙස ආහාර පූජාව පවත්වනු ලැබේ. විසි තිස් දෙනෙකුන්ට යැපෙන පමණ ආහාර ඉවත ලනු ලැබේ. අර පාසැලේ ඉගෙනීමට එන ඇතැම් දුප්පත් ළමයි දවල් දහය පමණ වන විට සිහි නැතිව වැටෙති. නමුත් ඔවුන්ට එක ආහාර වේලකින් සංග්‍රහ කරන කෙනෙක් නැත. බුදුහාමුදුරුවන්ගේ නමින් ප්‍රයෝජනවත් දෙය අඥාන ලෙස අහක දමති. අර දුප්පත් දරුවන්ට සංග්‍රහ කිරීම බුදුරජාණන් වහන්සේගේ වචනය පිළිපැදීම බැව් ඔව්හු නොදනිති.

ඥානවත් ලෙස ක්‍රියා කරන්නා බෞද්ධයායි. කරන සෑම ක්‍රියාවකම තත්ත්වය නුවණින් විමසිය යුතුයි.

**කියවන්නා:** ප්‍රතිමාවකට ආහාර පානවලින් ප්‍රයෝජනයක් නැතිබවත්, ආහාර පානවලින් ප්‍රයෝජනය ඇත්තේ පාවිච්චි කළ හැකි අයට බවත් ඇත්තකි. නමුත් බුද්ධ ප්‍රතිමාවකට පිදීමෙනුත්, අසරණයකුට දීමෙනුත් වඩා පින් සිදු වන්නේ කුමකින් ද?

**කර්තෘ:** තමාට පින් බලාපොරොත්තුවෙන් යම්කිසි වැඩක් කරතොත් එය සැබැවින්ම වෙළෙඳාමකි. ඵලයට ආශාවෙන් යමෙක් යමක් කරයිනම්, එය උතුම් ක්‍රියාවක් නොවේ. කර්මඵල අදැහීම යන්නෙහි තියම තේරුමනම්, යම්කිසි ක්‍රියාවක අවශ්‍යකමත්, එහි ඇති වටිනාකම සහ ප්‍රයෝජනයත් නිසිලෙස නුවණින් තේරුම්ගැනීමයි. ඵලය තේරුම්ගැනීම එකකි, එයට ආශා කිරීම අනෙකකි. ප්‍රතිමාවක් ඉදිරියේ කෑම බීම තබා අහක දැමීමෙනුත්, කුසගින්නෙන් පෙළෙන අසරණයකුට කරුණාවෙන් මෛත්‍රියෙන් යුතුව සංග්‍රහ කිරීමෙනුත් වඩා අවශ්‍ය ක්‍රියාව කුමක්ද? වඩා ප්‍රයෝජන ක්‍රියාව කුමක්ද? කියා නුවණින් සිතා බැලිය යුතුයි.

ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර තබන්නේ තමන් පින් ගන්නා ආශාවෙනි. එය තෘෂ්ණාවයි. ප්‍රතිමාවකට ආහාර පූජා

කිරීමේදී කරුණා, මෛත්‍රී ආදි ගුණයන් උපදවන්නට ඉඩක් නැති බැවිනි. නමුත්, අසරණයෙකුට සංග්‍රහ කිරීමේදී නියම අන්දමින් කරුණා, මෛත්‍රී ආදි ගුණයෝ සිත්හි පහළ වෙති.

දානයක් දීමෙන් දායකයා ආනිසංස පහක් ලබයි–ආයුෂ, වර්ණ, සැප, බල, ප්‍රඥා යන මේයි. මේ ආනිසංස පස දායකයාට ලැබෙන්නේ, දායකයා දානයත් සමග ඒවා ප්‍රතිග්‍රාහකයාට දෙන බැවිනි. ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පාන වර්ගයන් තැබීමෙන්, ආයුෂය, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව යන මෙයින් කිසිවකුත් ප්‍රතිමාවට නොලැබෙන බැව් අපට හස්තාමලකයක් මෙන් ප්‍රත්‍යක්ෂය. එනිසා පූජා කරන්නාටද ඒ ආනිසංස ලැබීමට කිසිත් යුතුකමක් නැත. නමුත් කුසගින්නේ පෙළෙන අසරණයකුට ආහාර පානයන්ගෙන් සංග්‍රහ කළ හොත්, මේ ආනිසංස පහම දායකයාට ලැබෙනු නො අනුමානයි.

කියවන්නා: පහන් පූජාව ගැන ඔබගේ අදහස කුමක්ද?

කර්තෘ: පහන් පූජාව ගැනත් එසේමයි. බුදුරජාණන් වහන්සේ ජීවමානව ඇත්නම්, උන්වහන්සේට වුවමනා ප්‍රදීපාලෝකය ශ්‍රද්ධාවතුන් විසින් සැපයිය යුතුයි. නමුත් අද උන්වහන්සේට පහන් එළිය සපයන්නේ කෙසේද? අසල්වැසි අසරණයා දවස මුළුල්ලේ වැඩ කොට අවුත් රෑ බත් පංගුව කෑමට එළියක් නැතිව කළුවරේ සිටියදී, කිසිත් ප්‍රත්‍යක්ෂ අදහසක් නැතිව, පන්සල් වත්තක් පුරා පහන් අසූහාර දහසක් දැල්වීම කවර නම් බුද්ධ පූජාවක්දැයි මට නොවැටහේ. බුදුරජාණන් වහන්සේ ජීවත්ව සිටින දවසකවත් මෙය උන්වහන්සේට ගෞරවයක් නොවේ. උන්වහන්සේටත් එළිය වුවමනා කරන්නේ එක මනුෂ්‍යකුට වුවමනා පමණටය. බුදුරජාණන් වහන්සේ ජීවමානව ඇත්නම්, උන්වහන්සේ මැද හිඳුවා, වටේ පහන් අසූහාර දහසක් දැල්වීම මොන තරම් පීඩාවක්දැයි සිතා බලන්න. සිද්ධස්ථානයක සුදුසු පරිදි පහන් දැල්වීම අවශ්‍යයි.

සිංහල බෞද්ධයෝ දුරදිග නොබලා ආගමේ නමින් මෝඩකම් කරති.

කියවන්නා: බුද්ධප්‍රතිමාවකට මල් පූජා කිරීම සහ වැඳීම ගැන ඔබගේ අදහස කුමක්ද?

කර්තෘ: මල් පිදීමට සහ වැඳීමටත් මම එකඟ වෙමි.

කියවන්නා: ඔබගේ අදහස් පරස්පර විරෝධියි. ප්‍රතිමාවකට ආහාරපාන වර්ගයන් පිදීම නුවුවමනා වැඩක් හැටියටත්, ඊට මල් පිදීම සහ වැඳීම වුවමනා වැඩක් හැටියටත් සිතීමට හේතුව මට නම් නොවැටහේ.

කර්තෘ: මම එය පහදා දෙන්නම්: බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි දවසේ වුවත්, මල්පිදීම සහ වැඳීම උන්වහන්සේ වැඩඋන් විහාරයෙන් හැතැප්ම දහස් ගණනකින් ඈත වසන්නකුටත් කළහැකි වැඩකි. ඒ පිණිස උන්වහන්සේගේ ශරීරය දැකීම අනවශ්‍යය. නමුත් දානයක් දීම එසේ නො වේ. උන්වහන්සේ ළඟට නොපැමිණ දානයක් පිළිගැන්විය නොහැක. දානයේ ප්‍රයෝජනය ශරීරයටයි. බුදු වුවත් ශරීරයට කෑම බීම අවශ්‍යය. මල්පූජාව සහ වැඳීම එසේ නොවේ. එහි උන්වහන්සේගේ ශරීරය හා කිසිත් සම්බන්ධයක් නැත. එය අපේ චිත්තප්‍රසාදය පිළිබඳ බාහිර ප්‍රකාශයකි. මල්පූජාව පිළිබඳ කාව්‍යමයවූද, පවිත්‍රවූද, ශිෂ්ටවූ රම්‍ය අදහස එක්තරා උසස් තත්ත්වයකට සිත දියුණු නොකළ පුද්ගලයකුට නොවැටහේ. වන්දනාවද එබඳුම වෙයි. මල්පූජාව සහ වැඳීම තථාගතයන්වහන්සේ ළඟ ඇතත් නැතත් කළ හැකි වැඩකි: එහි උන්වහන්සේගේ ශරීරය හා කිසිත් සම්බන්ධයක් නැති හෙයිනි. එසේම උන්වහන්සේ ජීවමානව ඇතත් නැතත් මල්පිදීම සහ වැඳීම කළහැක. නමුත් දන් දීම එසේ නොවේ. ඒ පිණිස උන්වහන්සේ ජීවමානව වැඩ සිටිය යුතුයි. ජීවමානව වැඩ සිටීමද ප්‍රමාණ නොවේ.

උන්වහන්සේ ළඟටම යා යුතු යි. ආහාරය හා උන්වහන්සේගේ ශරීරයත් අතර සම්බන්ධයක් ඇති හෙයිනි. ඉතින් උන්වහන්සේගේ පංචස්කන්ධය අභාවයට ගිය පසු උන්වහන්සේට අපි කෙසේ අහර පිළිගන්වමුද?

**කියවන්නා:** එතකොට මේ සිරිත පරම්පරාගතව පැවතී ගෙන එන්නේ ඇයි? පෙර රජදරුවෝ පවා මෙසේ බුද්ධපූජාව නො කොළෝ ද?

**කර්තෘ:** රජදරුවන් සත්‍යය මැනීමේ මිම්මක් කර ගැනීම අපේ බලවත් මුළාවකි. බොහෝ විට රජවරු බරපතළ අපරාධ කොට පසුව පාප විපාකයට භයින්, නොඑක් අන්දමේ බාහිර පුදපූජා පැවැත්වූහ. ධර්මය සම්බන්ධයෙන් කතාකරනවිට රජකම අගනා දෙයක් නොවේ. රජවරුන්ට බලය තිබේ. නමුත් ධර්මාවබෝධය අනෙකකි.

පරම්පරාගතව එන සිරිත්වලට භයවීම අපේ පිරිහීමට එක් හේතුවකි. පරම්පරාව ගණන්ගතයුත්තේ නොවේ. ගණන්ගතයුත්තේ සත්‍යයයි. තව අවුරුදු පණහක් සියයක් ගතවනවිට අද ජීවත්වන අපගේ වැඩත් පරම්පරාගත වෙනවා ඇත. ඉතින් ඒ කාලයේ උපදින මිනිස්සු මේවා පරම්පරාගත සිරිත්යයි අද අප කරන දේවල් භාර ගැනීමට බැඳී සිටිත්ද? හැබෑ ආත්ම ශක්තියෙන් යුත් පුරුෂයා, කොතරම් පරම්පරා ගණනක පටන් පැවැතෙන සිරිතක් වුවත්, නොමැනැවැයි හැඟුණු මොහොතෙහිම එය සුණු විසුණු කර දමයි. රාග, ද්වේෂ, මෝහයෝ පරම්පරාගතව එන පාපයෝ වෙති. ඒවාත් අත් නොහැර, පරම්පරාගත දේවල්යයි ආදරයෙන් රැකිය යුතුද? සමහරුන්ට පරම්පරාගතව එන රෝගයෝ වෙති. ඒවාත් රැකගතයුතුද? ගරු කළ යුත්තේ පරම්පරාවට නොව සත්‍යයටයි.

**කියවන්නා:** එතකොට මේවා පරම්පරාගතව පවත්වාගන එන්නේ මක්නිසාද?

කර්තෘ: මේවා පවත්වාගෙන එන්නේ ලාභ ප්‍රයෝජන නිසයි. ශාස්තෘවරුන්ගේ අභාවයෙන් පසු පූජකයෝ ඒ ඒ ආගම් ස්වකීය ජීවිකාවෘත්තියට පෙරළා ගත්හ. ධර්මය 'කණ්ඩ සූත්‍රය' කරගත්හ. එනිසා නොඑක් පුදපූජා පිළියෙළ කරන්නටත් ඒවායේ ආනිසංස වර්ණනාකරන්නටත් පටන් ගත්හ. එයම නිර්වාණ මාර්ගය බැව් පෙනෙන්නට පොත්පත් ලිවූහ. ඒ පොත්පත්වලින් සත්‍යය වසනු ලැබීය. ගැනීමට කළ හැකි සෑම ප්‍රයෝගයක්ම කළහ. එක්තරා දුප්පත් මෝඩ බෞද්ධයෙක්, අනෙක් ජාතියේ උසස්ව උපදින බලාපොරොත්තුවෙන්, පන්සලේ හාමුදුරුවන්ගේ අවවාදය පිට, බුද්ධ ප්‍රතිමාවට නොඑක් දේ පූජා කෙළේය. අන්තයට ඒ හාමුදුරුවෝ මෙසේ කීහ: "උපාසක උන්නැහේ, සියල්ලම පූජා කළත් මොකොටද? උපාසක උන්නැහේගේ ඔළුවේ කෙස් නැහැ. ලබන ජාතියේ තට්ටය ඇතිව උපන්නොත් අනෙක් සේරම ලැබුණත් මොටද? එනිසා හොඳට කෙස් ලැබෙන්න හිතා ගෙන හොඳ කිතුල්රෑනක් බුදුහාමුදුරුවන්ට පූජා කරන්න." මෝඩ උපාසකයා කිතුල් රෑන පූජා කෙළේය. හාමුදුරුවෝ පන්සල වත්තේ වැට බැඳවීමට කිතුල්රෑන පාවිච්චි කළහ. සිනාසෙන්නට එපා. මෙය ඇත්තකි. ආගම ධර්මය ලාභ ප්‍රයෝජන ගැනීමට උපායක් කරගෙන තිබේ. එනිසා මේ පූජාවල් පරම්පරාගතව පවත්වාගෙන එති. ඉතින් යමෙක් ධර්මානුකූලව මේවා එළි කොට සත්‍යය පහදා දෙයි නම්, ඔහුට විරුද්ධකම් පැන නැඟීම පුදුමයක්ද?

කියවන්නා: ආහාර පූජාව කරන්ට එපායයි ඔබ කියන්නෙහිද?

කර්තෘ: කවදා වත් මම එසේ නොකියමි. මට වුවමනා කරන්නේ කාරණය පහදා දීමයි. එය කිරීම හෝ නො කිරීම ඒ ඒ අයගේ යුතු කමකි. ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර තැබීමට වඩා ජීවත්ව සිටින අසරණයකුට සංග්‍රහ කිරීම මෛත්‍රී කරුණා ප්‍රඥා සහගත ක්‍රියාවක් බැව් යමකුට වැටහේ නම්, හෙතෙමේ එසේ

කෙරේවා! ආහාර පූජාව නොකරම බැරි වැඩක් හැටියටත්, එය ඉතාම අවශ්‍ය හැටියටත් යමෙක් සිතයිනම්, ඔහුගේ සිතේ සැනසීම පිණිස, හෙතෙමේ එසේ කෙරේවා!

කියවන්නා: මේ පරම්පරාගත සිරිත හැරදැමුවොත්, අප විසින් ඊට වඩා ප්‍රයෝජනවත්වූ, බුදුරජාණන් වහන්සේට ගෞරවයක්වූ අනෙක් දෙයක් කළ යුතුයි. ඒ පිණිස කුමක් කළයුතුද?

කර්තෘ: අප විසින් අසරණයන්ට උදව් කළ යුතුයි. අපේ ශක්තිය, බලය, අපේ ධනය අසරණයා රකින්නට යෙදියයුතුයි. බුදුරජාණන් වහන්සේගේ ධර්මය පරාර්ථය පදනම කොට ඇත්තේය. එනිසා කුසගින්නේ දුක් විඳින්නන්ට කෑම දිය යුතුයි. අඳින්නට නැතියවුන්ට වස්ත්‍ර දියයුතුයි. නවාතැන් නැති අයට නවාතැන් දියයුතුයි. රෝගීන්ට කරුණාවෙන්, ආදරයෙන් සංග්‍රහ කළයුතුයි. එය උන්වහන්සේ වෙනුවෙන් අපට කළහැකි පූජාවයි. දිනපතා කෑම උයන්නට කලින් හාල්මිට බැගින් භාජනයකට දමා, සෑහෙන පමණ එක්වූවිට එය අසරණසරණ ව්‍යාපාරයකට පරිත්‍යාග කළයුතුයි. එය බුදුන්ට කරන ගෞරවයකි, එය බුද්ධවචනය ගරුකිරීමකි. සතය බැගින් එක්කොට සෑහෙන මුදලක් වූවිට, පොතක් ගන්නට වත්කම නැති බැවින් ඉගෙනගතනොහැකිව සිටින අසරණ දරුවකුට පොතක් සපයා දියයුතුයි. පහනට තෙල් නැති කමින් කළුවරේ දුක්විඳින අසල්වැසියාට එළිය දියයුතුයි. බුදුරජාණන්වහන්සේ අවවාද කළ පරිදි අප විසින් මේවා කළයුතුයි. එය ප්‍රතිමාවකට ආහාරපාන පිදීමට වඩා විශාල බුද්ධපූජාවකි. නිකරුණේ පහන් අසූහාර දහසක් දැල්වීමට වඩා විශාල පින්කමකි.

"ජගදුපකෘතිරෙව බුද්ධපූජා,
තදපකෘතිස්තව ලෝකනාථ, පීඩා."

"ලෝකයාට උපකාර කිරීමම බුද්ධ පූජාවයි. ලෝකනාථයන් වහන්ස, ලෝකයාට වරදක් කිරීම තුඹවහන්සේට කරන පීඩාවකි."

# 2

# දේවතාරාධනාව සහ ධර්ම පූජාව

කියවන්නා: නානා නිකායික ලොකු කුඩා ධර්මකථිකයන් වහන්සේලා ධර්මදේශනාවට ප්‍රථම දේවාරාධනාවක් කරන්නටත්, තමුන්නාන්සේ එසේ නොකරන්නටත් ඇති හේතු කිම?

කර්තෘ: මා දේවාරාධනාව නොකරන්නේ දෙවියන් එක්ක ඇති අමනාපයක් නිසා නොවේ. මිනිසුන්ට මෙන්ම, අනෙක් සත්වයන්ට මෙන්ම, මම දෙවියන්ටත් ගරු කරමි. මම මිනිසුන්ට විශේෂ ආරාධනයක් නොකරමි. එසේම, දෙවියන්ටත් විශේෂ ආරාධනයක් වුවමනායයි මම නොසිතමි. ඒ ඒ තැන්වල බණ කියවන්නවුන් විසින් කරන ලද දැන්වීම් බලා, නැතහොත් දවුල් ශබ්දය හෝ ඝණ්ටානාදය අසා, නියමිත වේලාවට බණ අසන්නට පැමිණිය හැක. යම් හෙයකින් දෙවියන්ට ඒ දැන්වීමේ සිංහල කියවා තේරුම් ගත නොහැකි නම්, සිංහලෙන් අප කියන බණ තේරුම් ගන්නටද පුළුවන් කමක් ඇතැයි මම නොසිතමි. දෙවියන්ට තේරෙන්නේ පාලි පමණක් නම්, අප බණ කියන්නේ පාලියෙන් නොව සිංහලෙන් නිසා, අපේ බණ අසන්නට පැමිණීමෙන් දෙවියන්ට ප්‍රයෝජනයක් නැත. මේ වේලාවට අසවල් තැන බණ කියනවාය යන බව දැන දැනම, විශේෂ ආරාධනයක් නොකළ නිසා, දෙවියන් බණ අසන්නට නොපැමිණෙතොත්, එයින් අපට තේරුම් ගන්නට තිබෙන්නේ, ඔවුන් මහත් අහංකාර කොටසක් බවයි. එබඳු අහංකාරයක් නිසා බණ අසන්නට නොපැමිණෙතොත් එය කනගාටුදායක කරුණකි. ධර්මදේශනාව ගැන මිනිසුන්ට දන්වන්නාක් මෙන්ම දෙවියන්ටත් දැන්වීම ඒ බණ කියවන

දායකයන්ගේ යුතුකමකි. "දෙවියන්ටත් සමගයි" කියා දැන්වීමේ කොනක මුද්‍රණය කිරීම හෝ, දෙවියන් වෙනුවෙන් විශේෂ දැන්වීමක් පළකිරීම හෝ ඔවුන් රිසියෙන හැටියකට කළහැක. දේවතාරාධනාව කරන ශබ්දය දෙවියන්ට ඇසෙතොත්, ඔවුන් නොදුරක සිටිනවා විය යුතුයි. එසේ නම් ආරාධනා කළත්, නොකළත්, බණ කියන ශබ්දයද ඔවුන්ට ඇසෙනවා ඇත.

මේ හැර, බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කරනවිට, දේවාරාධනයක් කළ බවක් දීඝ, මජ්ඣිම, අංගුත්තරාදි නිකායන්හි සූත්‍රවලින් හෙළි නොවෙයි. සාමාන්‍යයෙන්, අද ධර්මදේශනාවයයි ගණිනු ලබන්නේ, ඇතිරිලි අතුරන ලද මේස පුටු ඇතිව සැරසූ මණ්ඩපයක භික්ෂූන්වහන්සේ නමක් වැඩ හිඳ ගෙන, බිම හිඳගත් පිරිසකට, පොතකින් කටපාඩම් කරගත් දෙයක්, තමන්ට තේරුණත්, නැතත් , ශබ්දනගා කීමයි. අද ධර්මදේශනාව නිකම් උත්සවයකි. එහි නියම අදහස විනාශවී තිබේ. මා ගමනක් යනවිට, කෝලාහල කරන මිනිසකු දැක, පසකට ඔහු අඬගසාගෙන ගොස්, ඔහුට හොඳින් ජීවත් වන්නට පුද්ගලිකව, හිමින් අවවාද කළහොත්, එය නියම අදහස ඇති ඉතා වටිනා ධර්මදේශනාවකි. එතනදී, ඒ මිනිහාට අවවාද කරන්නට මා සූදානම් වනවිටත් දේවාරාධනාව කරන්ටද? වැඩ සිදුවන කථාව ධර්ම කථාවයි. පාලියෙන් කියා සිංහලට පෙරළීම පමණක් ධර්මකථාව නොවේ. දේවාරාධනය නම් ලොකුකමට, බලපුළුවන්කාරකමට බියෙන් කත් අදින බැව් ප්‍රකාශ කිරීමකි. මනුෂ්‍යයන්ට වඩා හොඳින් දෙවියන් කෑම ඇඳීම කරන බැව් පොතපතෙහි කියවන්නට ලැබේ. ඒ නිසා දේවාරාධනය කරති. මේ ලෝකයේ ධනවතුන්ට මෙන් දෙවියන්ටත් බොහෝදෙනා වාල්කම් කරති. නමුත් දෙවියන්ට වඩා මනුෂ්‍යයා ශ්‍රේෂ්ඨ බැව් ඔව්හු නොදනිති. බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීමෙහි එක් විශේෂයක්නම් මෙයවේ. මා දේවාරාධනය නොකරන්නේ මේ කරුණු මෙසේ විශ්වාස කරන බැවිනි.

කියවන්නාඃ දෙවියන්ට ආරාධනා කරන්නේ දෙවියන්ගේ බල පුළුවන්කාර කමකට භයින් නොව, ඒ ඇත්තන් ශාසනය රකින නිසයි.

කර්තෘඃ මෙය තවත් බරපතළ වැරදි විශ්වාසයකි. ශාසනය නම් කුමක්ද? එය හුණුබදාම සහ ගඩොල් ගොඩක් නොවේ. කිසි පවක් නොකිරීමත්, සියලු කුසල් කිරීමත්, සිත පිරිසුදු කිරීමත් බුද්ධ ශාසනයයි. ශීල, සමාධි ප්‍රඥාවෝ ශාසනයයි. ගුණ ධර්මය ශාසනයයි. මුරකාරයකු ඉඩමක් රකින්නාක් මෙන්, ශාසනයත් දෙවියන්ට රැකිය හැකි වස්තුවක්ද? බුදුරජාණන් වහන්සේ ශාසනය බලාගන්නට කිසිවකුටත් භාර නුදුන්සේක. දෙවියන් ලවා ශාසනය රක්කවන්නට සිතීම ලොකු මුළාවකි. දෙවියන්ට ශාසනය තබා, ඇතැම්විට තමන්ගේ දේවාලයවත් රැකගන්නට බැරි බැව් පෙනේ. ශාසනය සොයා ගත්තේ මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයන් විසින්ම එය රැකිය යුතුයි.

කියවන්නාඃ මිහින්තලා පර්වතයේදී සුමන සාමණේරයන් වහන්සේ මිහිඳු මහ රහතන්වහන්සේගේ නියමය පරිදි දේවතාරාධනාව කෙළේ නැද්ද?

කර්තෘඃ එසේ කළ බැව් ඉතිහාසයෙහි පෙනේ. එය ඉතිහාසය මිස ධර්මය නොවේ. සුමන සාමණේරයන් වහන්සේ දේවාරාධනය කළත් නොකළත්, බුදුරජාණන් වහන්සේ එය කළ බවක් ත්‍රිපිටක පාළියෙහි මේතාක් අපට දකින්ට ලැබී නැත.

* * *

කියවන්නාඃ හොඳයි, ඔබ ධර්මපූජාව පිළිනොගන්නේ ඇයි?

කර්තෘඃ ධර්මපූජාව පිළිනොගැනීමට හේතු මහත් රාශියකි. සියල්ලටම පළමු කියයුත්තක් තිබේ. "බුද්ධපූජා" යන උතුම් වචනය නොඑක් විකාරවලට ව්‍යවහාර කරන්නාක් මෙන්ම "ධර්මපූජා" යන වචනයද "කණ්ඩ සූත්‍රයේ" පදයක් කරගෙන

තිබේ. ධර්මපූජාව නම් ධර්මය පිළිපැදීමයි. බණකී තැනැත්තාට යමක් දීම ධර්මපූජාව නොවේ. එය ආමිස පූජාවයි. 'ධර්මය දේශනා කරන්නාට යමක් පිදීම ධර්මපූජාවම වෙයි' යනු යට කී සූත්‍රයේ බණයි.

බැලූ බැල්මටම, දැන් පවත්නා පරිදි, ධර්මදේශනාවකින් පසු යමක් පූජා කිරීම හරියටම කුලියක් දීම වැනි වෙයි. එය පිළිගැනීම කුලිය ගැනීමක් මෙනි.

ධර්මදේශනාවෙන් පසු පූජාවක් කිරීම බුදුන් රහතන් කාලයෙහි සිරිතක් වශයෙන් පැවති බවක් ත්‍රිපිටකයෙහි නො පෙනේ. බුදුරජාණන් වහන්සේගේ ධර්මයක් අසා එක්තරා මිනිසකු මහත් ශ්‍රද්ධාවෙන් තමා ළඟ තිබුණු වස්ත්‍රයක් උන්වහන්සේට පූජා කළ කථාවකුත්, රජගෙදර ස්ත්‍රීන්ට බණ ඉගැන්වූ අනඳ මහ තෙරුන්වහන්සේට කරන ලද වස්ත්‍ර පූජාවකුත් හැර, බුදුරජාණන් වහන්සේ ධර්මදේශනා කළ සතළිස් පස් අවුරුද්ද මුළුල්ලෙහි ධර්මදේශනාවන්ට පසු කරන ලද පූජාවන් ගැන දැනගැනීම පහසු නොවේ. අද දින මේ පූජාව ධර්ම දේශනාවේ අංගයක් වශයෙන්ම පවත්නා බැව් රහසක් ද? බණක් කියවීමට යම්කිසිවකු සූදානම් වනවිට, ඔහු විසින් ප්‍රථම අංකයෙහිලා ගණිනු ලබන දෙයක්නම් මේ පූජාවයි. එයද, ඒ ඒ නීතිඥයන්ගේ දක්ෂකමේ, කීර්තියේ හැටියට ගාස්තුව ගෙවන්නාක් මෙන්, ඒ ඒ ධර්මකථිකයාගේ කීර්තියේ හැටියට පිළියෙළ කරනු ලැබේ. "හා! ඒ ඔය හාමුදුරුවන්ට ඔයතරමේ පුළු පූජාවක් ගැළපෙන්නේ නැහැ"යි නොඑක් තැන්වල කියනවා අසන්නට ලැබේ. මේ පූජාවේ විපත නිසා, සාමාන්‍ය මිනිසකුට ප්‍රධාන පංතියේ ස්ථවිරයන් වහන්සේ නමක් ලවා ධර්මදේශනාවක් කරවා ගන්නට අවකාශ නැතිවී තිබේ. ධර්ම දේශනා කරන භික්ෂූන් වහන්සේ තුළද මේ පූජාව ගැන අදහසක් නැද්ද යනු සැක සහිතයි. බණෙන් පසු පූජා පිළිගන්නා ඒ කාලයේ, මා තුළ නම්, ඒගැන එක්තරා බලාපොරොත්තුවක් තිබුණු බැව් අවංකව කියමි. ඒ

නිසා ධර්මදේශනාවකදී ඇතිවිය යුතු තිසරණධ්‍යානයද කිලුටුවූ බැව් මම දනිමි. මා තුළ පැවැති මේ 'පාපය' පසු කලෙක මට වැටහීමත් මේ දහම් 'පූජාවන්' ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධාන හේතුවකි.

මේ පූජාව පිළිගැනීම නිසා ධර්මදේශනාවක වටිනාකම බොහෝ දුරට මැකී යයි. "හාමුදුරුවන්ගේ තත්ත්වයට සැහෙන පූජාවක් කළාය"යි දායකයෝ සිතති. හාමුදුරුවෝද "මට මේ ඇතැ"යි සතුටු වෙති. ධර්මයේ කියැවුණු කරුණු පිළිපැදීම ගැන දෙපක්ෂයේම කථාවක් නැත. මේ පූජාව නුවුවමනා බවත්, මෙබඳු පිරිකරකින් ධර්මය පිදිය නොහැකි බවත්, තමාට කරන එකම ගෞරවය මේ බණ පිළිපැදීම බවත් කීමට දේශකයාට ආත්ම ශක්තිය තිබිය යුතුයි. දැනට නම් දෙපක්ෂයම පිරිකරට රැවැටී එයින් නවතිත්.

ගතවූ වර්ෂයේ සිංහල අවුරුදු දිනයෙහිදී මා හිතවත් ස්වාමීන්වහන්සේ නමක් එක්තරා ස්ථානයක ධර්මදේශනාවක් කෙළේය. බණෙන් පසු උන්වහන්සේට වටිනා ලොකු ඔරලෝසුවක් පූජා කරන ලදී. "අලුත් අවුරුද්දේ පටන්ගැනීමට ඒ හාමුදුරුවන්ගේ හිත සතුටුවන්ට සැහෙන පූජාවක් අපි කළා"යි ඒ ස්ථානයේ කෙනෙක් මා සමග කීහ. හරියටම, වෙළෙඳෙකු අලුත් අවුරුද්දේ සිය වෙළෙඳාමෙන් හොඳ ලාභයක් ලබන්නාක් මෙන්, ඒ දේශකයන් වහන්සේද සිය වෙළෙඳාමෙන් සතුටුදායක ලාභයක් ලත් බැව් ඒ කථාකළ අයගේ අදහස ලෙස මටනම් වැටහේ.

ඒ ස්වාමීන් වහන්සේටම දායකයෙක් බණක් ආරාධනාකොට පූජා වශයෙන් කුමක් වුවමනාදැයි ඇසීය. තමන් ළඟ කුඩයෙක් නැති බැව් උන්වහන්සේ කීහ. බණෙන් පසු කුඩය ලැබුණේය. "මේ බණ නොකීවා නම්, මට මේ කුඩය නො ලැබේ. හරියටම වැඩක් කොට කුලිය ගත්තා වාගේ"යි උන්වහන්සේම පසු දිනක මා සමග කීහ.

එක්තරා ස්ථවිරයන් වහන්සේ නමකට තමා බණකට ආරාධනා කළ බවත්, උන්වහන්සේ ආරාධනාව භාරගෙන "බණ පිරිකර වශයෙන් යමක් පූජා කරනවා නම්, එය මුදලින් ලැබෙන්ට සැලැසුවොත් ඊට වඩා ප්‍රයෝජනවත් වේය"යි කී බවත්, ඒ ආරාධනාව කළ අයම මා සමග කීය. දැන් බණකීම එක්තරා රාක්ෂාවක් වී තිබේ. ඇතැම් ධර්මකථිකයන් ධර්මදේශනාකොට ලැබූ පිරිකර විකුණා පොහොසත්වී ඉඩම් මිලයට ගෙන තිබෙන බැව්ද ප්‍රකට රහස්‍ය.

මෙබඳු සිද්ධීන් තවත් දැක්වියහැක. බණ පිරිකරේ තත්ත්වය මෙසේ හෙයින්, අද ධර්මදේශනාව අතිශයින්ම කිළුටුවී තිබේ. මෙතරම් ධර්මදේශනා පවත්වද්දීත් රටේ අපරාධවල අඩුවක් නොවීමට මෙයද එක් හේතුවකි. සම්මාදම මෙන්ම, මේ පිරිකරද ධර්මදේශනාවට බලවත් හින්දාවක්වී තිබේ.

බණෙන් පසු කරන මේ පූජාව නතර වුවහොත්, පූජාව ගැන බලාපොරොත්තුවෙන් බණ කියන්නන්, තමන්ට ප්‍රයෝජන නැති බැවින්, බණ කීම නතර කරනවා ඇත. එයම රටට විශාල ශුභ සිද්ධියකි. එවිට, නිඃශරණධ්‍යාශයෙන් කටයුතු කරන උතුම් අදහස් ඇති ස්වල්ප දෙනෙකුත් පමණක් බණ කියනවා ඇත. එය හොඳටම ප්‍රමාණවත්ය.

මේ ආදි කරුණු රාශියක් සලකා බලා බණට පසු කරන මේ පූජාව නො ඉවසීමට මා තීරණය කර ගත් බැව් දන්වනු කැමැත්තෙමි.

**කියවන්නාඃ** එසේ නම් ශ්‍රද්ධාවතෙක් භික්ෂූන්වහන්සේ නමකට පිරිකරක් පූජා කරන්නේ කෙසේද?

**කර්තෘඃ** පිරිකරක් පූජා කිරීමට ධර්මාසනය හැර තවත් තැන් බොහෝ ය. පන්සලට අවුත් පිරිකරක් පූජා කළ හැක. භික්ෂුව ගෙදරට වැඩමවාගෙන ගොස් පූජාවක් කළහැක. මගදී පූජාවක් කළ හැක. බණ කියා ඉවර වූ වේලාව හැර, පිරකරක් පූජා කිරීමට තවත් සුදුසු වේලාවල් බොහෝ ය. බණට පසු පිරිකර පිළිගැනීම නුසුදුසුය කීමෙන්, හැම විට ම නුසුදුසුයි වරදවා තේරුම් නො ගත යුතුයි.

# 3

# ත්‍රිවිධ රත්නයට කරන අපහාස

අප රටෙහි දිනපතා සහ සතිපතා පවත්වන ධර්මදේශනාත් පින්කමුත් සිය දහස් ගණනක් වුවත්, හැම ගමක් පාසාම වාගේ පන්සලක් ඇතත්, අනුශාසක භික්ෂුපක්ෂය තිස්දහසකට අධික වුවත්, චරිත ශුද්ධිය අතින් නම් සැලකිය යුතු කිසිත් දියුණුවක් ඇති බැව් නො පෙනේ: යළි, අපේ මේ "ධර්මද්වීපය" අපරාධ අතින් ජනානුපාතය අනුව නම් ලෝකයේ තුන්වැනි හතරවැනි තත්ත්වයට වැටී තිබේ. මෙහි රහස කුමක්ද? මෙයට හේතුව කුමක්ද?

මෙහි වරද එක පක්ෂයකට පමණක් පැවැරීම සුදුසු නොවේ. ගිහි පැවිදි දෙපක්ෂයම එකතුවී ආගමික කටයුතු පිළිවෙළ කණපිට පෙරළාගෙන ක්‍රියා කරති. ධර්මය බුදුරජාණන් වහන්සේ අදහස් කළ දෙය පිණිස නොව, තම තමන්ගේ පුද්ගලික අදහස් පිණිස යොදති. මිනිසුන් දුසිරිතෙන් මුදා, සුසිරිතට යොමුකොට ධර්මය පුරුදු කරවීමේ පරමාර්ථයෙන් පටන් ගැනෙන ධර්ම දේශනාපළවල් කීයක් ඇත්ද? පන්සලක බණ පිළිවෙළක් පටන්ගත් විට, ඒ ගැන ආරංචි අසන මිනිස්සු "ඒ බණ පිළිවෙළේ අදහස මොකදැ?"යි ප්‍රශ්න කරති. මේ ප්‍රශ්නය ඉදිරිපත් වන්නේම අපේ වැඩපිළිවෙළ නොපිට පෙරළාගෙන තිබෙන බැවිනි. බණ පිළිවෙළේ අදහස ගුණධර්මයයි: එය එකම අදහසයි: එහි දෙවෙනි අදහසක් නැත. නමුත් අද ධර්මදේශනාව ප්‍රතිපත්තිය පිණිස නොව වෙන අයුතු දෙය පිණිස යොදන බැවින් යටකී ප්‍රශ්නය පැන නඟියි.

ධර්මදේශනා පංතියක් සම්බන්ධයෙන් මුද්‍රණය කරන ලද සමහර දැන්වීම් පත්‍රයක මුලින් ඒ බණ පිළිවෙළ පටන් ගන්නා ලද්දේ විහාරයක්, පන්සලක්, පොත්ගුලක්, නැත්නම් බෝකොටුවක් හෝ දාගැබක් ගොඩනැගීමට ආධාර ගැනීමේ අදහසින් බැව් සඳහන් වෙයි. මෙය කොතරම් කනගාටුදායක, අන්තරායකර වැරදීමක්ද? බුදුරජාණන් වහන්සේගේ ජීවිතය වැනි ප්‍රතිපත්තිය පිණිසම සොයන ලද ධර්මය, උන්වහන්සේගේ පයේ දූවිලි වැනි ආමිසය පිණිස යෙදීම කොතරම් ඛේදජනකද? බණ ඇසීමටය කියා එබඳු තැනකට එන්නවුන්ගේ ගුණධර්මය ගැන කිසිත් බලාපොරොත්තුවක් නැත. මේ සම්මාදම ගැනීමට, මුදල් සැපයීමට බණකීම උපායක් කරගෙන තිබෙන බැවින්, ධර්මදේශනාවයයි නම් කරන ලද ඒ ව්‍යාජක්‍රියාව කෙළවර වන තුරු කාලය ගෙවා, දේශනාව අතරේදී නැතහොත් අන්තයේදී සම්මාදම් දී මිනිස්සු ආපසු එති. මෙහි තවත් අශෝභන දර්ශනයක් නම් භික්ෂූන් වහන්සේ ධර්මදේශනාව කෙළවර කොට මිනිසුන්ගෙන් සම්මාදම් ගන්නා තුරු සහ අද "ධර්ම පූජාව"යි වරදවා නම්කරන ලද කුලිය ගෙවන තුරුත් වාඩිවී බලා හිඳීමයි.

සම්මාදම් ගැනීමටය කියා මිනිසුන් ගෙන්විය නොහැකි බැවින් බුදුරජාණන් වහන්සේගේ නෛර්යාණික ධර්මය ඒ පිණිස දඩමීමා කර ගනිති. අහෝ! කොතරම් සංවේග ජනකද? මෙහිදී ප්‍රශ්නයක් පැන නගී: මේ මුදල් සැපයීමත් ශාසනයේ දියුණුව පිණිසම නොවේද? යනුයි. ශාසනය නම් විහාර පන්සල් නොව සුචරිතයයි, ප්‍රතිපත්තියයි. ප්‍රතිපත්තිය මුදලට ගත නොහැක. බොහෝ අය ශාසනය වරදවා තේරුම්ගෙන සිටිති. අනුරාධපුරයේ මහා විහාරය වැනි විහාර දහසකටවත්, රුවන්වැලි මහ දාගැබ වැනි ශ්‍රේෂ්ඨ දාගැබ් දහසකටවත් බුද්ධ ශාසනය එක මොහොතක් රැකගත නොහැක. දඹදිව තිබුණු දහස් ගණන් විශාල ගොඩනැගිලි ශාසනය රැකගැන්මෙහි පොහොසත් වූවෝද? ශාසනය හුණු බදාම ගොඩවල් වැනි නොවටිනා දෙයක් නොවේ. ශාසනය නම් ශීලයයි, සමාධියයි, ප්‍රඥාවයි. සම්මාදම් කරගත් මුදලින් මේවා

ගතහැකිද? විහාර පන්සල් කොපමණ තිබුණත්, ඒ හේතුවෙන් ශාසනයේ දියුණුවක් නැත. එකම විහාරයක් හෝ පන්සලක් නැතත්, යම් දිනක මනුෂ්‍යයා තුළ ගුණධර්මයෝ වෙත්නම්, එදා ශාසනය ජීවමානව පවතියි.

මේ කීම නිසා විහාර පන්සල් සම්පූර්ණයෙන්ම නුවුවමනායයි වරදවා තේරුම් නොගතයුතුයි. එයින් එක්තරා ප්‍රමාණයක ප්‍රයෝජනයක් තිබේ. එය සීමාව ඉක්මවා ශ්‍රේෂ්ඨ දෙයක් හැටියට වටහා නොගතයුතුයි. කොයි විදියකින් නමුත් අපට විහාර පන්සල් වුවමනා නම්, ඒ සුළු අදහස ගැන අප විසින් බුදුරජාණන් වහන්සේගේ නෛර්යාණික ධර්මය කිලුටු කළයුතු නොවේ. ධර්මයට කිලුටක් නොවන පරිදි අප විසින් ඒවා පිළියෙළකර ගතයුතුයි. සුළු දෙයක් වෙනුවෙන් උසස්, උතුම් දෙයක් කිලුටු කිරීම බරපතළ අඥාන කමකි. එක්තරා බේබද්දෙක් මීයන් ඇල්වීමට තැනූ උගුලේ කෙළවරක බරට ලෝහ පිළිමයක් තබා මීයකු ඇල්වීය. ඔහුගේ හීන අදහස ඉටුවූ බැව් නම් ඇත්තකි. නමුත් එය හරිද? අපේ වැඩ පිළිවෙළ බොහෝ කරුණුවලින් මීට සමානය. සල්පිලක බඩු විකුණා ගැනීමට හෝ ගොඩනැගිල්ලකට ගඩොල් ගැනීමට නැතහොත් පන්සලේ හුණුගෑමට වුවමනා වූවිට බුදුරජාණන් වහන්සේගේ ධර්මය එයට උපායක් කර ගනිති. ඔවුන්ගේ බලාපොරොත්තුවද හරියයි. නමුත් ඔවුන්ට වරදින තැන ඔවුහුම නොදනිති.

බොහෝ තැන්වල බණ අසන අතරේ දී කැරෙන සම්මාදම ගැන සිතා බලනු. මිනිසුන් මහත් ශ්‍රද්ධාවෙන්, සිත එකඟකොට බණ අසනවිට, එක්කෙනෙක් හෝ කීපදෙනෙක් සම්මාදම් වට්ටිත් රැගෙන බිම වාඩිවී හිඳින මිනිසුන් පාගමින්, කලබල කරමින්, මිනිසුන් අතර අවතාර මෙන් හැසිරෙන්නට පටන් ගනිති. මුළු පිරිසම කලබලවේ. දේශකයන් වහන්සේගේ දේශනා විලාසයද චලනයවේ. බුදුරජාණන්වහන්සේ අනන්ත කාලයක් මහත් කරුණාවෙන් දුක්විඳ අපට නිවන් දීමේ පරමාර්ථයෙන්ම දේශනා කළ උතුම් ධර්මයට වඩා සතයක් උතුම්වූ හැටි!

බුදුරජාණන් වහන්සේගේ ධර්මය මුදල් සැපයීමේ මාර්ගයක් කරගැනීම භයානක පාපයකි. බණ කියන අතරේදී ධර්මය නො සලකා සම්මාදම් කිරීම බුදුරජාණන් වහන්සේගේ වචනයට පයින් ගැසීමකි. එනිසා බණ අසන අතරේදී ගෙනෙන සම්මාදම් වට්ටියට ශ්‍රද්ධාවත් කිසිවකු විසින් ඇහුම්කන් නොදිය යුතුයි. බණට නො සලකා සම්මාදම් වට්ටියට සැලකීම ධර්මයට කරන අපහාසයකි.

දැනට පවත්නා වැඩ පිළිවෙළ නිසා දුප්පත් ශ්‍රද්ධාවතකුට බණ අසන්ට යාම අපහසු වැඩකි. "අනේ සල්ලි නැතිව අද බණ අහන්ටවත් යන්ට බැරිය"යි කියනවා නොඑක් විට අසන්නට ලැබේ. අපේ වැඩපිළිවෙළ නිසා සිදුවී තිබෙන දෙය මදිද?

අද අපේ සිද්ධස්ථාන නාඩගම්පලවල් වැනිය. සිද්ධස්ථානයක පැවැතිය යුතු විවේකය ශාන්තගතිය හෝ තැන්පත්කම ඒ තැන්වල නැත. මුදල් සම්මාදම් කරගැනීමට ලැබෙතොත් කොතරම් නොහොබනා විහිළුවක් වුවත් කම් නැත. දැන් "පින්කම්" යන්නෙන් අදහස් කරනු ලබන්නේ මුදලයි. ගතවූ දිනයට වඩා අද රුපියල් දහයක් වැඩිපුර ලැබිණි, නම් "එදාට වඩා අද පින්කම වාසිය" යි කියති. මෙහිදී පින්කමයයි අදහස් කරනු ලබන්නේ මුදල් මිස අනෙකක් නොවේ. විහාර මලුවක බෙරගසමින් නැටීම හෝ පිනුම් ගැසීම මොන තරම් විහිළුවක්ද? ඇතැම් විහාරවල මේ විහිළු කරන්නෝ මත්පැන් බීගත් මිනිස්සුය. කුඩා ළමයන් ලවා බණ ආරාධනා වශයෙන් චූර්ණිකාවක් කීම මොන තරම් විහිළුවක්දැ යි සිතා බලනු මැනැවි. මල්වට්ටි වෙන්දේසිය තවත් අශෝභන ක්‍රියාවකි. මේ විහිළු කරන, විහාර පන්සල්වලට නොයන්නට බෞද්ධයන් සිතට ගත යුතුයි.

විහාරයක් දෙස බලනු: එහි සෑම තැනම තථාගතයන් වහන්සේට අපහාස වන පරිදි මුදල් පැහැර ගැනීමට යොදා තිබෙන උගුල්ය. බද්ධපර්යංකයෙන් වැඩහිඳින පිළිමය ඉදිරියේ 'පින් පෙට්ටිය' යි වරදවා නම් කරන ලද පෙට්ටියක් තිබේ. හරියටම

බුදුරජාණන් වහන්සේ මුදල් සම්මාදම් කරන්නට හැඩ ගැහී වාඩිවී හුන්නෙකැයි අලුතෙන් අවුත් බලන්නකුට වැටහේ. තවත් තැනක, මුදල් දැමීමට තර්ජනය කරන්නාක් මෙන් අතක්ද ඔසවා ගත් සිටිපිළිමයක් ඉදිරියේ පෙට්ටියකි. සමහර විහාරයක පෙට්ටි හතරක් පහකටත් වැඩිය. කොතරම් නින්දාවක්ද? මේ සියල්ල උන්වහන්සේගේ ශ්‍රාවකයන් විසින් තම තමන්ගේ පුද්ගලික බලාපොරොත්තු නිසා ධර්මය කණපිට පෙරළා ගෙන ත්‍රිවිධ රත්නයට කරනු ලබන නින්දාය! සම්මාදම් වුවමනා නම්, විහාරයට කොහෙත් සම්බන්ධ නැති ලෙස, වෙනම තැනක වෙනම කාමරයක පෙට්ටියක් තැබිය යුතුයි. සම්මාදම් කොහෙත්ම වුවමනා නැතැයි කියිවිටෙක නොසිතිය යුතුයි. සිද්ධස්ථානයන්හි කටයුතුවලට මුදල් වුවමනාය. නමුත් ඒ මුදල් සැපයීම බුදුරජාණන් වහන්සේට නින්දා නොවන ලෙස, ධර්මය කිලුටු නොවන ලෙස කළයුතුයි. බණ අසන්ටයයි රවටා මිනිසුන් ගෙන්වා ගෙන ප්‍රයෝගයෙන් මුදල් සැපයීම පාපයකි. මුදල් සැපයීමට වෙන නොඑක් මාර්ගයෝ වෙති: බණ කීම්වලට කලවම් නොකොට ඒ වෙනුවෙන් යොදා ගත් විශේෂ දිනක, විශේෂ තැනකදී සල්පිල් පැවැත්විය යුතුයි. සම්මාදම් පත්‍ර ගසා විකිණිය යුතුයි. සමාගම් ඇති කොට සාමාජික මුදල් අය කළ යුතුයි. ධර්මය නොවිකුණා ශාසනය නොකෙලෙසා, ඕනෑ කෙනෙකුන්ට විහාර පන්සල් ගොඩනැගීමට මුදල් සෙවියහැකි පාරවල් බොහෝය. සිද්ධස්ථානයකට ඇතුළුවූ පසු සතයක් ගැනවත් සිතන්නට අවකාශ නොතැබීම ආගමේ වටිනාකම, පවිත්‍රකම රැකීමකි. විහාරය තුළ තිබෙන පෙට්ටිවලට මුදල් නොදැමීමට මතක තබාගත යුතුයි.

ගිහි පැවිදි දෙපක්ෂයම එකතුවී, තථාගතයන් වහන්සේගේ නෛර්යාණික ධර්මය වෙළෙඳාමක්, මුදල් සැපයීමේ මාර්ගයක් කරගෙන සිටිති. ඇතුළත ගුණධර්මයක් ගැන බලාපොරොත්තුවෙන් බණ කීමක් හෝ ඇසීමක් නැත. ධර්මය කණපිට පෙරළා ගෙන ක්‍රියා කෙරෙති. අද ගිහි පැවිදි දෙපක්ෂයම සාමාන්‍යයෙන් බෞද්ධ

ප්‍රතිපත්තියෙහි නොව සීලබ්බත පරමාසයෙහි යෙදී සිටිති. සත්වයන් සංසාරයට බැඳ තබන දස සංයෝජනයන්ගේ තුන්වැන්න සීලබ්බත පරමාසයයි. එනම් වැඳුම් පිදුම්, පින්කම්, උත්සව, පෙරහර, බෝධිපූජා වැනි බාහිර පුදසිරිත්, වත්පිළිවෙත් ආදිය උසස් ලෙස, අවශ්‍ය ලෙස, අගය කොට සලකා එහි ඇලී ගැලී සිටීමයි. මෙය නුගත්, අන්ධබාල පෘථග්ජනයාට ස්වාභාවික දෙයකි. දැනට බෞද්ධ යන නමින් කරන වැඩවලින් සියයට අනූවකටත් වඩා සීලබ්බත පරමාසයයි. අද මේ කරන වැඩ පිළිවෙළින් බෞද්ධයන්ට කිසිත් සහනයක් නොලැබියහැකි බැව් නුවණින් බලන්නකුට නම් හොඳහැටි පෙනෙයි.

මේ කරුණු ගැන නුවණින් සිතා බැලිය යුතුයි. කල්පනා කළ යුතුයි. මුලින් කැරුණු නමුත් , දිගටම වැරදි කර ගෙන යෑම තද මෝඩකමකි. අද මේ කරන අශාසනික, අධාර්මික, සත්‍යාවබෝධයට බාධකවූ, හීනවූ, අනාර්යවූ වැඩ පිළිවෙළ නැතිකර දමන්නට ගිහි පැවිදි දෙපක්ෂයම වහා ක්‍රියා කළ යුතුයි.

# 4

# භික්ෂූන්ගේ කුලභේදය

කුලභේදයට බුද්ධශාසනයෙහි කිසිත් අවසරයක් නැති බැව් ඉර හඳ මෙන් ප්‍රකට සත්‍යයකි.නොගිණිය හැකි තරම් දීර්ඝකාලයක පටන් දඹදිව බලපැවැත්වූ කුලභේදය බුදුරජාණන් වහන්සේ පයට පෑගෙන දූවිලි තරම්වත් නොසැලකූ සේක. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර සියල්ලන් මහණ කොට, කිසිත් වෙනසක් නැතිව එකට ජීවත් වන්නට, එකට කෑම්, පීම්, ඉඳුම්, හිටුම් කරන්නට සැලස්වූසේක. රජගහ නුවර සුනීත නම් චණ්ඩාලයා (රොඩියා, පංචමයා) වැසිකිළි සහ කැලිකසළ ශුද්ධකරන්නෙක් විය. පිඬු සිඟා වඩින බුදුරජාණන් වහන්සේට දිනක් ඔහු මුණ ගැසුණේය. උන්වහන්සේ මේ අතිශයින්ම පහත්යයි සම්මත චණ්ඩාලයා විහාරයට කැඳවාගෙන ගොස් මහණ කළසේක. බුද්ධශාසනයෙහි විනය ධරයන්ගෙන් අග්‍රස්ථානයෙහි සිටි උපාලි ස්ථවිරයන් වහන්සේ කෙස් රැවුල් කපන පනික්කියෙක් විය. සර්වඥ ශාසනය පිහිටා තිබෙන බලසම්පන්න ස්තම්භයන් ගෙන් එකක් නම් ජාතිභේදය හෝ කුලභේදය නැතිකමයි. ඉඩලැබුණු හැම අවස්ථාවකම ශාස්තෘන් වහන්සේ කුලභේදයට විරුද්ධව සටන් කළසේක. උන්වහන්සේගේ ජීවිතයෙන් විශාල කොටසක් මේ වෙනුවෙන් ගතකරනලදී. කුලභේදයට විරුද්ධව පවත්වන ලද දේශනාවෝ ත්‍රිපිටකයෙහි හැම තැනම පාහේ දක්නා ලැබෙත්.

නමුත් ඒ ශාස්තෘන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා හැටියට අද ලක්දිව පෙනී සිටින භික්ෂූන් අතර කුලභේදය, ගිහීන් අතර මෙන්ම, නැතහොත් ඊටත් වඩා බලසම්පන්නව ක්‍රියාකරන බැව් කියන්නට වීම සැබැවින්ම ඉතා කනගාටුදායක සිද්ධියකි. සියම්, අමරපුර,

රාමඤ්ඤ යන තුන් නිකායේම කුලභේදය පවත්නා වග අලුතෙන් සොයා ගන්නා ලද්දක් නොවේ. අමරපුර රාමඤ්ඤ දෙනිකායෙහි චාරිත්‍රයක් හැටියට කුලභේදය නැතත්, බොහෝ තැන්වල පන්සලක් පාසා කුලභේදය පවත්නා බැව් නොරහසකි. කොළඹ නගරයේ අමරපුර නිකායට අයත් හැම පන්සලක්ම පාහේ විශේෂයෙන් යම්කිසි කුලයක භික්ෂූන් වෙනුවෙන් ඒ කුලයට අයත් දායකයන් විසින්ම ගොඩ නගන ලද්දකි. මෙය බොහෝ දෙන දන්නා සත්‍යයකි. එක එක කුලයට එක එක පන්සල බැගින් පැන නැගීමේ භයානක සිරිත හැම පළාත්වලම පැතිරී යනු දැක්ම මහත් කනගාටුවකි. අමරපුර, රාමඤ්ඤ දෙනිකායෙහි මහණ උපසම්පදා කිරීමේදී චාරිත්‍රයක් හැටියට ප්‍රසිද්ධව කුලභේදය නොපැවැත්වුවද, අභ්‍යන්තරිකව නම් එහිද කුලභේදය නොඅඩුවම ක්‍රියා කරයි.

මෙහිදී මට විශේෂයෙන් වුවමනා කරන්නේ, උන්වහන්සේලාගේ අවසරය පිට, සියම් නිකායේ ශාසනික චාරිත්‍රයක් හැටියට පවත්වන කුලභේදය සම්බන්ධයෙන් කථාකිරීමයි. ගොයිගම කුලයට අයත් නොවූ, ඊට වඩා පහත්යයි අයුතු ලෙස සිතන කිසිම කුලයක අයට මහණ-උපසම්පදාව නොදීම සියම් නිකායේ පරම්පරාගත ශාසනික චාරිත්‍රයක් හැටියට පවත්වනු ලැබේ. කිසිකලක ලොකයේ කුලභේදය සහමුලින් නැති කළ හැකැයි මම නොසිතමි. නමුත් බුදුරජාණන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ ශාස්තෘවරයකුගේ ශාසනයෙහි චාරිත්‍රයක් හැටියට කුලභේදය පැවැත්වීම සැබැවින්ම ඉවසිය නොහෙන බරපතල පාපයකි.

මේ සිරිත බුද්ධශාසනයට කරන බලවත් අපහසයකි, බුදුරජාණන් වහන්සේගේ ධර්මයට පයින් ගැසීමකි. සියම් නිකායේ මහ තෙරුන් වහන්සේලා ශාසන ශ්‍රී භාරධාරීන් හැටියට අහංකාරව කථා කරති. නමුත් ඇත්තවශයෙන් උන්වහන්සේලා මේ අශාසනික, අවාසනාවන්ත චාරිත්‍රය පැවැත්වීම නිසා බුද්ධ ශාසනය නමැති ගොඩනැගිල්ලේ විශාල කොටසක් සහමුලින් බිඳහෙළන බැව් මම යටහත්ව, අවංකව කියමි. උන්වහන්සේලා බුද්ධ ශාසනය නැති කරමින් එය

රකින්නන් හැටියට පෙනීසිටින බැව් ප්‍රසිද්ධියේ කියන්නටවීම මගේ සිතට ලොකු වේදනාවකි. මට කථාවක් සිහි වෙයි: එක්තරා කථිකයෙක් චීනය පිළිබඳ විස්තරයක් කරමින්, චීන රටේ මිනිසුන් ඉතා දුකසේ ජීවත්වන බවත්, සමහර විට ඇතැම් දුප්පත් මිනිසුන් ජීවත්වීම පිණිස පොහොසතුන්ගේ වුවමනාවලට මැරෙන බවත් කීයේය. ජීවත්වීම පිණිස මැරෙනවාය කීම හොඳ හිනාවකි. එසේම සියම් නිකායේ භික්ෂූන්වහන්සේලාද ශාසනයට අතිශයින් විරුද්ධවූ කුලභේදයක් ඉදිරිපත් කොට ක්‍රියා කරමින්, එයින්ම ශාසනයේ බලවත් පදනමක් බිඳ හෙළා දමා, "අපි ශාසනය රකිමුය"යි නුවණැතියන් සිනාස්සමින් ප්‍රකාශ කරති. උන්වහන්සේලා ශාසනය නොව ගොයිගම කුලය රකින බවත්, ගොයිගම කුලයෙන් පිට අයට මහණ-උපසම්පදාව නොදීමේ ක්‍රියාවෙන්ම උන්වහන්සේලා ශාසනය කඩකරන බවත්, ශාසනය නැති කරන බවත් මම උන්වහන්සේලාට ඉතා යටහත්ව දැනුම් දෙමි.

මෙය සිංහල රජකු විසින් නියම කරන ලද්දක් බවත්, පරම්පරාගතව පැවත ගෙන එන සිරිතක් බවත් උන්වහන්සේලා කියති. නමුත් අප ගරු කරන්නේ රාජාඥාවටද? බුද්ධාඥාවටද? බුද්ධධර්මය පාගා දමා, මානමදයෙන් මත්ව මුළාවූ පෘථග්ජන රජකුගේ වචනයක් ගරුකිරීම, ඇදහීම උන්වහන්සේලාට මොන තරම් නින්දාවක්ද? පෙර සිට පැවත එන බැව් කියා යම්කිසි වැරැදි සිරිතක් නොකඩවා පැවැත්වීම තීර්ථක ධර්මයකි. කාලාශෝක රජු දවස තීර්ථකයන් විසින් බුද්ධශාසනයට එක් කරන ලද දශ වස්තූන්ගෙන් එකක් නම් "කප්පති ආචිණ්ණ කප්පෝ" යන්නයි. එනම් "පරම්පරාවේ පැවතඑන කොයි සිරිතක් නමුත් කැපය" යනුයි. මේ කුලභේදය පැවැත්වීමේ සිරිත බුදුරජාණන් වහන්සේගේ ධර්මයට, විනයට හැම අතින්ම විරුද්ධ බැව් සියම් නිකායික උගත් භික්ෂූන්වහන්සේලා හොඳින්ම දනිති. එසේ දැන දැනත් පරම්පරාවේ පැවත ආ බැවින් එය කඩ කිරීමට භය වෙතොත්, එහිදී උන්වහන්සේලා තීර්ථක ධර්මයක් පිළිපදින බැව් කියන්නට වීම ගැන මම උන්වහන්සේලාගෙන් සමාව අයදිමි.

කුලපුත්‍රයා මහණ කළ යුතු බැව් උන්වහන්සේලා කියති. ජාති කුලපුත්‍රය, ආචාර කුලපුත්‍රයයි කුලපුත්‍රයා දෙවැදෑරුම් වෙයි. ලෝකයෙහි උසස්යයි සම්මත කුලයක උපන් තැනැත්තේ ජාති කුලපුත්‍රයි. උපන් කුලය කුමක් වුවත් යහපත් හැදීමෙන් හා හැසිරීමෙන් යුත් තැනැත්තේ ආචාර කුලපුත්‍රයි. උත්තපත්තියෙන් උසස් කුලයක වුවද, හැදීමෙන් පහත් නම්, හෙතෙමේ මහණ කමට සුදුසු නොවෙයි. උත්පත්තියෙන් පහත් කුලයක වුවද හැදීමෙන් උසස් නම්, හෙතෙමේ සුදුසු වෙයි. මෙසේ බලනවිට ශාසනික පැවිද්ද සම්බන්ධයෙන් චරිතය මිස, කිසිසේත් උපන් කුලය ගැන කතාවක් ඉදිරිපත් නොවෙයි.

ස්‍යාමනිකායික භික්ෂූන් වහන්සේලා මේ කුලභේදය පවත්වන අන්දම සිතාවට කරුණකි. උන්වහන්සේලා ගොයිගම නොවූවන් පැවිදි උපසපන් නොකරති. නමුත් පහත්යයි සිතන ඒ මිනිසුන්ගෙන් කෑම්, බීම්, ඉඳුම්, හිටුම් ආදි සංග්‍රහ ලබන්නටත්, ඔවුන් විසින් ගොඩනගන ලද පන්සල්වල සැපසේ ජීවත් වන්නටත්, ඔවුන්ගේ රථවාහනවල ගමන් කරන්නටත්, ඔවුන්ගෙන් තවත් නොඑක් දේ ලබන්නටත් කිසිත් ලජ්ජාවක් නැතිව සතුටු වෙති. පහත්යයි සම්මත උසස් ගෙදරක වැඩකාරකමට සිටින ගොයිගම ළමයා උන්වහන්සේලා පැවිදිකර ගනිතිඃ නමුත් ඒ ගෙදරම ස්වාමියාගේ ළමයා පැවිදි කිරීම නොහිසි වැඩක් හැටියට පැහැර හරිති.

කුලභේදය සිංහලයන්ගේ දියුණුවට බලවත් බාධාවක්වී තිබේ. සිංහලයන් අතර කුලභේදය තහවුරු කරන්නන් භික්ෂූන් වහන්සේලා බැව් හොඳින් සිතා බලන්නකුට නම් රහසක් නොවේ. අනෙක් කුලවල අය සියම් නිකායේ මහණ නොකිරීම නිසා ලක්දිව කුලභේදය දරුණු වෙයි. ලක්දිව කුලභේදය තුනී කොට මහජනයා අතර සමගිය හා සමාදානය පිහිටුවීමේ ශ්‍රේෂ්ඨභාරය සම්පූර්ණයෙන් ම වාගේ සියම් නිකායේ මහ තෙරුන්වහන්සේලා පිට රඳා පවත්නා බැව් සලකත්වා!

ලෝකයේ උගත්, ශීලාචාර, උසස්, මිනිස්සු සියම් නිකායේ කුලභේදය ගැන අසා අප සිටින පහත් තත්ත්වය ගැන අනුකම්පා කරති. සියම් නිකායේ මේ සිරිත ශීලාචාර මිනිසුන් අතරට පිළිකුලකි, නින්දාවකි. මේ ප්‍රශ්නය ගැන තවදුරටත් සිතා බලන විට, සියම් නිකාය මේ කාරණය සම්බන්ධයෙන් බෞද්ධ නාමයෙන් බොහෝ ඈත්ව සිටින බැව් කියන්නටවීම සැබැවින්ම කනගාටුවකි. සියම් නිකායේ කුලභේදය නැති භික්ෂූන් වහන්සේලා බොහෝ සිටින බැව් මෙහිදී අමතක කළයුතු නොවේ. උන්වහන්සේලාට අපගේ නමස්කාරය හිමිය.

සියම් නිකායේ මේ අවාසනාවන්ත සිරිත මේ තාක් පවත්වා ගෙන ආ නමුත්, අනාගතයේදී එය කඩ කරන්නට සිදුවන බැව් තරයේම විශ්වාස කරමි.

සියම් නිකායේ මේ කුලභේදය පවත්නා තුරු අනෙක් කුලයන්හි මිනිසුන්ට හිතවත්ව ඒ නිකාය ආශ්‍රය කළ නොහැක. මේ පාපයෙන් තුරන් වන තුරු සිංහලයන් අතර අවංක, ස්ථිර සමගියක් බලාපොරොත්තුවීම උගහටයි. අනාර්යවූ, අශාසනිකවූ මේ භයානක පාපය මුලිනුපුටා දමන්නට ශාසනාභිවෘද්ධිකාමී, ශ්‍රද්ධාවත්, සත්පුරුෂ ගිහි පැවිදි උතුමන් වහ වහා ඉදිරිපත්වී ක්‍රියා කළ යුතුයි.

# 5
# පින්කම් හා ප්‍රාර්ථනා

කියවන්නා: තමාට පින් බලාපොරොත්තුවෙන් යමක් කිරීම සම්පූර්ණ පිරිසුදු අදහසක් නොවන බවත්, ප්‍රාර්ථනා කිරීම, අන්තිම වශයෙන් නිවන් ප්‍රාර්ථනා කිරීම පවා බෞද්ධ අදහසක් නොවන බවත් ඔබ කියන්නෙහිය. මෙය මට තේරුම් ගත නොහැක. කරුණාකර ඔබගේ අදහස පහදා දෙන්නෙහිද?

කර්තෘ: ඔව්: මම එය තෝරා දෙන්නට වෑයම් කරමි. නමුත් එය වචනයකින් දෙකකින් කළ හැක්කක් නොවේ. සත්‍යය සෙවීමේ අභිලාෂයෙන්, කිසිත් බැඳීමක් නැතිව, නිදහස්ව සාකච්ඡා කිරීමෙන් පසු නුවණින් සිතා බැලූ විට එය වැටහෙනවා ඇත. පොතපතින් හෝ ගුරුමුඛයෙන් උගත් දේ පමණක් සත්‍යයයි සිතා ගෙන කලින්ම සත්‍යයට සීමාවක් තබා ගත් පුද්ගලයකුට කවදාවත් සත්‍යය අවබෝධ කළ නො හැක. එනිසා කිසිවකටත් වාල් නොවී නිදහස්ව සිතන්නට පුරුදු විය යුතුයි.

තමාට පින් බලාපොරොත්තුවෙන් යමක් කිරීම සම්පූර්ණ පිරිසුදු අදහසක් නොවන බවත්, ප්‍රාර්ථනා කිරීම, අන්තිම වශයෙන් නිවන් ප්‍රාර්ථනා කිරීම පවා බෞද්ධ අදහසක් නො වන බවත් මම තෝරා දෙන්නම්. ඒ ගැන අපි මුල පටන්ම කතා කරමු.

මිනිස්සු නොඑක් අන්දමේ වෙළෙඳාම් කරති: හාල් සිල්ලර, ඇඳුම් පැළඳුම් ආහාර පාන වර්ග සහ මහජනයාට වුවමනා වෙනත් නොඑක් දේ ජාති භේද කුලභේදාදි කිසිත් නොසලකා හැම දෙනාටම විකුණති. මේ ක්‍රියාවට "පින්කමය" නො කියන්නේ ඇයි?

කියවන්නා: එය තමන්ට ලාභයක්, ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් කරන වැඩක් නිසයි.

කර්තෘ: හරි: ඒ අදහස කවුරුත් කිසි විරුද්ධයක් නැතිව පිළිගනිති. එසේම යමෙක්, වෙළෙඳාමෙන් වාගේ මුදලින්ම නුවූවත්, අන් අයුරකින් මෙලොවදී ලාභයක්, කීර්තියක්, ප්‍රශංසාවක් බලාපොරොත්තුවෙන් අසරණයකුට උදව්වක් කරන්නේයයි සිතමු. එය පිරිසිදු අදහසක්යයි ඔබ පිළිගන්නෙහිද?

කියවන්නා: සැබවින්ම නැත. එය පිරිසිදු අදහසක් නොවේ. එය තමන්ට මෙලොවදී යමක් බලාපොරොත්තුවෙන් කරන වැඩකි. එයත් වෙළෙඳාමක් සමානයි.

කර්තෘ: හොඳයි: යමෙක් පරලොව සැප බලාපොරොත්තුවෙන් අසරණයකුට උදව්වක් කරන්නේයයි සිතමු. ඒ ගැන ඔබගේ අදහස කුමක්ද?

කියවන්නා : එහි වරදක් මට නම් නොතෙරේ. කවුරුත් වුවත් පින්දහම් කරන්නේ පරලොව පිණිස නොවෙයිද?

කර්තෘ: නමුත් එයද පිරිසුදු අදහසක් නොවේ. මෙලොව වුවත් පරලොව වුවත් ඒ බලාපොරොත්තුව ආත්මාශාවයි. මෙලොවදී බලාපොරොත්තුවීමට වඩා පරලොවදී බලාපොරොත්තු වීමේ ඇති වෙනස නම් ස්වල්පයක් කල්දැමීම පමණකි. ධනවත්තු බැංකුවේ මුදල් තැන්පත් කොට, වර්ෂයක් දෙකක් පසුවී පොලී සමග විශාල මුදලක් ගන්නට බලාපොරොත්තු වෙති. එසේ කරන්නේ බැංකුවට නොව තමාට ආදරය නිසයි. යම්කිසි වැඩක් කොට පරලොවදී තමන්ට සැප බලාපොරොත්තුවීමත් මීට දෙවෙනි නොවේ. "අප මේ වැඩ කරන්නේ මෙලොව යමක් බලාපොරොත්තුවෙන් නොව පරලොව සැප තකාගෙනය" යි පිරිසුදු අදහසක් හැටියට බොහෝ දෙන නොඑක් තැන්වලදී

කියනවා අසන්නට ලැබේ. නමුත් "පරලොව සැප බලාපොරොත්තුවීම" යන්නෙහි තේරුම නම්, ලබන ජීවිතයේදී හොඳින් කෑම් බීම්, ඉඩම් කඩම්, රථ වාහන, ගෙවල් දොරවල්, ඇඳුම් පැළඳුම් යනාදිය ලබන්නට බලාපොරොත්තු වීමයි. මේවා මෙහිදී ලබන්නට බලාපොරොත්තු වුවත් එහිදී ලබන්නට බලාපොරොත්තු වුවත් ඒ දෙකේ සැලකිය යුතු වෙනසක් නැත.

කියවන්නා: එතකොට කර්මඵල ඇදහීමක් නැද්ද?

කර්තෘ: කර්මඵල ඇදහීම නම් සෑම ක්‍රියාවකම ඊට සුදුසු ඵලයක් ඇති බැව් තේරුම් ගැනීමයි. මෙය මෙතරම් උත්තමය, මෙතරම් හීනය: මෙය මෙතරම් අවශ්‍යය, මෙතරම් අනවශ්‍යය: යනාදීන් යම්කිසි ක්‍රියාවක ඇති තතු වටහා ගැනීම කර්මඵල ඇදහීමයි. එය ප්‍රඥාවයි. එය මෙලොව වශයෙන් වුවත් පරලොව වශයෙන් වුවත් කම් නැත. කර්මඵල ඇදහීමය කියන්නේ යම්කිසි ක්‍රියාවක ඵලයට ලොල්වීම නොවේ. ඵලයට ලොල්වීම තෘෂ්ණාවයි. ප්‍රඥාවේත් තෘෂ්ණාවේත් විශාල වෙනසක් තිබේ. ඵලයට ලොල්වී කරන වැඩය වෙළෙඳාමකි. අසරණයකුට උදව් කිරීම යහපත් වැඩක් වුවත් එයින් තමාට වාසියක් බලාපොරොත්තුවීම පිරිසුදු අදහසක් නොවේ.

හිඟන්නෙකුට සත පහක් දෙන්නේ තමාට පරලොව සැප බලාපොරොත්තුවෙන් නම් ඒ අදහසේ වටිනා කමක් නැත. සත පහ තමා ළඟ තිබුණට වඩා මේ දීමෙන් තමාටම වාසි බැවින් එසේ කළා මිස, එය හිඟන්නා කෙරෙහි නියම කරුණාවෙන් කළ වැඩක් නොවේ. තමාගේ දෙව්ලොව ගමනට හිඟන්නා උපායක් කොට මහ එළිකර ගත්තා මිස, හිඟන්නා කෙරෙහි නියම අනුකම්පාවක් එහි නැත. නමුත් ඒ අසරණයාට දීම තමාගේ විපතකට හේතු වුවත්, ඊට නොබා, නොපැකිළ, තමාට ලැබෙන විපාකය ගැන කිසිත් නොසලකා, ඒ අසරණයා කෙරෙහි හුදු අනුකම්පාවෙන්, කරුණාවෙන් එය කිරීම හැබෑ උත්තම අදහසයි. එයම ශ්‍රේෂ්ඨයි.

ශික්ෂාපද රැකීම පිළිබඳවද මෙසේමයි. යමෙක් සතුන් නොමරන්නේ සතුන් කෙරෙහි ඇති කරුණාව නිසා නොව තමාට සිදුවන පවට භයින් නම්, එහි උතුම් අදහසක් නැත. දිනක් මිත්‍රයකු සමග මා කථාකරමින් සිටියදී එතැනට කුෂ්ටරෝගයෙන් පෙළෙන බල්ලෙක් පැමිණියේය. මාගේ මිත්‍රයා මහත් පිළිකුලකින් හා නොමනාපයකින් බල්ලා දෙස රවා බලා, "මට පවු සිදු නොවෙතොත් මම මූ මරන්නෙමැ"යි කීය. සැබැවින්ම ඔහු සිතින් ප්‍රාණඝාතය කෙළේය. ඔහු ශික්ෂා පදයේ අකුරු මිස සාරය නම් නොරකියි. සතුන් මැරීම තමාට පවු සිදු නොවන ක්‍රියාවක් නම් ඔහු කිසිත් පැකිළීමක් නැතිව සතුන් මරන්නේය. නමුත් සත්පුරුෂයෙක් නම්, සතුන් මැරීමෙන් තමාට පින් සිදු වෙතැයි කීවද, හුදු කරුණාව නිසා සතුන් නොමරන්නේය. මෛත්‍රී කරන්නේ තමාට පින් ගැනීමට නොව අනුන්ට යහපත පිණිසයි. හැම ගුණධර්මයක් සම්බන්ධයෙන්ම මෙය මෙසේ බැව් එක වරටම නොවැටහුණත් ගැඹුරු ලෙස කල්පනා කිරීමේදී පැහැදිලි වෙනවා ඇත.

**කියවන්නා:** එතකොට පවට භය නිසා පවින් වැළකීම වැරදිද?

**කර්තෘ:** නැත: නැත: මේ කරුණු ඉතා කල්පනාවෙන් තේරුම් ගත යුතුයි. බොහෝ දෙන මගේ අදහස් වරදවා තේරුම් ගැනීම ගැන මම කනගාටු වෙමි. තමාට සිදුවන පවට භයින්වත් වැරැදිවලින් වැළකීම ඒවා කිරීමට වඩා හැම අතින්ම අගනේය. මා කියන්නේ එහි පවිත්‍ර උසස් තත්වය ගැනයි. අසරණයකුට උදව් නොකර සිටීමට වඩා මෙලොව ලාභ කීර්ති ප්‍රශංසා බලාපොරොත්තුවෙන් වුවත් උදවු කිරීම වටනේය. නමුත් මා කියන්නේ ඒ අදහස සම්පූර්ණයෙන් පවිත්‍ර නැති බවයි. ඒ මිස එය නොකළ යුතු බව නොවේ. මේවා පිළිබඳ පවිත්‍රත්වය අවබෝධ කර ගන්නා තුරු කොතරම් දේ කළත්, ඔහුට සත්‍යය දැක්ක නොහැක.

කියවන්නා: නමුත් සාමාන්‍ය කෙනකුට මේවා තේරුම් ගෙන කටයුතු කිරීම ඉතාම අපහසු නොවේද?

කර්තෘ: සැබැවින්ම එය එසේය. මේ අදහස් සමාන්‍ය අයට නොව විශේෂ අයටයි. "පඤ්ඤාවන්තස්සායං ධම්මො, නායං ධම්මො දුප්පඤ්ඤස්ස" "මේ ධර්මය නුවණැතියන්ට මිස නුවණ නැතියන්ට නොවේය"යි බුදුරජාණන්වහන්සේ දේශනා කළසේක. සාමාන්‍ය අයට තේරුම් ගැනීමට පහසුවන පරිදි සත්‍යය වෙනස් කළ නොහැක. සාමාන්‍ය මිනිසා විශේෂ තත්ත්වයකට පැමිණිදාට සත්‍යය වැටහෙනවා ඇත. කාටත් වැටහෙන පරිදි සත්‍යය කියන්නට යෑමෙන් බෝහෝ අය අසත්‍යයක් ප්‍රකාශ කරති. සත්‍යය පවත්නා උසස් තත්ත්වයට මිනිසා නැග එය දකිනු මිස, මිනිසා සිටින පහත් තත්ත්වයට සත්‍යය හෙළනු නොයෙදෙයි. එසේ කරන්නට යෑමෙන් ධර්මය නොව අධර්මයක් ඉදිරිපත් වෙයි.

කියවන්නා: එතකොට පින් බලාපොරොත්තුවෙන් යමක් කිරීම පිරිසුදු අදහසක් නො වෙයිද?

කර්තෘ: පින් ලබන අදහසින් වැඩ කරන්නාගේ සිත කිලුටු වෙයි. පින කොතරම් උසස් පිරිසුදු දෙයක් වුවත් එය තමාට ලබාගන්නට ඕනෑකම ආත්මාශාවයි. තමා කරන ක්‍රියාවෙන් තමාට ලැබෙන විපාකය නොව, ඒ ක්‍රියාවේ ඇති වටිනාකම සැලකීම ශ්‍රේෂ්ඨ අදහසයි. තමා කරන වැඩය අනුන්ට යහපතක් නම්, යුතුකමක් නම්, විපාකයෙන් තමාට ලැබෙන්නේ අපායද, ස්වර්ගයද, නිවනදැයි ඵලය ගැන කිසිත් නො සලකා එය කිරීම උත්තම ගතියයි. පරලොවදී ලක්ෂ ගණන් ලබන්නට බලාපොරොත්තුවෙන් මෙහිදී රුපියලක් වියදම් කිරීම මොන උතුම් අදහසක්ද? ස්වර්ගය හෝ නිර්වාණය ලබන බලාපොරොත්තුවෙන් අසරණයකුට සැලකීම තමාගේ වාසියට වැඩ කිරීමක් මිස උතුම් අදහසක් නොවේ. කවුරු වුවත් තමන්ගේ වාසියට වැඩ කරති.

තමාට කිසිත් පිනක් බලාපොරොත්තු නැතිව, අන්‍යයා කෙරෙහි කරුණාවෙන්, පිරිසුදු අදහසින් කරන ක්‍රියාවම ශ්‍රේෂ්ඨ පින්කමයි. මට එක්තරා ප්‍රවෘත්තියක් සිහි වෙයි: පල්ලෙපත්තුවේ ගම්කාර්ය සභාවේ ආරාධනය පරිදි මම ඒ පළාතේ ධර්මදේශනා පංතියක් සඳහා සතියක් පමණ ඇහැලියගොඩ නතරව සිටියෙමි. ඒ පළාතේ අසරණයන්ට විපතකදී පිහිටවීම සඳහා අරමුදලක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙන් ඒ දවස්වල අසරණ සරණ උපවාසයක් පවත් ගන්නාලදී. මේ උපවාසයට සම්බන්ධවූ අය වේලක් නිරාහාරව සිට ඒ වේලේ කෑම වියදම අරමුදලට පරිත්‍යාග කළහ. මේ උපවාසයට මමත් සහභාගී වීමි. ඒ දවස්වල සභාවේ අය දින තියමකරගෙන මගේ දානය පිළියෙළ කළහ. උපවාස දිනයෙහි දන්දීමට භාරගෙන සිටි දායකයා කැඳවා, මා එදින දන් නොපිළිගන්නා බවත්, දානයේ වියදම අරමුදලට පරිත්‍යාග කළ යුතු බවත් කරුණාවෙන් කීමි. නමුත් දායකයා ඉතා කනගාටුවට පැමිණ නොඑක් ඇවිටිලි බස් කියා, මට ඒ දානය දීමෙන් තමාට විශාල පිනක් කර ගන්නට ලැබෙන බැව් කීය. "ඔව්: එය ඇත්තයි. නමුත් ඔබට ලැබෙන ඒ ලාභය, පින, මේ අසරණයන් වෙනුවෙන් අත්හරින්ට බැරි දැ?"යි මම ආදරයෙන් ඇසීමි. "එසේ නම්, ස්වාමීනි, ඒ මාගේ පින අත්හැර දමා, දානයේ වියදම අසරණයන් වෙනුවෙන් අරමුදලට පරිත්‍යාග කරන්නෙමි"යි මේ උත්තම සත්පුරුෂයා කීය. සැබැවින්ම මෙය නම් ශ්‍රේෂ්ඨ පින්කමකි. අර දානය දීමට වඩා ශ්‍රේෂ්ඨ පින්කමකි. ධන ධාන්‍යයන්ට වඩා තමා උතුම්කොට සලකන පින අසරණයන් වෙනුවෙන් හැර දැමීමෙන් ඔහුගේ සිත්හි කොතරම් ශක්තියක්, පවිත්‍රකමක්, නිර්ලෝභීකමක් ඇතිවීදැයි සිතා බලනු මැනවි. නමුත් ඔහු ඒ පින අත් හැරීමම විශාල පිනක් බැව් මම දායකයාට නො කීමි. මක්නිසාද? එය පෙන්වා දුනහොත් නැවත වරක් ඊට ආශා කිරීමෙන් ඔහු සිත කිලුටු කර ගන්නා හෙයිනි.

මට නම් මේ සිද්ධිය විශාල ඉගෙනීමකි. පොත් සියයක් හැදෑරීමෙන්වත් මෙතරම් අගනා පාඩමක් ඉගෙන ගන්නට ලැබෙනවා ඇතැයි සිතීම දුෂ්කරය. තමාගේ පින ගැන

නොසලකා අසරණයන් කෙරෙහි කරුණාවෙන් මේ යුතුකම ඉටු කිරීම නිසා ඒ යහපත් මනුෂ්‍යයා නිවනට, සත්‍යයට ළංවිය. නමුත් මෙය තේරුම් ගැනීම එතරම් පහසු නොවේ.

නේරංජරා තීරයෙහි ප්‍රධන් වීර්‍ය්‍ය වඩමින් සිටි භාග්‍යවතුන් වහන්සේ කරා දිනක් මාරයා අවුත් ඒ වීර්‍ය්‍යය හැරදමා ගොස් පින් කරන්නට කියා උන්වහන්සේට අවවාද කෙළේය. උන්වහන්සේ මාරයාට පිළිතුරු දෙමින් "අනුමත්තේනපි පුඤ්ඤෙන, අත්ථො මය්හං න විජ්ජති" යි තමන් වහන්සේට කිසිත් පිනකින් අර්ථයක් නැතැයි වදාළසේක. ශ්‍රේෂ්ඨ පුරුෂයාට වුවමනා කරන්නේ පින නොව ක්‍රියාවයි. තමාගේ පිනට ගිජුවීම හීන අදහසකි.

**කියවන්නා:** ඒ කොයිහැටි වෙතත්, නිවන් පැතීම ගැන ඔබගේ අදහස පිළිගන්නට අමාරු බැව් පෙනේ.

**කර්තෘ:** ඔව්: එය තේරුම් ගැනීම පහසු නොවේ. මෙලොව වශයෙන් ලාභ, ප්‍රයෝජන තකා වැඩකිරීම උතුම් අදහසක් නොවන බැව් එතරම් දියුණු නොවූවකුටත් වැටහෙයි. තව ටිකක් ඥානය දියුණු වූ විට පරලොව වශයෙන් බලාපොරොත්තු වීමත් එබඳුම අදහසක් බැව් වැටහෙයි. ඒත් නිවන් පැතීම ආත්මාශාවක් බැව් නොවැටහෙයි. තවදුරටත් නුවණින් සිතා බලන විට, නිවන පැතීම පවා එක්තරා බලාපොරොත්තුවක් බවත්, එක්තරා ප්‍රමාණයක ආත්මාශාවක් බවත්, වැටහෙනවා ඇත.

**කියවන්නා:** නිර්වාණය නම් කුමක්ද?

**කර්තෘ:** එය නම් ලෝකෝත්තර නිදහසයි. නමුත් ඒ ගැන මම දැන් කිසිත් නොකියමි. මෙහිදී මට වුවමනා කරන්නේ නිවන කොතරම් උතුම් ධර්මයක් වුවත්, යමකුට දානයක් දී,

නැතහොත් එබඳු යහපත් වැඩක් කොට, එයින් තමාට නිවන් බලාපොරොත්තුවීම සම්පූර්ණයෙන් පිරිසිදු අදහසක් නොවන බව පහදා දීමයි.

කියවන්නා: නිවන බෞද්ධයාගේ කෙළවරයි. ඒ ගැන බලාපොරොත්තුවීම පිරිසිදු අදහසක් නොවන බැව් මට නම් නොතේරේ.

කර්තෘ: නිවන බෞද්ධයාගේ පමණක් නොව කාගේත් කෙළවරයි. එය ලැබීමට නොව, ලෝකයට යහපතක් බැවින් ධර්මයේ ගමන් කරන්නාට ඒ ගමන සම්පූර්ණවූ විට නිවන දකින්ට ලැබෙනවා ඇත.

කියවන්නා: බලාපොරොත්තුවක් නැතිව මේ ලෝකයේ කිසිවක් සඵල කර ගත නොහැක. "අසවල් තැනට යමි" යි සිතා නො ගෙන ගෙයින් පිටවූ පුද්ගලයා කොතනින් ගොස් කොතනක නවතීදැයි ඔහුම නොදනියි. එමෙන්ම, අනෙක් ප්‍රාර්ථනාවන් කොයි හැටි වෙතත්, නිර්වාණය නොපතන්නා ගැන බලාපොරොත්තුවක් නැත.

කර්තෘ: සත්‍යය තේරුම් ගැනීමට උපමාවලින් වැඩි පිහිටක් බලාපොරොත්තු නොවිය යුතුයි. උපමාවලින් ප්‍රයෝජන නැතැයි මම නොකියමි. නමුත් ඒ හැමතැනදීම නොවේ. ඔබ දැක්වූ උපමාවෙන් නිවන් පැතිය යුතුයයි යමෙකුට සිතෙනවා ඇත. ලෝකයේ යම්කිසි තැනකට යැමට මාර්ගයෝ බොහෝය. එසේම නොඑක් අතට යන මාර්ගයෝත් ඇත. නමුත් නිවනට මාර්ග දෙකක් නැත. ඇත්තේ ඒකායන මාර්ගයයි. ඒ මගින් යැවෙන්නේ නිවනටමය. වෙන තැනකට යානොහැක. එනිසා මෙබඳු උපමාවක් මෙතරම් සියුම් ධර්මයක් හා සසඳන්නට යැම සතුටුදායක නොවේ. නමුත් වුවමනා නම් අනෙක් පක්ෂයටද උපමා දැක්විය හැක. කුසගින්නෙන් පෙළෙන

මිනිසෙක් කුසගිනි නිවීමට සෑහෙන ආහාරයක් ලැබ වළඳයි. ඉතින් ඔහු 'මගේ කුසගිනි නිවේවා!' කියා ප්‍රාර්ථනා කරන්නටත් ඕනෑද? නැත. ගොවියෙක් නිසි පරිදි කුඹුරක් පිළියෙළ කොට වී වපුරයි. ඔහු වැඩකළ අන්දමට අස්වැන්න ලැබෙනවා ඇත. "අස්වැන්න ලැබේවා!" කියා ඔහු ප්‍රාර්ථනා කරතොත් එය කොතරම් නුවුමනා වැඩක්ද? එමෙන්ම නිවන් දැකීමට තරම් සිත දියුණුවීනම්, ඒ සිතට නොවැරදීම නිවන් අවබෝධ වෙනවා ඇත. එය වැළැක්විය නොහැක. ඒ ගැන ප්‍රාර්ථනාවක් කොහෙත්ම වුවමනා නොවෙයි.

මෙහිදී මීට වඩා සැලකිය යුතු සාරවත් කරුණක් තිබේ. ලෞකික ධර්මයන්ගේත් ලෝකෝත්තර ධර්මයන්ගේත් එකිනෙකට විහාල වෙනසක් පවත්නා බැව් කවුරුත් පිළිගනිති. ඒ ධර්මයන්ගේ වෙනසක් පවත්නාක් මෙන්ම ඒ ධර්මයන් ලබන මාර්ගයන්ගේද එකිනෙකට විශාල වෙනසක් පවත්නා බැව් පිළිගත යුතුයි. ලෞකික ධර්මය සම්පූර්ණයෙන්ම ලෝකෝත්තර ධර්මයට ප්‍රතිවිරුද්ධය. එමෙන්ම ලෞකික ධර්මය ලබන මාර්ගයද ලෝකෝත්තර ධර්මය ලබන මාර්ගයට ඉඳුරාම ප්‍රතිවිරුද්ධය. අඤ්ඤා හි ලාභූපනිසා, අඤ්ඤා නිබ්බානගාමිනී, නිවන් ලබන මාර්ගය, ලාභ ප්‍රයෝජන ලබන මාර්ගයට වඩා ඒකාන්තයෙන්ම වෙනස්යයි තථාගතයන් වහන්සේ වදළ බව සැලකිය යුතුයි. ලෞකික අදහසක් ඉටුකර ගැනීම පිණිස නම් ඒ ගැන ප්‍රාර්ථනාවක් බලාපොරොත්තුවක් තිබිය යුතු බැව් මම එකහෙළා පිළිගනිමි. නමුත් ලෝකෝත්තර ධර්මයන් ලැබීමට ඒ පිළිබඳව ඇති ප්‍රාර්ථනාව, බලාපොරොත්තුව සම්පූර්ණයෙන්ම නැති විය යුතුයි. නිර්වාණය සියුම් ධර්මයක් මෙන්ම ඒ ගැන මනුෂ්‍යයා තුළ ඇති ආශාවද සියුම්ය. එය ක්ලේශයක් බැව් තේරුම් ගැනීම දුෂ්කරව පවත්නේ එහෙයිනි. "නිවන් දකින්ට ඕනෑ ය" යන අදහසින් යමකු කොතරම් වෑයම් කළත්, ඔහුට එය ලැබිය නොහැක. "මට නිවන් ඕනෑ" යන අදහස ඉතා සියුම් ආත්මාශාවකි. ඒ ආත්මාශාව නැති කරන තුරු නිවන් අවබෝධ නොවේ.

කියවන්නා: එතකොට ශ්‍රාවක චරිතවල දක්නට ලැබෙන පරිදි, අසවල් රහතන් වහන්සේ අසවල් බුදුන්ගේ කාලයේදී කළ ප්‍රාර්ථනාවක් මේ කාලයේ මෙසේ සඵල විය යනාදි වශයෙන් තිබෙන කතා වස්තූන් සම්බන්ධයෙන් ඔබ කුමක් සිතන්නෙහිද?

කර්තෘ: කථා වස්තුවකින් සත්‍යය මැනිය නොහැක. සත්‍යයෙන් කථා වස්තුව මැනිය යුතුයි. සත්‍යය ප්‍රධානයි. කථාව අප්‍රධානයි. කථාව ධර්මය නොවේ. එය ප්‍රවෘත්තියකි. ඒ ලියවී තිබෙන ප්‍රවෘත්තිවල යම්කිසි සත්‍යයක් ඇත්දැයි ධර්මයෙන් විසඳනු මිස, ප්‍රවෘත්තිවලින් ධර්මය විසඳන්නට යෑම අන්තරායදායක වැඩකි.

කියවන්නා: ප්‍රාර්ථනා කිරීම බුද්ධාගමේ ඉතා බලවත් ධර්මයක් බවත්, ප්‍රාර්ථනා නොකරන්නාට නිවන් ලැබිය නොහැකි බවත් සමහරු ලියති, කියති. මේ ගැන ඔබගේ අදහස කුමක් ද?

කර්තෘ: එසේ කියන්නන් ධර්මය කෙබඳු දෙයක් දැයි නොදන්නා බැව් මම යටහත්ව කියමි. ආර්ය අෂ්ටාංගික මාර්ගය බුද්ධාගමේ නිවන් මගයි. එය සම්පූර්ණ මාර්ගයයි. එහි කිසික් අඩුවක් නැත. ප්‍රාර්ථනා නොකරන්නාට නිවන් ලැබිය නොහැකි නම්, ප්‍රාර්ථනාව නිවන් මගෙහි ඉතාම අවශ්‍ය ප්‍රමුඛ අංගයක් විය යුතුයි. එසේ නම් එය සම්‍යක් ප්‍රාර්ථනා හෝ වෙන නමකින් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙහිදී බුදුරජාණන් වහන්සේ විසින් එක් අංගයක් හැටියට දේශනා කළ යුතුයි. නමුත් ආර්යඅෂ්ටාංගික මාර්ගයෙහි ප්‍රාර්ථනාව ගැන කිසික් සඳහන්වී නැත. ප්‍රාර්ථනා නොකරන්නාට නිවන් ලැබිය නොහැකැයි උගන්වන්නෝ අබෞද්ධ මතයක් උගන්වති.

කියවන්නා: ප්‍රාර්ථනා නො කරන්නාගේ කුසල කර්මයන්හි නියම විපාකය නොලැබේයයි සමහරු කියති.

කර්තෘ: එසේ නම් කුසල් පිළිබඳව පමණක් ඇයි? අකුසල් පිළිබඳවද එසේම කියයුතුයි. නමුත් එසේ කියන්නෝ කර්ම ඵල නොඅදහන්නෝය. කර්මයේ ඵලය ලැබීමට ප්‍රාර්ථනාවක් කුමටද? කර්මයට නියම ඵලය හටගැනීම කර්මඵලයන් පිළිබඳ ධර්මයයි. කුසල් අකුසල් දෙපක්ෂයම පිළිබඳව එය එසේමය. යම්කිසි සිතක් නිවන් දැකීමට තරම් දියුණුවී නම්, ඒ සිතට නිවන් පෙනීම ඒකාන්තයි.

යමෙක් නිවන් මගෙහි, ආර්යඅෂ්ටාංගික මාර්ගයෙහි ගමන් කරයි නම්, යමකුගේ සිත එපමණට දියුණුවී ඇත්නම්, ඔහු නිවනට නොපැමිණ නොනවතියි. ඒ ගැන අමුතු ප්‍රාර්ථනාවක් නුවුවමනාය. සංසාරයේ හැසිරෙන අපි නොයෙක් ආත්මවලදී නිවන් ප්‍රාර්ථනා කෙළෙමු. නමුත් අපට එයින් නිවන් ලැබිය හැකිවීද? වුවමනා කරන්නේ ප්‍රාර්ථනාව නොව ධර්මමාර්ගයෙහි ගමන් කිරීමයි. ප්‍රාර්ථනාව නම් යාඥාවේම විකෘතියකි.

සිතා බැලීමට මම ඔබට උපමා කථාවක් කියමි. ඔබත් මමත් අතිශයින්ම හිතවත් මිත්‍රයෝ වෙමු. බුදුරජාණන් වහන්සේ ඉදිරියේදී ඔබට නිවන් ලැබෙන්නටයයි. එවිට ඔබ මෙසේ කියන්නෙහිය: "මගේ මිත්‍රයාට නිවන් නොලැබෙතොත් මට පමණක් නිවනින් කම් නැත." ඉක්බිති බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරණ සේක. "එව්: ඔබ කැමැති නම් ඔබට ලැබෙන නිවන ඔබගේ මිත්‍රයාට පැවැරිය හැක. (මෙය කවදාවත් සිදුවිය හැක්කක් නොවේ.) නමුත් අද ඔබට ලැබෙන මේ නිවන මිත්‍රයාට දුනහොත්, මින් පසු කිසි කලක ඔබට නිවන් දැක්ක නොහැක." මෙහිදී ඔබ මෙසේ සිතන්නෙහිය: "අද මට ලැබෙන මේ නිවන මගේ මිත්‍රයාට දුනහොත් මින් පසු කිසි කලක මට නිවන් නොලැබෙයි. පසුව නිවන් ලබන්නට ඔහුට ඉඩදී, මම දැන් නිවන් ලබමි". මේ සිතිවිල්ල සමගම ඔබ නිර්වාණයෙන් යොදුන් දහස් ගණනක් ඈත් වන්නෙහිය. නමුත්, "මට කවදාවත් නිවන් ලැබිය නො හැකි වුවත්, මින් පසු සදාකල්හිම අපායේ දුක් විඳින්නට සිදු වුවත්,

මට ලැබෙන මේ නිවන මගේ මිත්‍රයාට දෙමි"යි ඔබ සිතුවහොත් ඔබට සාමාන්‍යයෙන් නිවන පමණක් නොව, ලොවුතුරා බුද්ධ රාජ්‍යයද ලැබෙන්නේය. මේ කථාව ගැන ටිකක් දුරට සිතා බලන විට ඉතා සියුම් ධර්මයක් පැහැදිලි වෙයි. "නිවන මට ඕනෑය"යි සිතන්නාට එය නොලැබෙයි. අනුන් වෙනුවෙන් එය හැර දමන්නාට ලැබෙයි. නිවන් දැකීම පිළිබඳ රහසද මෙයම වේ.

කියවන්නා: නමුත් බලාපොරොත්තුවක් නැත් නම් අප කරන දේවල තේරුම මොකද?

කර්තෘ: තෘෂ්ණාව, පාපය, කිලුට පවත්නේ එතනයි. "බලාපොරොත්තුවක්" ගැන සිතෙන්නේ ආශාව නිසයි. අපට වාසියක් නැතොත් වැඩක් කිරීමට තරම් අපේ සිත දියුණු නැති බැව් එයින් හෙළිවෙයි. මෙය නම් ඉතාම බලවත්වූ, නමුත් තේරුම් ගත නොහැකි තරම් සියුම්වූ ආත්මාශාවයි.

කියවන්නා: බුදු-පසේබුදු-රහත් යන තුන්තරා බෝධියෙන් එක්තරා බෝධියක් ප්‍රාර්ථනා කළ යුතු බැව් සමහරු කියති. තවත් සමහරෙක්, ලොවුතුරා බුද්ධත්වයම ප්‍රාර්ථනා කළ යුතු බවත්, එසේ කළවිට එය නොලැබුණොත් පසේබුදුබව හෝ, එයත් වැරදුණොත් රහත් බව හෝ ලැබෙන බවත් කියති. මේ ගැන ඔබගේ අදහස කුමක්ද?

කර්තෘ: මෙය අමුතුවෙන් කථා කළ යුත්තක් නො වේ. නමුත් එය නම් ඉතාම හීන අදහසක් බැව් කිය යුතුයි. මෙය තමා විසින් තමාම රැවැටීමකි. මේ අදහසේ කිසිත් වීර්යයක්, අධිෂ්ඨානයක් නැත. අධිෂ්ඨානය, වීර්යය පිළිබඳවූ දෙයකදී "වැරදුණොත්" යන අදහසක් කවදවත් ඇති නොවේ. වීර්යය, අධිෂ්ඨානය ආදි ධර්මයන් ඇතියකුට කිසිකලක නොවරදී: " වැරදුණොත්" යන සිතිවිල්ල සමගම ඒ ගුණධර්මයෝ අතුරුදහන් වෙති. මේ

ප්‍රාර්ථනාව අනෙක් ප්‍රාර්ථනාවන්ටත් වඩා තිවට එකකි. මෙබඳු ප්‍රාර්ථනාවක් කරන්නා චපලයෙකි. ඔහුගේ ස්ථිර අදහසක් නැත. එබඳු මනුෂ්‍යයකුට නිර්වාණය තබා නැවත මනුෂ්‍යාත්මයක් ලබන්නට වත් පුළුවන්වේදැයි සිතීම උගහටයි. නිර්වාණය මෙබඳු තිවට, තියාලු, දුබල සිතකට අවබෝධ වන දෙයක් නොවේ. එය වීර්යය, අධිෂ්ඨානය, ප්‍රඥාව ආදි පාරමී ධර්මයන්ගෙන් ප්‍රාණවත්වූ දීප්තිමත් සිතටම අවබෝධ වන්නකි. එසේ නැතිව, මෙය වැරදුණොත් එය වත් ලැබෙනවා ඇතැයි කිසිත් ආත්මශක්තියක්, ආත්මවිශ්වාසයක් නැතිව දුර්වලව සිතන චපලයාට නිර්වාණය තබා එදිනෙදා කරන දෙයකින්වත් ජයක් ලැබිය නොහැක. මෙබඳු අදහස් වලින් මනුෂ්‍යයා දීන බවට පැමිණෙයි.

කියවන්නා: ඔබ මෙසේ කථා කිරීම ගැන මම කනගාටුවෙමි. මේ සම්බන්ධයෙන් අපි උදාහරණයක් ගනිමු. අතු තුනක් පෙළට තිබෙන ගසක ඉහළම අත්ත ඇල්වීමට අදහස් කරගෙන මිනිසෙක් උඩ පනියි. ඔහුට ඉහළම අත්ත අල්වා ගත නොහැකිවී නම්, ඊළඟ අත්ත හෝ, එයත් අල්වා ගත නොහැකිවී නම්, තුන්වන අත්ත හෝ අල්වා ගන්නට පුළුවන් වෙනවා ඇත. ඉහළම තොටුපලින් එගොඩ වන්නට සිතා පීනන පුද්ගලයාට එය වැරදුණොත් දෙවෙනි තොටුපලින් හෝ එයත් බැරි වුණොත් තුන්වන තොටුපලින්වත් එගොඩ වන්නට පුළුවන් වෙනවා ඇත. මෙසේම ලොවුතුරා බුද්ධත්වය පත්නනකුට එය වැරදුණොත් පසේබුදු බව හෝ, එයත් වැරදුණොත් රහත් බව හෝ ලැබෙනවා ඇත. මීට ඔබ කුමක් කියන්නෙහිද?

කර්තෘ: උසස් ධර්මයන් සම්බන්ධයෙන් කථා කරන විට උපමා උදාහරණ දැක්වීමට මම නිතරම මැළිවෙමි. නමුත් යටකී ප්‍රාර්ථනාවෙන් කිසිත් වැඩක් නොවන බැව් දැක්වීමට මමත් උපමාවක් ඉදිරිපත් කරමි: එක්තරා ශිෂ්‍යයෙක් අධිනීතිඥ විභාගයට පෙනී සිටියේය. ඔහු එයින් අසමර්ථ විය. එනිසා

ඔහුට නීතිඥකම හෝ නොතාරිස්කම ලැබේද? සැබැවින්ම නැත. එසේම ලොවුතුරා බුද්ධත්වය පතා එය නොලැබුණොත් ඒ හේතුවෙන් පසේබුදු බව හෝ රහත් බව ලබන්නට පුළුවන් කමක් නැත. උපමා දැක්වීම අපහසු වැඩක් නොවේ. නමුත් සත්‍යාවබෝධයට එයින් ඇති ඵලය කිම? යම් කිසිවක සත්‍යාසත්‍යය, එහි ඇති ස්වභාවය තේරුම් ගැනීමෙන්ම, එය දැකීමෙන්ම, එහි සිත වැඩීමෙන්ම මිස බාහිර උපමා උදාහරණවලින් තේරුම් ගැනීම සැකසහිතයි.

ලොවුතුරා බුද්ධත්වයම පැතිය යුතු බවත්, එය නො ලැබුණොත් පසේබුදුබව හෝ රහත්බව ලැබෙන බවත් බොහෝදෙන ලියති, කියති. එය චපලකමින්, වංචාවෙන්, දුර්වලකමින්, මුළාවෙන් ගැවසීගත් හීන අදහසක් බැව් මට නම් එක වරටම පෙනේ. මේ අදහස් පුරුදු වීමෙන් මනුෂ්‍යයා පරම්පරාවෙන් පරම්පරාවටම පිරිහෙයි.

කියවන්නාඃ හොඳයි, එතකොට මේ ප්‍රාර්ථනා කිරීමේ සිරිත ඇති වූයේ කෙසේද?

කර්තෘඃ එය එතරම් රහසක් නොවේ. ආශාව නිසා සත්වයාගේ සිත්හි ප්‍රාර්ථනා කිරීමේ අදහස ඉබේම පහළවීම ස්වාභාවික සිද්ධියකි. එය අමුතුවෙන් පුරුදු කළ යුත්තක් නොවේ. "මා කළ මේ ක්‍රියාවේ විපාකය නොලැබී ගියොත් අලාභයකැ"යි මුළාවූ මනුෂ්‍යයා තුළ භය හටගනී, මේ මුළාවත්, භයත්, ආශාවත් නිසා "මේ දේ ලැබේවා!"යි හෙතෙමේ ප්‍රාර්ථනා කරයි.

ප්‍රාර්ථනාවට මිනිසුන් පෙළඹවීම ඉතාම පහසු වැඩකි. මෙය පසු කලක භික්ෂූන් විසින් දියුණු කරන ලද බැව් පොත් පත් කියවීමේදී පෙනේ. පොත්පත් ලියූ සමහර කර්තෘවරුද, ඇතැම් දේශකයෝද මුල දී පස්කම් සැපයට දොස් නගා, අවසානයේ දී (නුවණැතියන් සිනස්සමින්) එය ම ප්‍රාර්ථනා

කරති. මෙහි ඇති නොගැළපීම සිතා බලන්න. යම් කිසිවකු දානයක් දුන් විට හෝ වෙන වැඩක් කළ විට, ඔහු ලවා "මේ පිනින් මට දෙව් මිනිස් සැප හා කෙළවර නිවන් සැපත් ලැබේවා" යි භික්ෂූහු ප්‍රාර්ථනා කරවති. හෙතෙමේ එයින් ප්‍රීතියට පැමිණෙයි. එසේම "පින්" කිරීම ලොකු වාසියක් බැව් සිතා යළි යළිත් එබඳු දේ කරන්නට පෙළඹයි. එසේ ප්‍රාර්ථනාවක් නොකළ හොත් ඔහුගේ සිත ඊට ඇදෙන්නට උපායක් නැත.

නමුත් මේ ප්‍රාර්ථනාව නිසා මනුෂ්‍යයාගේ විශාල පිරිහීමක් ඇතිවී තිබේ. මෙයින් චෛතසික ශක්තිය, ආත්ම බලය ඉතාම කනගාටුදායක ලෙස හීනවෙයි. මේ ජීවිතයේදී ධර්මය පුරුදු කිරීමේ අදහස හැරදමා මෛත්‍රෙය බුදුන් ලොව පහළවන තුරු එය කල්දමන්නට පුරුදු වෙයි.

කියවන්නා: හොඳයි, මොන අන්දමකින්වත් කළ යුතු ප්‍රාර්ථනාවක් නැද්ද?

කර්තෘ: කොහොම නමුත් ප්‍රාර්ථනාවක් නැතිවම බැරි බැව් පෙනේ. ආත්මාශාවට සම්බන්ධවන මොනම ප්‍රාර්ථනාවක්වත් යහපත්යයි මම නොසිතමි. නමුත් "උපනුපන් ජාතියෙහි අසරණයන්ට පිහිටවන්නට මට ශක්තිය ලැබේවා! කිසිවකුටත් මගෙන් හොඳක් මිස නොහොඳක් නොවේවා!" යනාදීන් ලොවට වැඩ පිණිස ලෝකයා දුකින් මිදවීම පිණිස කරන යම් ප්‍රාර්ථනාවක් වෙයි නම් එය උතුම් එකකි. එහි ආත්මාශාවක් ඇති බැව් නොපෙනේ.

කියවන්නා: ඔබගේ මේ අදහස් මේ තාක් අපට පුරුදු අදහස්වලට වඩා ඉතාම වෙනස්ය. එසේම පොත් පත්වල ලියැවී තිබෙන අදහස් හා නොගැළපෙන බැව්ද පෙනේ. එහෙයින් මේවා තේරුම් ගැනීම ටිකක් අපහසුයයි මම සිතමි.

කර්තෘ: ඔව්: එය ඇත්තයි. මේවා තේරුම් ගැනීම ටිකක් අපහසුයි. ඊට අනුව ක්‍රියා කිරීම බොහොම අපහසුයි. පොත් පත්වල ලියවී තිබෙන දේ බොහෝ අය වරදවා තේරුම් ගනිති. භාෂාවක වචන වැටහුණු පමණින්, ඒ වචනවලින් කියවෙන ධර්මය අවබෝධ කරගත නොහැක. ප්‍රාර්ථනාව සම්බන්ධයෙන් පොත්වල ලියවී තිබෙන දේ හරියට තේරුම් ගන්නට වෑයම් කළ යුතුයි. බෝධිසත්වයන් වැනි උත්තමයකුගේ සිත්හි පහළ වූ ශ්‍රේෂ්ඨ අදහසක් වචනයෙන් පෙන්විය නොහැකි බැවින්, ඒ ගැන "ප්‍රාර්ථනා" යන වචනය සාමාන්‍යයෙන් යොදන ලදී. නමුත් ඒ අදහස "මට මෙය මෙසේ ලැබේවා!" යනාදීන් අද බොහෝ දෙන ආත්මාශාවෙන් කරන ප්‍රාර්ථනාව හා ගළපන්නට යෑම මුළාවකි. බෝධිසත්වයන්ගේ "ප්‍රාර්ථනාවෙහි" කිසිත් ආත්මාශාවක් නැත. උන්වහන්සේට නිවන් වුවමනා නොවීය. උන්වහන්සේ නිවන කිසිත් ගණනකට නොගෙන හැරදැමූ කෙනෙකි. උන්වහන්සේට වුවමනා කෙළේ ලොවට පිහිටවීමයි. උන්වහන්සේ ඊට සුදුසුකම් ඇතිකර ගත්සේක. ඒ සුදුසුකම් ඇතිකර ගත්තේ තමාගේ සැපය පිණිස නොව අනුන්ගේ සැපය පිණිසයි. අනුන්ගේ සැපය පිණිස උන්වහන්සේ සදාකල්හිම අපායේ දුක් විඳින්නට වුවත් කැමැති වන සේක. උන්වහන්සේට පිනින්වත් නිවනින්වත් කම් නැත. අනුන්ට පිහිට වන්නට වෑයම් කිරීමම තම පිහිට බැව් අමුතුවෙන් කිවමනා නොවේ.

නිර්වාණය අභිනන්දනය කිරීම, ඒ ගැන ඇල්ම සාමාන්‍ය පෘථග්ජනයාගේ ගතිය බවත් බුද්ධාදි උත්තමයන් එසේ නො කරන බවත් සබ්බධම්ම මූලපරියාය සූත්‍රයේදී ප්‍රකාශවෙයි. නමුත් මේ ධර්මයන් හරිහැටි තේරුම් ගත් අය ඉතා විරලය. ධර්මයේ සාරය තේරුම් නොගෙන, නිකම් කථා වස්තූන් ධර්මය හැටියට සලකන්නට යෑමෙන් බොහෝ දෙන අඳුරේ වැටී සිටිති. මේ ධර්මයන් පිරිසිදු ලෙස අවබෝධ කර ගන්නට නම් නිදහස්ව සිතිය යුතුයි. වෙහෙර විහාර ලක්ෂයක් ගොඩ

නැගීමට වඩා, බුදුන් ඇතුළු ලක්ෂයක් මහරහතන්ට මහදන් දීමට වඩා මෙබඳු ධර්මයක් තේරුම් ගැනීම ශ්‍රේෂ්ඨයි. පොත පතේ කියන දෙයට සාධුකාර දෙන්නන් මිස, නිදහස්ව ධර්මය සොයන්නන්, විවේචනය කරන්නන් අප අතර දුර්ලභවීම කනගාටුවට කරුණකි.

# 6
# මතභේදය

බෞද්ධයා තරම් නිදහස් මතධාරියෙක් ලෝකයේ නැත. නිදහස්ව කල්පනා කිරීමේ අගය පළමුවෙන්ම ලෝකයට ඉගැන්වූ ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේය. මේ නිර්භීත ක්‍රියාවට ඉදිරිපත්වීමට තරම් ආත්මශක්තියක් හා සත්‍යාවබෝධයක් වෙන කිසිද ශාස්තෘවරයකු තුළ නොවීය. අංගුත්තර නිකායේ තිකනිපාතයේ කාලාම සූත්‍රය මුළු ලෝකයට කල්පනා කිරීමේ නිදහස ලබා දෙයි:

"එථ තුම්හෙ කාලාමා, මා අනුස්සවෙන: මා පරම්පරාය: මා ඉතිකිරාය: මා පිටකසම්පදානේන: මා තක්කහේතු: මා නයහේතු: මා ආකාරපරිවිතක්කේන: මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා: මා භබ්බරූපතාය: මා සමණො නො ගරූති. යදා තුම්හෙ කාලාමා, අත්තනාව ජානෙය්‍යාථ ඉමෙ ධම්මා අකුසලා.... අථ තුම්හෙ පජ්හෙය්‍යාථ: ....ඉමෙ ධම්මා කුසලා... අථ තුම්හෙ උපසම්පජ්ජ විහරෙය්‍යාථ."

"කාලාමයෙනි, යමක් ඇසූ පමණින් භාර නොගනිව්: පරම්පරාවේ පැවැත එන නිසාවත්: එය එසේය යන ආරංචියෙන්වත්: ආගමික පොත්පත්වල තිබුණු පමණින්වත්: තර්කය නිසා හෝ න්‍යායය නිසාවත්: මේ කාරණය කියා තිබෙන හැටි මැනැවැයි සිතාවත්: තමත් කලින් සිතූ අදහසට ගැළපුණු පමණින්වත්: මේ පුද්ගලයා සෑහෙන කෙනෙකැ, ඔහු කියන දෙය පිළිගත යුතුය සිතාවත්: මේ තැනැත්තා මාගේ ආචාර්යයන් වහන්සේය කියාවත් යමක් භාර නොගනිව්. නමුත් කාලාමයෙනි, මේ අයහපතැයි යම්දිනක තොපටම වැටහුණොත්, එදින එය හැර දමව්: එසේම මේ යහපතැයි තොපටම වැටහුණොත් එය පිළිපදිව්."

මේ ඉගැන්වීමෙන් බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයන් තුළ කොතරම් විප්ලවයක් ඇතිකළ සේක්දැයි ආගම් පිළිබඳ ඉතිහාසය ශාක්ෂි දරයි. ලෝකයා දිවි දෙවෙනි කොට ගරු කරන පරම්පරාව, ආගමික පොත්පත්, ආචාර්ය මතය ආදි දේවල් උන්වහන්සේ කිසිත් ගණනකට නොගත්සේක. දඹදිව නොව අනෙක් රටක මනුෂ්‍යයෙක් මේ ප්‍රකාශය කෙළේනම්, ඒ රටේ නීතියෙන් ඔහු මරණීය දඬුවමට පත්කරනු නොඅනුමානයි. වෙන රටවල පහළවූ ශාස්තෘවරයන්ටත් පණ්ඩිතයන්ටත් ඒ විපත සිදුවිය. මේ අදහස් ප්‍රකාශ කිරීම නිසා බුදුරජාණන් වහන්සේත් විනාශ කර දැමීමට උන්වහන්සේගේ සතුරන් නොඑක් උපක්‍රම යෙදූ නමුත්, ඒ එකක් වත් සාර්ථක නොවීම ලෝකයේ භාග්‍යයකි.

ඇසිසියේ සන්ත ප්‍රන්සිස් තුමා උත්තම තාපසයෙකි. එතුමා දෙවෙනි ක්‍රිස්තුස් වහන්සේ හැටියට ප්‍රසිද්ධය. එතුමාගේ මෛත්‍රිය කොතරම්ද යත්, රුක් මතුයෙහි උන් වන පක්ෂීන්ට "කුඩා සහෝදරයෙනි, බිමට බැසපල්ලාය"යි කීවිට, ඒ පක්ෂීහු ගසින් බැස එතුමාගේ හිසෙහිත් දෙඋරෙහිත් වසති. වනයෙහි මෘගයන්ට කථා කළවිට, ඔවුහු කොහෙත්ම චකිත නොව, එතුමා පාමුලට එති. මේ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයා දිළිඳුකම වැළඳගෙන මුළු ජීවිතය මනුෂ්‍ය වර්ගයාගේ යහපත පිණිස මෙහෙ කිරීමෙහි යෙදුණේය. දිනක් මේ උත්තම තාපසයා තම ශිෂ්‍යයන් දෙදෙනෙකුන් ළඟට කැඳවා, ඔවුන්ට ගෝවා පැලයක් දී, එහි කරටිය යටට සිටින්ටත්, මුල උඩට සිටින්ටත් පැලකරන ලෙස නියම කෙළේය. එක ගෝලයෙක් කිසිත් කථාවක් නැතිව නියමය පිළිගත්තේය. නමුත් අනෙක් ගෝලයා කථා කරමින් කරටිය යටටත්, මුල උඩටත් සිටින්ට පැල කළ නොහැකි බවත්, මුල යටටත්, කරටිය උඩටත් සිටින්ට පැල කළයුතු බවත් කීය. "ඔබ ගුරුවරයාට වඩා උගතෙකුවත්නට සිතන්නෙහිය" යි සන්ත ප්‍රන්සිස් තුමා ඊට උදහස් විය. අනෙක් අතින් කොතරම් ශ්‍රේෂ්ඨ වුවත්, මෙතුමා නිදහස අතින් අපට එකඟවිය නොහැකි තත්ත්වයක සිටිය බැව් පෙනේ.

නමුත් බොහෝ දුරට අද බෞද්ධ ඉගැන්වීමත් මේ තත්ත්වයේ පවත්නා බැව් පිළිගතයුතුව තිබේ. ගුරුවරයාගේ අදහසට හෝ

පොතේ අදහසට නැතහොත් පරම්පරාවට විරුද්ධ මතයක් ශිෂ්‍යයා පළ කළහොත් ගුරුවරයා තදින් කිපී ඔහුට නොඑක් අන්දමින් තරවටු කරයි. ගෝලයාගේ පරීක්ෂා බුද්ධිය, විවේචන බුද්ධිය පාගා දමන්නට ගුරුවරයා නිතරම සූදානම් වෙයි. ගුරුවරයාට වඩා ගෝලයා නුවණැතියෙක් වන්නේ කෙසේදැයි ප්‍රශ්නකරයි. ගෝලයා ජීවිතාන්තය දක්වා තමාගේ වහලා කරගන්නට ගුරුවරයා නිතරම වෑයම් කරයි. මේ ඉගැන්වීම් ක්‍රමය නිසා ඇතිවූ වහල්ලු අප අතර බොහෝය. නිදහස් මතයක් ඔවුනතර ප්‍රකාශ කිරීම බීරි ඇතුන්ට කරන වීනා ගායනාවකි.

හැම කරුණක් පිළිබඳවම මතභේදයක් හටගැනීම ලෝක ස්වභාවයකි. එකම දෙයක් පිළිබඳව කිහිප දෙනකුන් අතර අදහස් කිහිපයක් ඇතිවීම නිසා යමෙක් පුදුමයට හෝ කලබලයට පැමිණෙයි නම්, එය ඔහුගේ දුර්වලකමේ ලකුණකි. අනෙක් හැම දෙයක් ගැන මෙන්ම ආගම ධර්මය ගැනද මතභේදයක් පහළ වීම ස්වභාවයකි. පෝප්තුමාට මෙන්ම සාමාන්‍ය ක්‍රිස්තු භක්තිකයෙකුටත් ක්‍රිස්තු ධර්මය ගැන මතයක් පහළ කිරීමට අවකාශ තිබිය යුතුයි. කුමක් හෙයින්ද? අර සාමාන්‍ය ක්‍රිස්තු භක්තිකයාට මෙන්ම පෝප්තුමාටත් ක්‍රිස්තුවහන්සේ හමුවී නැත. දෙදෙනම බෛබලය කියවා තේරුම් ගනිති. එහෙයින් බුද්ධ ධර්මය උගත් සාමාන්‍ය බෞද්ධයකුගේ ඒ පිළිබඳ මතයක් මහා නායක මාහිමියන් වහන්සේගේ මතයට යටත් කරන්නට කිසිත් යුතුකමක් නැත. දෙදෙනාම ත්‍රිපිටකය කියවා තේරුම් ගනිති. දෙදෙනාගෙන් කිසිවකුටත් බුදුරජාණන් වහන්සේ හමුවී සාකච්ඡා කරන්නට අවස්ථාවක් නොලැබුණේය. බුද්ධ ධර්මයේ ගුරුවරයාගෙන්ම අසා දැනගතයුතු "ආචරිය මුට්ඨි"යක්, රහසක් නැති බැව් තථාගතයන් වහන්සේ පිරිනිවන්පාන්නට ස්වල්ප වේලාවකට කලින් දේශනා කළසේක. ධර්මය අභ්‍යන්තර දියුණුවේ හැටියට වැටහෙන දෙයක් මිස, භාෂාවක වචන දැනගත් පමණින් වැටහෙන දෙයක් නොවේ.

ආගමික පොත්පත්වල ලියවී තිබෙන බැවින්ම යමක් පිළිගත යුතුයයි සිතීම බලවත් මිථ්‍යා අදහසකි. "මා පිටකසම්පදානේන"

"පිටකයේ එන බැවින් පිළිනොගනිව් ය"යි බුදුරජාණන් වහන්සේ දේශනා කළසේක. "පිටක" යනු ආගමික පොත්වලට ව්‍යවහාර කරනු ලබන වචනයකි. බෛබලය ක්‍රිස්තියානියේ පිටකයයි; ක්වොරාන් පොත මහමදාගමේ පිටකයයි; ත්‍රිපිටකය බුද්ධාගමේ පිටකයයි. පිටකයේ ලියවී තිබෙන බැවින් යමක් පිළිගැනීමට කිසිවකුටත් යුතුකමක් නොමැතියි. බුද්ධපරිනිර්වාණයෙන් බොහෝ කලකට පසු ලියැවුණු බෞද්ධ පොත්පත්වල අබෞද්ධ මතයන් අඩංගුවී ඇති බවට කිසිත් සැකයක් නැත. අධර්මය නිතරම ධර්මයේ මුහුණුවරින් ඉදිරිපත්වෙයි. මේවා ගැන මතභේදයක් හටගැනීම සත්‍යය සෙවීමට හේතු වෙනවා ඇත. අද ලක්දිව බෞද්ධ ප්‍රතිපත්තිය නමින් සීලබ්බතපරාමාසය පැතිරී යෑමට හේතුව මේ අබෞද්ධ මතයන් මනුෂ්‍යයන්ගේ සිත්වල පරම්පරා ගණනක පටන් කාවැදී තිබීමයි. අටුවාවල පවා මතභේදයන් ගැන සඳහන්ව් තිබේ. ඒ කාලයේ පටන් ධර්මය පිළිබඳව සැක සහිත නොඑක් අදහස් පැවැති බැව් එයින් පැහැදිලි වෙයි.

පෙර සිට පරම්පරාගතව එන කොයි දෙයටත් අන්ධව ගරු කිරීම දියුණු නොවූ සිතක පවත්නා මූලික දුර්වල කමකි. මේ වහල් බැම්මෙන් නිදහස්වන්නට මනුෂ්‍යයකුට අභ්‍යන්තර දියුණුවක් වුවමනා කෙරේ. පරම්පරාගතව එන පිළිගත යුතුදේ ඇතත්, හැම සිරිතක්ම, හැම මතයක්ම පිළිගත යුතුයයි සිතීම බලවත් මුලාවකි. සත්‍යය පරම්පරාගතව එන දෙයක් නොවේ. අවබෝධය පරම්පරාගතව එන දෙයක් නොවේ. පුරාතන දෙයට ගරුකළ යුතුයයි බොහෝ දෙන කියති. පුරාතනවූ නිසාම යමකට ගරුකළ යුතු බවක් අපට නම් නො වැටහෙයි. "පුරාතන" යන්නෙන් අදහස් කරනු ලබන්නේ කල්ගතවූ, පරණවූ බවයි. අද ජීවත්වන අය කරන දේත් තව අවුරුදු සියයකින් පමණ පරම්පරාගත වෙනවා ඇත; නමුත් මතු කාලයේ ඇතිවන මිනිසුන් විසින් ඒවාත් පිළිගත යුතුද?

පිණ්ඩපාතයේ වඩින්නට සූදානම්ව පාත්‍රය ඉර අව්වට අල්ලා බැලීම පෙර එක්තරා මහා ස්ථවිරයන් වහන්සේ නමකගේ

සිරිතක්ව පැවැත්තේය. උන්වහන්සේගේ ගෝලයෝද මේ සිරිත අනුගමනය කරන්නට පටන්ගත්හ. සත් පරම්පරාවක් යනතුරු මේ සිරිත නොකඩව පැවැත්තේය. මහා ස්ථවිරයන් වහන්සේ පාත්‍රය අවුවට අල්ලා බැලූයේ, පාත්‍රයේ සිදුරක් තිබුණු බැවින්, එය බලා එතැනට ඇඟිල්ල තබා ගැනීමටය. නමුත් ගෝලයෝ ඒ කිසිත් නොදැන, ගුරුවරයා කළ දෙය අනුගමනය කරන්නට පටන් ගත්හ. මෙබඳු හෝ මීට ස්වල්පයක් වෙනස් දේ අප අතර බොහෝය. රජ කාලයේ පටන් පැවැත එන දෙයට බොහෝ අය ගරු කරති. නමුත් ධර්මය අතින් රජුන්ගෙන් ආදර්ශ ගැනීම ප්‍රවේසම් සහිත නොවේ.

මහජනමතය ගැන සැලකියයුතු අවස්ථාවෝද වෙත්. දේශපාලනය, නීතිසම්පාදනය, රැකීරක්ෂා, අයබදු ආදි සාමාන්‍ය කටයුතු සම්බන්ධයෙන් නම් මහජනමතය ගරු කළයුතුම වෙයි. නමුත් ආගමික සත්‍යයක් ප්‍රකාශ කිරීමේදී මහජනමතය සලකන්නට අවකාශයක් නො ලැබේ. මහජනමතය නම් ලෝකයේ වැඩිදෙනාගේ අදහසයි. ලෝකයේ වැඩි පක්ෂය ගුණයෙන්, ඥානයෙන් හීනයඃ ආශාව, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, මානය, අහංකාරය, මුළාව ආදි පාපයන්ගෙන් දැඩිලෙස කිළුටුය. ආගමික උතුම් සත්‍යයක් ප්‍රකාශ කිරීමේදී එබඳු මහජනමතයක් ගැන සිතන්නට යෑම වටිනා මෙහෙයකට බාධාවකි. ලෝකයේ වැඩිදෙන ආලයෙන්, අත්මාශාවෙන් වෙළී, පැටලී සිටින බවත්, එනිසා ඔවුන්ට පවිත්‍ර ධර්මයක් තේරුම්ගත නොහැකි බවත් බුදුරාජණන් වහන්සේට මුලදීම පෙනුණේය. යම්කිසි යහපත් ක්‍රියාවක් කොට, එයින් තමාට නිවනවත් බලාපොරොත්තුවීම ආත්මාශාවයයි කීවිට සාමාන්‍ය මහජනයා කලබල වෙයි. නමුත් පිරිසුදු අදහස් ඇති නුවණැතියන්ට මේ අදහස වටිනා නිධානයකි. වැඩිදෙනාට නොවැටහෙන බැවින්, වැඩිදෙනා එකඟ නොවන බැවින්, නැතහොත් වැඩිදෙනා විරුද්ධ වන බැවින් එබඳු සත්‍යයක් ප්‍රකාශ කළ යුතු නොවේයයි යමකු කියතොත්, ඔහු සත්‍යය කෙරෙහි කිසිත් විශ්වාසයක් නැති සුළු දෙයින් බියවන දුර්වලයෙකැයි අපි යටහත්ව කියමු.

මහජන විරෝධය සහ කැළඹීම ගැන බොහෝ දෙන බියවෙති. මහජන මතයට බියවීමේත් පුද්ගලයකුට බියවීමේත් වැඩි වෙනසක් නැත. මහජන මතයට බියෙන් තමාගේ අවංක අවබෝධයක් එළි කරන්නට මැළිවීම බරපතළ දුර්වලකමකි. ලාභ, ප්‍රයෝජන, කීර්ති, ප්‍රශංසා, බලය සහ අයිතිය මහාජයාගෙන් ලබන්නට බලාපොරොත්තු වන්නා මහාජනයාගේ මතයට වෙනස්ව සිය අවංක අදහස පළ කරන්නට බියවෙයි. නමුත් එසේ බලාපොරොත්තු නොවන්නකුට එයින් කම් කිම?

වැඩිදෙනා පිළිනොගත්, නුපුරුදු අදහසක් ප්‍රකාශ කළ විට, මහාජනයා අතර කැළඹීමක් හටගැනීම නොවැළැක්විය හැකි සිද්ධියකි. එනිසා ඇතැම් විට භයානක, අන්තරායදායක දේ පවා සිදුවන බවට ඉතිහාසය සාක්ෂි දෙයි. හැම ක්‍රියාවකටම අනුව එක්තරා කැළඹීමක්ද හටගනී. ක්‍රියා වේගයේ පමණට කැළඹීම පැතිරෙයි.

බුදුරජාණන් වහන්සේගේ අදහස්වලට එදා සිටි නොඑක් දෙනා විරුද්ධ වූහ. ඔවුහු උන්වහන්සේ මැරීමට නොඑක් කුට උපක්‍රම යෙදූහ: වරක් උන්වහන්සේ විනාශ කරන්නට ගලක් පෙරළූහ: තවත් වරෙක උන්වහන්සේ විද මරන්නට දුනුවායන් යැවූහ: අනෙක් වරෙක රාබී උමතුවූ ඇතකු ලවා පාගවා මරන්නට වෑයම් කළහ. මේ සියල්ලටම වඩා නින්දිත ලෙස ඔවුහු උන්වහන්සේගේ පවිත්‍ර චරිතය කිලුටු කරන්නට තැත් කළහ: උන්වහන්සේට දාව චිංචාවගේ කුසෙහි දරුවකු පිළිසිඳ තිබෙන බැව් කියා ලොව මුළා කරවන්නට, ඇය ලවාම ඒ ප්‍රවෘත්තිය ප්‍රසිද්ධියේ, මහාජනයා මධ්‍යයේ, උන්වහන්සේ ඉදිරියේ කියවූහ. නැවැත වරෙක සුන්දරිකාව මරා, විහාරය අසල සඟවා, "ශ්‍රමණ භවත් ගෞතමයන් විසින් සුන්දරිකාව මරා සඟවන ලද"යි රජුට පැමිණිලි කළහ. චෝදනාව අමූලික බොරුවක් බැව් ආණ්ඩුව තේරුම් ගත් නමුත්, එයින් මහාජනයා අතර හටගත් කැළඹීම නිසා සතියක් පමණ ගතවනතුරු තථාගතයන් වහන්සේටවත් භික්ෂූන් වහන්සේලාට

වත් විහාරයෙන් පිටතට පැමිණීම සතුටුදායක නොවන බැව් පෙනුණේය. බුදුරජාණන් වහන්සේ හැමදෙනම පිළිගත් සාමාන්‍ය වැඩ පිළිවෙළක යෙදුණුසේක් නම්, රටේ මෙබඳු භයානක කැළඹීමක් ඇති වන්නට කිසිත් යුතුකමක් නැත.

ක්‍රිස්තුස් වහන්සේගේ අදහස් නිසා කැළඹුණු එදා වුසූ යුදෙව් නායක පූජකයෝ උන්වහන්සේ අල්වා කුරුසියේ ඇනගසා මැර වූහ. මහම්මත් තුමාගේ අදහස් ගැන එතුමාගේම සුළුපියා කිපී පිහියකුත් රැගෙන එතුමා මරන්නට පැමිණි නමුත් එය සඵල නොවීය. ග්‍රීසියේ මහාජනයා අතර පැවැති දේවවිශ්වාසයන්ට විරුද්ධව දේශනා කළ ශ්‍රේෂ්ඨ සෝක්‍රටීස් ආණ්ඩුව මගින් අල්වා සිරකොට වස පොවා මරන ලදී. අතිදීර්ඝ කාලයක පටන් ඉන්දියාවේ පිරිහීමට හේතුව පවත්නා පංචම භේදය නැති කරන්නට වීර්ය කරන මහාත්මා ගාන්ධිගේ ජීවිතය විනාශ කරන්නට පවා විරුද්ධකාරයෝ පෙළඹී සිටිත්. මේ නොබෝදා එතුමා මරන්නට වෙඩි බෝම්බයක් හෙළන ලද නමුත්, සාහසිකයන්ගේ අදහස සඵල නොවීම ලෝකයේ භාග්‍යයයි. මෙයින් වර්ෂ ගණනකට පෙරද එතුමා ඉන්දියාවේ සතුරෙකැයි වරදවා තේරුම්ගත් මනුෂ්‍යයෙක් එතුමාට පිහියෙන් ඇන මරන්නට සූදානම්ව සිටියේය. (මේ ලිපිය පළකොට අවුරුදු 13 කට පසු සාහසිකයෙකු විසින් එතුමා ඝාතනය කරන ලදී.) ඉතිහාසයේ මුල පටන් අග දක්වා මෙබඳු බොහෝ සිද්ධීහු දක්නා ලැබෙත්.

ගලක ශාන්තගතියක් දක්නා ලැබේ. මළ මිනියක තැන්පත් කමක් දක්නා ලැබේ. නමුත් ඒ ශාන්තගතියවත් තැන්පත්කමවත් කුමටද? නිදනවිට කලබලයක් නැත. පුද්ගලයකු මෙන්ම නගරයක්, රටක් නිදනවිටද, ඒ නගරයේම, රටේම කිසි කලබලයක් නැත. ගෙවල් බිඳින්නෝ ඔවුන් එසේ නිදනවාට කැමැති වෙත්. පිබිදුණු විට කැළඹීමක් ඇති වෙයි. ඒ කැළඹීම කටයුතුවල යෙදීමෙන් හටගන්නා කැළඹීමකි. ඒ කැළඹීමට යමෙක් බිය වෙයිනම්, ඔහු මැරෙන තුරු, කටයුතු නොකොට, නොනැගිට නිදිය යුතුයි.

නින්දෙන් පුබුදු කරනුවට අලසයා නො කැමතිය: පුබුදු කරන්නා සමග හෙතෙමේ කිපෙයි. ශරීරයේ නින්දට වඩා සිතේ නින්ද බලවත්ය. එසේම ශරීරයේ නින්දෙන් නැගුටුවනුවට වඩා සිතේ නින්දෙන් නැගිටවීම දුෂ්කරය. සිතීමට අකමැති, සිතින් නිදන අලසයා එම නින්දෙන් ඔහු පුබුදුවන්නට වෑයම් කරන්නා සමග කිපෙයි. නමුත් ඔහුගේ කිපීම ගණන් නොගෙන ඒ නින්දෙන් ඔහු නැගිටවීම ඔහුට කරන විශාල යහපතකි. නොඑක් මත ඇසීමෙන් මහජනයා කලබලවී මුළාවේ වැටෙතැයි සමහරුන් බියවන්නේ මේ පිබිදීමටය. අඳුරේ සිටින්නාට ආලෝකය ලැබුණු විට නැගී සිට ක්‍රියා කරයි.

ධර්මය සෙවීම අතින්, විවේචනය අතින් ලක්දිව ඉතාම කනගාටුදායක තත්ත්වයක පවතී. ඉතාම උසස් පණ්ඩිතයාගේ පටන් සාමාන්‍ය නූගත් රටවැසියා දක්වා කවුරුත් පාහේ පරම්පරාගතව පුරුදුව එන දෙයටත්, පොත්පත්වල කියවන්නට ලැබෙන දෙයටත් සාධුකාර දෙමින්, සත්‍යය කුමක් වුවත් තමාට පාඩු නොවන්නට වැඩ යොදාගෙන නිදිමතේ කල්ගත කරති. පරම්පරාවේ එන කොයි සිරිතත්, කටයුත්තත් මේ පින්වතුන්ට උතුම්ය: පාලි පොත්වල තිබෙන මොන අදහසත් මේ භවතුන්ට බුදුබණය. අපේ සිරිත් විරිතුත් වැඩපිළිවෙළත්, අදහසුත් උතුම් නම්, පවිත්‍ර නම්, ධර්මානුකූල නම්, අපේ දියුණුව මෙතරම් පහත් තත්ත්වයක පවත්තේ මන්දැයි ඒ භවත්හු සිතන්නට නොවෙහෙසති. පරණ පටන් පුරුදුව එන කිසිත් සිරිතක් හෝ අදහසක් වෙනස් කොට, එය ඊට වඩා හොඳ එකකට මාරු කරන්නට තරම් ශක්තියක් ඔවුන්ට නැත. දියුණුව හෝ පිරිහීම එක අඩියක සිටීම නොව පරිවර්තනයවීමයි: හොඳ අතට පරිවර්තනය දියුණුවයි, නරක අතට පරිවර්තනය පිරිහීමයි. අවුරුදු සිය ගණනකට පෙර සෑදූ කරත්තයට වඩා අද සෑදූ කරත්තයේ ලී කැබැල්ලකින් වත් වෙනසක් දක්නා නොලැබේ. ගුරුවරයා සිතූ ක්‍රමයට වෙනස්ව සිතන්නට ගෝලයා බිය වෙයි.

නොඑක් පළාත්වල අප විසින් පවත්වන ලද දේශනාවන්ද, පළකරන ලද ලියමන්ද බෞද්ධයන් අතර ප්‍රබෝධයක්, ඇතැමුන්

කියන පරිදි "කැළඹීමක්" හටගැනීමට හේතුවී තිබෙන බැව් පෙනේ. මෙය නම් සැබැවින්ම සතුටුදායක ආරංචියකි. කැළඹීමකින්, විප්ලවයකින් තොරව කිසිත් යහපතක් සිදුවී නැත. එය අනිවාර්ය දෙයකි.

අපේ අදහස් අපෙන්ම නො අසා, අප ආශ්‍රය නො කොට, වැරදි ආරංචිලින් නොමග ගොස්, කරුණු වරදවා තේරුම්ගත් ඇතැම් අය නො නිසි ලෙස කථා කිරීම කනගාටු දායකයි. අපි කවුරුත් ධර්මය පිහිටුවන්නට අවංක හිතින් වෑයම් කරන්නෙමු. අපේ යම්කිසි අදහසක් වැරැදි බැව් අපට වැටහෙනපරිදි ශිෂ්ට අන්දමින්, කරුණු සහිතව යමකු පහදා දුනහොත්, එය නමස්කාර පෙරදැරිව පිළිගන්නට ඉතා යටහත්ව අපි නිතර සැදීපැදී සිටිමු. "අසවල් පොතේ මෙසේ කියා තිබෙන්නේ ඇයි? අසවල් උත්තමයන් මෙය පුරුදු කරගෙන ආවේ ඇයි?" කියා ඇසීම ඉතාම දුර්වල, ප්‍රඥාගෝචර නොවූ ප්‍රශ්නයකි. අන්‍යයාගේ මතය තමාගේ මතයට වෙනස්වූ බැවින්, යමෙක් සිතේ නො මනාපයක් ඇති කර ගනියි නම්, එය ධර්මයෙන් පිළියම් කටයුතු බලවත් චිත්ත රෝගයකි.

අපේ හැම අදහසක්ම පිළිගත යුතුය කියාවත්, ඒවායේ යම් යම් අඩුපාඩුකම් නැත කියාවත් අපි කිසි විටෙකත් නොකියමු. දැනටනම් මේ අදහස් සත්‍ය බැව් අපට පෙනේ. නමුත් කල්යාමේදී අවබෝධය වෙනස් වන්නට බැරි කමක් නැත. කලකට පෙර අප ඉතා හරි හැටියට සැලකූ ඇතැම් අදහස් අද එතරම් හරි නැති බැව් අපට පෙනේ. තවත් කල්ගතවන විට, දැන් පවත්නා අදහස්වලට වඩා උතුම් අදහස් වැටහීමෙන් මේ අදහස් වෙනස් වන්නටද බැරි කමක් නැත. තමාගේ අදහසම හරි බවත්, අන්‍යයාගේ අදහස වැරැදි බවත් ඔප්පු කරන්නට තැත්කිරීම සත්‍යය ගරු කරන්නාන්ගේ සිරිත නොවේ. සත්‍යය කිසිවකුගේ පුද්ගලික අයිතියක් නොව හැමටම සාධාරණ වූවකි. අප ඉගෙන ගත්, පිළිගත් දෙයට හාත්පසින්ම විරුද්ධවූවක් සත්‍ය වීමටද බැරිකමක් නැත. අපට වුවමනා කරන්නේ දැනට හැම එකටම 'එහෙයි' කියන්නාවුන් සත්‍යය සෙවීමට, විවේචනයට, සිතිවිල්ලට යොමු කිරීමයි.

# ප්‍රශ්න සහ උත්තර

(පිළිතුරු බලාපොරොත්තුවෙන් නොඑක් දෙනා විසින් අප වෙත එවන ලද ප්‍රශ්න බොහෝය. ඉන් සමහරක් මෙබඳු ප්‍රසිද්ධ පිළිතුරක් ලැබීමට තරම් යෝග්‍ය නොවන බැව් කනගාටුවෙන් සඳහන් කරන්නට සිදුවී තිබේ. එනිසා අසන ලද හැම ප්‍රශ්නයකටම පිළිතුරු දීම අපට අනභිමතය. මෙහි දැක්වෙන ප්‍රශ්නයන් අතුරෙන් සමහරක් තැපැල් මගින්ද, සමහරක් ධර්මදේශනාවලදීද, තවත් සමහරක් පුද්ගලිකවද අසන ලද ඒවා වෙති. ව්‍යාකූලවූ භාෂාවෙන් දීර්ඝ ලෙස අසනලද ඇතැම් ප්‍රශ්නයන්, ඒවායේ අදහසට හානියක් නොවන පරදි, නිරවුල් භාෂාවට පෙරළා, කෙටියෙන් යොදන ලද බැව් සැලකිය යුතුයි. ප්‍රශ්න කරුවන්ගේ නම් ප්‍රසිද්ධ කිරීම අවශ්‍යයයි නොයිතේ.)

ප්‍ර: සත්‍යෝදය පත්‍රිකා අංක 4 තුන්වෙනි පිටේ, "ලෝකයෙහි උසස් යයි සම්මත කුලයක උපන් තැනැත්තේ ජාති කුලපුත්‍රයි" යනු සඳහන් වෙයි. මේ කීමෙන් හැඟෙන්නේ ලෝකයෙහි උසස්යයි සම්මත කුල ඇති බවයි. එසේ නම් එම සම්මතය ඔබ වහන්සේ භාර ගන්නේ ද? උසස්යයි සම්මත කුලයක නමක් කියන්නට පුළුවන් ද?

උ: ඇතැම් කුල උසස්ය යන සම්මතයක් ලෝකයා අතර පවත්නා බැව් රහසක් නොවේ. එබඳු සම්මතයක් නැතැයි කිසිවකුටත් කිය නොහැක. නමුත් ඒ සම්මතය යුක්ති සහගතයයි අපි භාර නොගනිමු. බ්‍රාහ්මණ වංශය උසස් කුලයක් හැටියට සම්මතය. නමුත් ඒ සම්මතය ධර්මානුකූලයයි අපි පිළිනොගනිමු. බ්‍රාහ්මණයා හෝ චණ්ඩාලයා වන්නේ ක්‍රියාවෙන් මිස උත්පත්තියෙන් නොවේ. ලෝකයාගේ සම්මතය එකකි. අපේ පිළිගැනීම අනෙකකි. එය නො වරදවා, නිරවුල්ව තේරුම් ගත යුතුයි.

* * *

ප්‍රः සමහර පළාත්වල බෞද්ධයෝ බුද්ධ ප්‍රතිමා වහන්සේලා වස්වසවා ගෙන උපස්ථාන කරති. මේ ගැන ඔබ වහන්සේගේ අදහස කුමක්ද?

උः මෙය අමුතුවෙන් ඇසිය යුතු තරම් ප්‍රශ්නයක්ද නොවේ. වස් වැසීමේ අදහස තේරුම් ගත් විට, පහසුවෙන් මේ ප්‍රශ්නය තමන්ටම විසඳාගත හැක..

බුදුරජාණන් වහන්සේගේ කාලයේ භික්ෂූන් වහන්සේලා, අද වාගේ, එක තැනක පදිංචිව නොසිටියාහ. අවුරුද්දෙන් අට මාසයක්ම උන්වහන්සේලා ලෝකයාට වැඩ පිණිස ගමින් ගමට චාරිකාවේ හැසුරුණාහ. ඉන්දියාවේ ඍතුභේදය ලංකාවේ මෙන් නොවේ. එහි වැසි හාරමස තුළ තදින්ම වර්ෂාව පවතී. මේ හාරමස තුළ චාරිකාවේ හැසිරීම භික්ෂූන් වහන්සේලාට අතිශයින් දුෂ්කර වැඩකි. අට මාසයක් තැනින් තැන හැසිරෙමින් මහන්සියෙන් කටයුතුවල යෙදුණු භික්ෂූන්ගේ විවේකයත් සනීපයත් සඳහා මේ හාර මාසය මුළු අවුරුද්දෙන්ම යෝග්‍ය කාලය බැව් බුදුරජාණන් වහන්සේ තේරුම් ගත්සේක. වර්ෂා කාලයේ රටේ ඇවිදීම, විශේෂයෙන්ම පැවිද්දන්ට, අමනෝඥ ක්‍රියාවක් හැටියට ඉන්දියාවේ මහාජනයා අතර පිළිගැනීමක්ද තිබුණේය. අලුත් වැස්සෙන් පණ ලැබ වැඩීගෙන එන තෘණ සහ ධාන්‍ය පැල, සිය ගණන් භික්ෂු සමූහයා ගමන් කරනවිට පයට පෑගී විනාශවන බැවින් රටවැසියෝද ඊට තදින්ම දොස්නැගූහ. යන්ත්‍ර සූත්‍රවලින් රෙදි වියන අද මෙන් නොව, අතින් නූල් කැට අතින්ම රෙදිවියූ එදා වස්ත්‍රය ඉතා අගනා වස්තුවකි. එනිසාම භික්ෂූන්ටද සිවුරු සුලභ නොවීය. ඇතැම් භික්ෂූහු තද වැස්සෙන් තෙමී, දිය පෙරෙන සිවුරු ඇතිව විහාරයට අවුත්, මාරු කරන්නට වෙන සිවුරක් නැති බැවින්, ඒ තෙත සිවුරු පිටින්ම දවස ගත කරති. එය ශරීර සනීපයට බාධකය. මේ ආදි කරුණු මහත් රාශියක් නිසා වස්සාන කාලය තුළ එක තැනක නතරව සිටින්නට භික්ෂූන්ට නියම කළසේක. බුදුරජාණන් වහන්සේද වස්සාන කාලයේ චාරිකාවේ

හැසිරීම නතරකොට එක තැනක වැඩවිසීම සිරිතක් විය. ආරණ්‍යයන්හි වසන භික්ෂූහුද මේකාලයේ වනයෙහි දවස් යැවීම අපහසු බැවින් ගම්වලට වඩිති. වස් වැසීමේ අදහස කුමක්දැයි දැන් වැටහෙනවා ඇත. ඉතින් බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් වස්වසවාගෙන උපස්ථාන කිරීම නුවණැතියන් හිනස්සන ක්‍රියාවක් බැව් කාට වුවත් තේරුම් ගැනීම අපහසු නොවේ.

බුද්ධ ප්‍රතිමාවක් වස්වැසවීම තබා, අද ලක්දිව පවත්නා තත්ත්වයේ හැටියට, භික්ෂූන් වහන්සේලාගේ වස් වැසීමවත් අවශ්‍ය නුවණට හුරු වැඩකැයි මටනම් නොවැටහේ: පන්සලේ ඔප්පුව භික්ෂූන් වහන්සේ නමටය: නැතහොත් පන්සල ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් ඒ භික්ෂුවට අයත් වූවකි: එය ගොඩනගන ලද්දේ භික්ෂුවගේ බලවත් මහන්සියෙනි: මුළු අවුරුද්දම ඒ භික්ෂුවගේ පදිංචිය මේ පන්සලේය: පිටතකට ගොස් සතියක් ගත කළොත් ඒ ඉතාම අමාරුවෙනි: ස්ථානයට අයත් සියල්ලම ඒ භික්ෂුවගේ බුදලය වෙයි: නඩුවක් කියාවත් ඒ භික්ෂුව එතනින් ඉවත් කරන්නට පුළුවන් කමක් නැත: මරණින් පසුව හෝ ඒ භික්ෂුව පන්සල හැර යනවා ඇතැයි සිතීම උගහටය. නමුත් වර්ෂයකට වරක් දායකයෝ පන්සලට අවුත් දැහැත් අතක් පිළිගන්වා, "ස්වාමීනි, මේ හාරමාසය මෙහි වස්වසනු මැනැවැ"යි ඒ භික්ෂූන් වහන්සේට ආරාධනා කරති. මීට වඩා ලොකු වෙනත් කවට කමක් කළ හැකි ද? ලක්දිව ඍතු භේදයක් නැතැයි කිව යුතුය. මේ රටේ වස්සාන කාලයෙහි අනෙක් මාසවලට වඩා වර්ෂාව අධික බවක් නොපෙනේ. ඇත්ත වශයෙන් එය මේ රටේ ග්‍රීෂ්ම කාලයයි. අතරින් පතර වර්ෂාව පවත්නා බවද ඇත්තකි. මෙසේ දේශගුණය අතින් බලන විට ද ලක්දිව වස්විසීම අවශ්‍ය වැඩක් හැටියට නොපෙනේ. දැනට එය තේරුම් නො ගෙන පුරුද්දට කරන චාරිත්‍රයක් මිස, සැලකිය යුතු කිසිත් අදහසක් නැත. නුවණින් තොරවූ චාරිත්‍රය කුමක් වුවත් හිස් දෙයකි.

* * *

ප්‍ර: බොහෝ බෞද්ධ ගෘහයන්හිත් ආපනශාලාවලත් සීවලී මහ රහතන් වහන්සේගේ රූපය තබාගෙන, ඒ ළඟ පහනක් දල්වති. එහි අදහස කුමක්ද?

උ: ලාභ ප්‍රයෝජන ලැබීමේ අදහසයි. සීවලී මහරහතන් වහන්සේ ප්‍රත්‍යය ලාභීන්ගෙන් අග්‍රය. උන්වහන්සේගේ රූපය ගෙදර හෝ වෙළෙඳ ශාලාවේ තබාගත හොත් තමන්ටත් ලාභ වැඩිවෙනවා ඇතැයි බොහෝ දෙන ආශාවෙන් මුළාවෙති. එහි උත්තමයකුට ගරු කිරීමේ අදහසක් නැත. සිවලී මහරහතන් වහන්සේට වඩා සැලකිය යුතු අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේගේ රූපය කවුරුවත් තබා නොගනිති. උන්වහන්සේගෙන් වෙළෙඳාමට උදව්වක් ලැබේයයි නොසිතන හෙයිනි.

*  *  *

ප්‍ර: මහණකිරීම් ආදි ශාසනික වැඩවලදී නැකැත් බැලීම යෝග්‍යද?

උ: සැබැවින්ම නැත. නැකැත් බැලීම අශාසනික තිරශ්චීන විද්‍යාවකි. එය බුද්ධ වචනයට කරන නින්දාවකි.

"නක්ඛත්තං පතිමානෙන්තං, අත්ථො බාලං උපච්චගා:
අත්ථො අත්ථස්ස නක්ඛත්තං, කිං කරිස්සන්ති තාරකා?"

"නැකැත් ගරු කරන මෝඩයාගේ වැඩ අතපසු වී යයි. වැඩයට නැකත තම් වැඩ කිරීමයි. තාරකාවෝ කුමක් කෙරෙද්ද?"

බුද්ධ ශාසනයේ අදහස හරිහැටි තේරුම් නො ගත්, ආත්මශක්තියක්, ආත්මවිශ්වාසයක් නැති, අභ්‍යන්තර දියුණුවෙන් අඩු භික්ෂූහු මහණ උපසපන් කිරීම්, ප්‍රතිමා, විහාර, දාගැබ් තැනීම් ආදියේදී නැකැත් බලන්නට පටන්ගත්හ. "උග්ගණ්හාථ භික්ඛවෙ නක්ඛත්තං" යී විනයෙහි නැකැත් ඉගෙනීමට නියමයක්ද තිබේ. ඒ පොහෝ පවුරුණු සම්බන්ධ දිනයන් දැන ගැනීම පිණිස මිස අනෙක් වැඩට නැකැත් බලන්නට නොවේ.

*  *  *

ප්‍ර: පෝය දිනයන්හි කරන පිනක හෝ පවක වෙන දිනයන්හිට වඩා විපාක වැඩිවේද?

උ: නැත: පෝය නම් චන්ද්‍රයාගේ වෙනස්වීමේ හැටියට ඒ ඒ දිනයන්ට සාදාගත් නමකි. පින හා එහි කිසිත් සම්බන්ධයක් නැත. පෝය දිනය බෞද්ධයාට විශේෂ වූවක් නොවේ. එය පුරාණ කාලයේ පටන් හින්දූන්ගේ උතුම් දිනයකි. "සිත හොඳ මිනිහාට හැමදාම පොහොය වේ." සුද්ධස්සුපොසථො සදා.

ප්‍ර: -සංඝයා වහන්සේලා දස නමකගෙන් එකම ධර්මය දස විදියකින් ඇසීමි. මෙසේ එකම ධර්මය දසවිදිකින් කීවිට මෝඩ ජනයා කෙසේ වටහා ගනිත්ද?

උ: ඒ සංඝයා වහන්සේලා දසනම තබා තවත් දසනමක් ඒ ධර්මය එක විධියටම කීවද, මෝඩ ජනයාට එය නොවැටහේ. වැඩි දෙනෙකුන් එක විදියටම එකක් කීවිට, ඒ කීම නිසා, 'එය එසේ වෙන්ට ඇතැ'යි මෝඩ ජනයාගේ රැවටීමක් ඇතිවේ. නමුත් එය අවබෝධයක් නොවේ. අන්‍යයන් කුමක් කීවත් එයින් කම් කිම? තමාගේ නුවණින් තේරුම් ගත යුතුයි. තේරුම් ගැනීමට තරම් නුවණ නොමැතිනම්, ඒ ගැන අනුකම්පා කරනු මිස කුමක් කළහැකි ද? ධර්මය නුවණැතියන්ට මිස නුවණ නැතියන්ට නොවේ.

ප්‍ර: කඨිනං ච, පරික්ඛාරං, වාසදානං ච උත්තමං,
බුද්ධප්පමුඛසංඝස්ස දානං, ධම්මස්ස ලෙඛනං,
ඛෙත්තදානං ච, බුද්ධස්ස පටිමාකරණංමපිච,
කරණං චච්චකුටියා, අට්ඨපුඤ්ඤානි වුච්චරෙ.
මේවා අටමහ කුසල් හැටියට ප්‍රසිද්ධය. මේගැන ඔබවහන්සේගේ අදහස කුමක්ද?

උ: මා සිතන හැටියට මෙයද ලාභ ප්‍රයෝජන ලැබීමට යොදන ලද ප්‍රයෝගයෙකි. 1. කඨිනදීම, 2. (අට) පිරිකර දීම, 3.

ආවාස දානය, 4. බුදුන් ප්‍රධාන සංඝයාට දන්දීම, 5. බණ පොත් ලියවීම, 6. කුඹුරුදීම, 7. බුද්ධ ප්‍රතිමා සෑදීම, 8. වැසිකිළි සෑදීම යන මේවා අටමහකුසල් බැව් මේ ගාථාවලින් ප්‍රකාශ වෙයි. නමුත් මේ එකක්වත් එතරම් සැලකිය යුතු නොවේ. මේවා පින්සිදුවන ක්‍රියා හැටියට පිළිගතහැකි වුවත් මහකුසල්යයි කීමට යුතු කමක් නැත. මේ සියල්ලමත් එක සිල්පදයක් රැකීම තරම් නොවටී. මේ ගාථාවේ හැම පදයකින්ම වාගේ භික්ෂූන්ට ලාභයක් සැලසෙන්නට වැඩ පිළියෙල කරනු ලැබේ. මේවායේ ආනිසංසද මුවනොසෑහෙන පරිදි භික්ෂූහු වර්ණනා කරති. මේ වැඩ පිළිවෙල නිසා මනුෂ්‍යයෝ අභ්‍යන්තර ධර්මයන්ගෙන් බොහෝ ඈත්වී සිටිති. වීර්යය, අධිෂ්ඨානය, සත්‍යය, ක්ෂාන්තිය, මෛත්‍රිය, ප්‍රඥාව ආදි ශ්‍රේෂ්ඨ ගුණයන් ගැන කිසිත් නො සලකා, බාහිර දේම බුද්ධාගම කොට සලකන්නට බොහෝ අයට පුරුදුවී තිබෙන්නේ මෙබඳු ඉගැන්වීම් නිසාය.

ප්‍ර: *නිවන් ලැබීමට බුද්ධාගම්කාර නමින් පෙනී සිටින්ට වුවමනාද? තිසරණ සමාදන්වන කවුරුත් බෞද්ධයෝද?*

උ: නැත. නිවනට හේතුවන්නේ බුද්ධාගම්කාර නම නොව බුද්ධාගම්කාර කමයි. හිතින් නොව, වචනයෙන් තිසරණ සමාදනන්වූ පමණින් තබා, සිවුරු පෙරවා ගත් පමණින්වත් බෞද්ධයෙක් නොවේ. බුද්ධාගම්කාර ලේබලය ගසාගත් මිථ්‍යාදෘෂ්ටිහු බොහෝ වෙති. කුරුසිය එල්වා ගත් අය අතරද, වෙනත් නොඑක් නමින් පෙනී සිටින්නන් අතරද හැබෑ බෞද්ධයන් ඇතිවීමට කිසිත් බාධාවක් නැත. සෑහෙන පමණට හිතේ, ප්‍රඥාවේ පවිත්‍රතාව ඇතිවීනම්, නිවන් දැකීමට කිසිම ආගමක නමක් කොහෙත්ම වුවමනා නැත.

මිත්‍රයෙක් මෙ බඳු යෝජනාවක් කරයි :-

"ආහාරය වුවමනා කරන, එයින් ප්‍රයෝජනය ගත හැකි, ජීවත්ව සිටින අයට ආහාර දීමට වඩා, ආහාරයකින්

කිසිත් ප්‍රයෝජනයක් නැති බුද්ධප්‍රතිමාවකට ආහාර පිදීම වටිනා ආනිසංසදායක වැඩකැයි සමහරු කියති. එසේ නම්, සම්පූර්ණ අභ්‍යන්තර පාරිශුද්ධිකයක් නැති, පිරිසුදු ලෙස සිල් නොරකින, භික්ෂූන්ට දන්දීමට වඩා, සැරියුත් මුගලන් ආදි මහරහතන් වහන්සේලාගේ ප්‍රතිමා සාදවා ඒවාට සාංඝික වශයෙන් දන්දීම වටිනා ආනිසංස දායක ක්‍රියාවක් නොවන්නේද?"

(මේ යෝජනාවට භික්ෂූන්වහන්සේලා විරුද්ධ වනු නොඅනුමානයි! සබරගමු පළාතේ එක්තරා ගමක මෙබඳු දානයක් දුන් බැව් ආරංචියෙන් දනිමි. සැරියුත්, මුගලන් ආදි මහරහතන් වහන්සේලාගේ නම් ලියූ කඩදාසි කැබැලි ආසනවල තබා, ඒ මතුයෙහි අහර තබා, වාක්‍යය කියා, දන් පිළිගන්වන ලදී. නමුත් ඒ පළාතේ භික්ෂූහු මීට විරුද්ධව තදින්ම ක්‍රියා කළහ.)

අෂ්ටාර්‍යපුද්ගල මහාසංඝරත්නයට ගිහි පැවිදි දෙපක්ෂයම අයත් බවත්, මේ රහස තේරුම් නොගැනීමෙන් ගිහියන් බුදුසසුන රැකීම භික්ෂූන්ට භාරදී, භික්ෂූන්ගේ වරදට බැන වදිමින්, තමන් ගුණ ධර්මයෙන් පිරිහී සිටින බවත්, නමුත් බුදු සසුන රැකීම භික්ෂූන්ට මෙන් ගිහියන්ටත් සම්පූර්ණයෙන්ම අයත් යුතුකමක් බවත් සංඝරත්නය හා සාංඝිකය නම් මීළඟ පත්‍රිකාවේදී විස්තර කරනු ලැබේ.

# 7

# සංඝරත්නය හා සාංඝිකය

කියවන්නා : අෂ්ටාර්ය පුද්ගල මහාසංඝරත්නයට ගිහි පැවිදි දෙපක්ෂයම අයත් බැව් ඔබ කියන්නෙහිය. මෙය අපට තේරුම් ගත නොහැකි කථාවකි. සංඝරත්නය නම් භික්ෂුපක්ෂය බවත්, භික්ෂූන්ගෙන් තොරව බුද්ධශාසනයක් නො පවත්නා බවත්, චීවරය නැති දා බුද්ධශාසනය නැති බවත් සාමාන්‍යයෙන් ගිහි පැවිදි කාගේත් පිළිගැනීමයි. ඔබගේ අදහස මේ පිළිගැනීමට හාත්පසින්ම විරුද්ධය. මෙය විප්ලවයකි. කරුණාකර ඔබගේ අදහස අපිට පැහැදිලි කර දෙන්නෙහිද?

කර්තෘ : ඔව්, එය මම පැහැදිලි කර දෙන්නට වෑයම් කරමි. 'සංඝ' යන වචනය කියවෙනුවත් සමගම 'භික්ෂුපක්ෂය' යි තේරුම් ගන්නට පුරුදුව සිටින බොහෝ දෙනාට මෙය අලුත්ම අදහසක් බැව් මම දනිමි. මේ ගැන දීර්ඝ සාකච්ඡාවක් කරන තුරු මගේ අදහස පැහැදිලි නොවෙයි. 'සංඝරත්නය නම් භික්ෂූන් වහන්සේලාය, භික්ෂූන්ගෙන් තොරව බුද්ධශාසනය නො පවත්නේය, චීවරය නැති දා බුද්ධශාසනය කෙළවරය.' යනාදි වැරදි අදහස් රාශියක් නිසා මනුෂ්‍යයෝ ධර්මයෙන් ඈත්ව වෙසෙති. ගිහියෝ බුද්ධශාසනය රැකීම භික්ෂූන්ට භාරදී, භික්ෂූන්ගේ දොස් සොයමින් තමන්ගේ ගුණ දහම් ගැන කිසිත් නොසලකා සිටිති. භික්ෂූහුද අභ්‍යන්තර සාරයක් ඇතත් නැතත්, 'සංඝරත්නය නම් අපිය, අපෙන් තොරව බුද්ධශාසනයක් පවත්නේ කොහිද?' යනාදීන් ගිහියන් බිය ගත්වාගෙන ජීවත් වෙති. මේ පිළිබඳ සත්‍යය මම ඔබට පහදා දෙන්නෙමි.

බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය අතුරින් මා කථා කරන්නට යන්නේ සංඝ රත්නය-ශ්‍රාවක සංඝරත්නය-අෂ්ටාර්ය පුද්ගල මහාසංඝරත්නය ගැනයි. සංඝරත්නය ගණිනු ලබන්නේ ගුණයෙන් මිස ඇඳුමින් නොවේ. ඇඳුම කුමක් වුවත් ගුණයෙන් යුත් පුද්ගලයා ශ්‍රාවක සංඝරත්නයෙහි අන්තර්ගත වෙයි. සෝවාන්මාර්ගය, සෝවාන්ඵලය, සකෘදාගාමිමාර්ගය, සකෘදාගාමිඵලය, අනාගාමිමාර්ගය, අනාගාමිඵලය, අර්හත්මාර්ගය, අර්හත්ඵලය යන මේ අට අවස්ථාවන්හි සිටි පුද්ගලයෝ අෂ්ට-ආර්ය-පුද්ගලයෝයි. මේ අට දෙන සංඝරත්නයයි. පුද්ගලයා ගිහි වුවත් පැවිදි වුවත් මෙහිදී එයින් කම් නැත. ගණිනු ලබන්නේ ගුණය පමණකි. "සංඝං සරණං ගච්ඡාමි" යි අප සරණ යන්නේ මේ ගුණයන්හි පිහිටි පුද්ගල සමූහයා මිස විශේෂ ඇඳුමකින් පෙනී සිටින පක්ෂයක් නොවේ. "සුපටිපන්නෝ භගවතෝ සාවකසංඝො" යනාදි පාඨයෙහි සංඝරත්නය ගැන ඉතාම පිරිසිදු විස්තරයක් සඳහන් වෙයි. එහි අදහස මෙසේ යි:

> "භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකසංඝයා යහපත් මාර්ගයෙහි ගමන් කරන්නෝය, ඍජු මාර්ගයෙහි ගමන් කරන්නෝය, ආර්ය මාර්ගයෙහි ගමන් කරන්නෝය, සුදුසු මාර්ගයෙහි ගමන් කරන්නෝය. ඒ කවරහුද? යම් පුරුෂ යුග සතරෙක්, යම් ශ්‍රේෂ්ඨ පුරුෂයෝ අට දෙනෙක් වෙත්ද, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා නම් ඔවුහුය. දුර බැහැරින්, නන් දෙසින් අවුත් කරන සත්කාර ලැබීමටත්, සියලු දෙනාගේ පූජාවන් සහ වන්දනාවන් ලැබීමටත්, ඔවුහු සුදුස්සෝය. ලෝකයට අසහාය පින්කෙත්ය."

මෙහිදී සංඝරත්නයේ ඇඳුම්, පැළඳුම් ගැන කිසිත් කථාවක් නැත. කියැවෙන්නේ අභ්‍යන්තර ගුණය පමණෙකි. සංඝරත්නය ගැන තවත් වටිනා විස්තරයක් රතන සූත්‍රයේදී ප්‍රකාශ වෙයි:

"සත්පුරුෂයන් විසින් පසස්නා ලද යම්කිසි පුද්ගලයෝ අට දෙනෙක්, යම්කිසි පුරුෂ යුග සතරෙක් වෙත්ද, සුගතයන් වහන්සේගේ ශ්‍රාවකවූ ඔවුහු පූජාවට සුදුස්සෝය: ඔවුන්ට දුන් දෙය මහත්ඵල වෙයි. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි."

"යම් කෙනෙක් යහපත් ජීවිතයෙන් යුක්තව, ස්ථිර සිතින්, කාය ජීවිතයන්හි අනපේක්ෂකව, ගෞතම බුද්ධශාසනයෙහි යෙදෙත්ද, පැමිණිය යුතු අවස්ථාවට පත් ඔවුහු අමෘතය ලබා, කිසිත් වියදමක් නැතිව, නිවන් සුව විඳිමින් වෙසෙති. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි."

"පෘථිවියෙහි සිටුවන ලද ඉන්ද්‍රඛීලය සතර දිගින් හමන වාතයෙන් යම් සේ අකම්පිතව සිටීද, ආර්යසත්‍යයන් නුවණින් දුටු සත්පුරුෂයාද ඊට සමානයයි මම කියමි. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි."

"ගැඹුරු නුවණින් මොනවට දෙසෙන ලද ආර්යසත්‍යයන් යම් කෙනෙක් පැහැදිලිව දකිත්ද, ඔවුහු, කොතරම් පමා වුවද, අටවන භවයක් නම් නොගනිති. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි.

"සත්‍යාවබෝධයත් සමගම, සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස යන මේ ධර්මයෝ තුන් දෙන ඔහු කෙරෙන් දුරුවෙත්. හෙතෙමේ සතර අපායෙන් මිදුණේ වෙයි, බරපතළ වැරැදි සය කිරීමෙහි අපොහොසත් වෙයි. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි."

"ශරීරයෙන්, වචනයෙන් හෝ සිතින් යම්කිසි පවක් කළද, හෙතෙමේ එය නොසඟවන්නේය. නිවන් අවබෝධ කළ පුද්ගලයකුට එසේ පාපය සැඟවිය නොහැකි බැවිනි. මෙයද සංඝයාගේ ශ්‍රේෂ්ඨ ගුණයෙකි."

මේ කිසි තැනකදී සංඝරත්නය ගුණයෙන් මිස ඇඳුමින් හඳුන්වනු නොලැබේ. මෙහි සිවුරු පෙරවීම හෝ හිස බෑම ගැන කිසිත් සඳහන්ව නැත. යම්කිසි ගිහියෙක් හෝ පැවිද්දෙක් ආර්යමාර්ගයෙහි ගමන් කෙරේනම්, නිවන් දකීනම්, හෙතෙමේ අෂ්ටාර්ය පුද්ගල මහාසංඝරත්නයෙහි අන්තර්ගත වෙයි. එය අභ්‍යන්තර ගුණය පිළිබඳවූවක් මිස බාහිර ඇඳුම පිළිබඳවූවක් නොවේ. ඇඳුම කුමක්වුවත්, ගුණයෙන් සම්පූර්ණනම්, හෙතෙමේ සාමාන්‍යයෙන් සංඝරත්නයෙහි පමණක් නොව, විශේෂයෙන් භික්ෂු පක්ෂයෙහිද අන්තර්ගත වෙයිඃ

පෙර දඹදිව බාහිය නම් එක්තරා මනුෂ්‍යයෙක් මුහුදු ගමනකදී නැව බිඳීමෙන් විපතට පත්ව, ඉන්දියාවේ බටහිර වෙරළෙහි සුප්පාරක නම් පටුනුගමට (බොම්බායට?) පාවී ආයේය. හෙතෙමේ එහි ගොඩ බැස, අඳින්නට වස්ත්‍ර නො තිබුණු බැවින්, ගස්පොතු සහ ලීපතුරුවලින් පැලැල්ලක් වැනි ඇඳුමක් සාදා එයින් විලි වසාගෙන, පළාත්වැසි ශ්‍රද්ධාවතුන්ගෙන් ලත් අහරකින් යැපෙමින්, තවුසකු මෙන් දැහැමි ජීවිතයක් ගත කරන්නට පටන්ගත්තේය. ලීපතුරුවලින් කළ වැහැරි හැඳි නිසා ඔහුට පළාත් වැසියෝ 'දාරුචීරිය' යි නම් කළහ. ක්‍රමයෙන් හෙතෙමේ අභ්‍යන්තර ධර්මයන්ගෙන් වැඩෙන්නට විය. දිනක් බාහිය තෙමේ බුදුරජාණන් වහන්සේ ගැන ආරංචියක් අසා සතුටුව, එයින් පිටත්ව, බටහිර වෙරළේ පටන් සැවැත් නුවර දක්වාවූ දීර්ඝ මාර්ගය ගෙවා, දුකසේ ගමන්කොට සැවැත් නුවරට ළඟාවිය. ඔහු විහාරයට පැමිණෙනවිට අවාසනාවකට මෙන්, භාග්‍යවතුන් වහන්සේ එහි නොසිටිසේක. උන්වහන්සේ පිඩුසිඟා වැඩිය බැව් භික්ෂූහු ඔහුට දැන්වූහ. හෙතෙමේ එහි පමා නොවී, ඒ මේ අත සොයමින් ගමන් කොට, එක්තරා වීථියකදී පිඩු සිඟා වඩින බුදුරජාණන් වහන්සේ දුටුයේය. දාරුචීරිය තෙමේ මහත් භක්තියෙන් උන්වහන්සේ ඉදිරියට ගොස් නමස්කාර කොට තමාට ධර්මය පහදා දෙන ලෙස ඉල්වීය. එය තමන් වහන්සේ

පිඬුසිඟා වඩින වේලාව බවත්, අහරකිස නිමවා දහම් දෙසිය හැකි බවත් බුදුරජාණන් වහන්සේ වදාළසේක. "සසර හැමදාම අපි අහර සොයන්නෝ වෙමු. ඔබ වහන්සේගේ හෝ මාගේ මරණය කොයි මොහොතේදැයි නියම නැත. එනිසා මට නොපමාව දහම් දෙසුව මැනැවැ"යි දාරුචීරිය තෙමේ බුදුරජාණන් වහන්සේගෙන් ඉල්වීය. භාග්‍යවතුන් වහන්සේ වීථියෙහි සිටගෙනම ඔහු සමග කථා කළසේක. බාහිය තෙමේ වහා සත්‍යය අවබෝධ කොට එහිදීම අභිත් ඵලයට පැමිණියේය. ඉක්බිති තථාගතයන් වහන්සේ සමීපයෙහි මහණ වන්නට තමාගේ කැමැත්ත දැක්විය. පා සිවුරු සපයා ගෙනෙන ලෙස භාග්‍යවතුන් වහන්සේ ඔහුට නියම කළසේක. හෙතෙමේ පා සිවුරු සොයන්නට පිටත් විය. අහෝ! ඔහුට වැඩිදුරක් යන්නට ඉඩ නො ලැබුණි. කුල්මත් වී දිවන ගවදෙනක විසින් මේ උත්තම මනුෂ්‍යයා ඇන මරන ලද්දේය. මේ ශෝකජනක ආරංචිය ඇසූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් විසින් පිරිවරන ලදුව එතැනට වැඩ භික්ෂූන්ට කතා කොට මිනිය ගෙන ගොස් ආදාහනය කරවා ඒ ධාතු නිධන් කොට චෛත්‍යයක් තනවන්නට නියම කළසේක. භික්ෂූහුද එය එසේම කළෝය. පසුව මේ සම්බන්ධයෙන් හටගත් කථාවකදී භාග්‍යවතුන් වහන්සේ දාරුචීරය මහරහතන් වහන්සේ ගැන භික්ෂූන්ට දේශනා කරමින්, "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං ඛිප්පාභිඤ්ඤානං යදිදං බාහියො දාරුචීරියො." යනුවෙන් "මහණෙනි, වහා සත්‍යාවබෝධය ලැබූ මාගේ ශ්‍රාවක භික්ෂූන් අතුරෙහි බාහිය දාරුචීරිය තෙමේ අග්‍රය"යි වදාළ සේක.

දාරුචීරිය මහරහතන් වහන්සේ සිවුරු පෙරවූ කෙනෙක් නොවූහ. සිවුරක් තබා උන්වහන්සේට කපුනූලින් වියන ලද සාමාන්‍ය වස්ත්‍රයක්වත් නොතිබුණේය. උන්වහන්සේගේ ඇඳුම ලී පතුරු පැලැල්ලක් වුවත්, ඉතා අසරණ පුද්ගලයකු වුවත්, එළදෙනක විසින් මගදී ඇන මරනු ලැබුවත්, භාග්‍යවතුන්

වහන්සේ මේ පුරුෂපුද්ගලයා තමන් වහන්සේගේ ශ්‍රාවක භික්ෂු සංඛ්‍යාවෙහි ඇතුළත් කොට වදාළ සේක. එපමණෙක්ද? වහා සත්‍යාවබෝධය කළ භික්ෂූන් අතුරෙහි ශ්‍රේෂ්ඨයා බැව්ද වදාළ සේක. බෞද්ධ සාහිත්‍යයෙහි උන්වහන්සේගේ නාමය 'දාරුචීරියත්ථෙර'යි සඳහන් වේ.

තව ද, සන්තති මහාමාත්‍ය තෙමේ සර්වාභරණයෙන් සැදි අලංකාර අමාත්‍ය ඇඳුමින් සැරසී සිටියදීම රහත් ඵලයට පැමිණ, ඒ ඇඳුමින්ම පිරිනිවී උත්තමයෙකි. එතුමා පැවිදි නොවීය. මේ පිළිබඳව හටගත් කථාවකදී, භාග්‍යවතුන් වහන්සේ එතුමා ගැන සඳහන් කරමින් "සො බ්‍රහ්මණො, සො සමණො, සභික්ඛු" "හෙතෙමේ බ්‍රාහ්මණයෙකි, හෙතෙමේ ශ්‍රමණෙකි, හෙතෙමේ භික්ෂුවකැ"යි වදාළසේක.

අෂ්ටාර්ය පුද්ගල සංඝරත්නය හා ඇඳුම අතර කිසිත් සම්බන්ධයක් නැති බවත්, යට කියන ලද අභ්‍යන්තර ධර්මයන්ගෙන් තොර නම් සිවුරු පෙරවූ පමණින් යමකු සංඝරත්නයට ඇතුළත් නොවන බවත්, ගිහි ඇඳුමින් සිටියද, ඒ ධර්මයන්ගෙන් යුත් පුද්ගලයා සංඝරත්නයට ඇතුළත්වන බවත් තේරුම් ගතයුතුයි.

**කියවන්නා** : එතකොට ගිහි පැවිදි භේදයක් නැද් ද?

**කර්තෘ** : ඇයි නැත්තෙ? ගිහි පැවිදි භේදයක් තිබේ. මෙය නිරවුල්ව තේරුම් ගත යුතුයි. භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවුවනක් පිරිසෙහි යටකී ගුණයන්ගෙන් යුත් සියල්ලෝම, ගිහි පැවිදි භේදයක් නොසලකා, ආර්ය සංඝරත්නයෙහිලා ගණිනු ලැබෙත්. මා කථා කරන්නේ භික්ෂු සංඝයා ගැන පමණක් නොව ශ්‍රාවක සංඝයා ගැනයි. 'ශ්‍රාවක' යනු 'ශිෂ්‍ය', 'ගෝල' යන තේරුමයි. 'සංඝ' යනු 'සමූහ', 'පිරිස' යන තේරුමයි. ශ්‍රාවක සංඝයා නම් භාගයවතුන් වහන්සේගේ ශිෂ්‍ය සමූහයායි,

ගෝල පිරිසයි. ඒ ගෝල පිරිස ගිහි පැවිදි දෙපක්ෂයෙන්ම යුක්ත වෙයි. පරිවෙණාචාර්‍යවරයකුගේ ගෝල පිරිස ගිහි පැවිදි දෙපක්ෂයෙන්ම යුක්ත වන්නාක් මෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාද ගිහි පැවිදි දෙපක්ෂයෙන්ම යුක්ත වෙයි. භික්ෂු සංඝයා ඒ මහා ශ්‍රාවක සංඝරත්නයෙහි අන්තර්ගත වෙයි. පැවිදි වුවද ඒ ගුණයන්ගෙන් යුක්ත නොවේ නම්, සංඝරත්නයෙහි අන්තර්ගත නොවෙයි. 'සංඝ' යන වචනය 'භික්ෂු' යන වචනයට වඩා විශාල අර්ථයක් ඇති එකකි.

**කියවන්නා :** එසේ නම් හැම භික්ෂුවම සංඝරත්නයට ඇතුළත් නැද්ද?

**කර්තෘ :** ගම්බද නුගත් මිනිස්සු කලිසම් අඳින කවරෙකුට වුවත් 'මහත්මයා' යි කියති. කලිසම් අඳිනවුන් අතර මහත්වරු සිටිති. එහෙත් ඔවුනතර ඒ නමට නුසුදුස්සෝ ඊටත් වඩා සිටිති. සිවුරු පෙරවූ සියල්ලන්ම සංඝරත්නයෙහි ලා ගණිත නුගත්තුද සිටිති. සිවුරු පෙරවුවන් අතර සංඝරත්නයට අයිති නොවන පහත්, අනාර්‍ය අදහස් සහ පැවතුම් ඇතියෝත් වෙසෙති. සංඝරත්නය ශ්‍රේෂ්ඨ එකකි. ඇඳුමක් මාරු කළ පමණින් යමෙක් එයට ඇතුළත් වෙයි නම් එය ඉතාම නොවටනා, පුළු එකක් විය යුතුයි.

**කියවන්නා:** ශාසනය පවත්නේ චීවරය පවත්නා තුරු පමණක් බවත්, චීවරය නැතිදා ශාසනයක් නැති බවත් අද ඉතාම උගත් ශ්‍රේෂ්ඨ පඬිවරුන් පවා පිළිගත් මතයකි. ඔබගේ අදහස ඊට වෙනස් බැව් පෙනේ.

**කර්තෘ :** මෙය හැම බෞද්ධ වේදිකාවකම පාහේ හඩනගන මතයක් බැව් මම දනිමි. එහෙත් එය මුළාවක් බැව් මගේ වැටහීමයි. චීවරය නම් සුදුරෙද්දක් කැබලිවලට කපා, මූට්ටු කොට මසා, පඬු පෙවා ගත් වස්ත්‍රයකි. මෙබඳු වස්ත්‍රයක් නැති වීමෙන් බුද්ධ

ශාසනය විනාශ වෙයි නම්, එය රුපියල් කීපයකට වඩා නො වටිනා දෙයක් විය යුතුයි. බුද්ධසාසනය නම් සත්‍යයයි. යම් කිසි ඇඳුම් විශේෂයක් නැතිවීමෙන් සත්‍යය අතුරුදහන් වේයයි කීම කොතරම් අසාධාරණ කථාවක්ද? බුද්ධශාසනය කිය-න්නේ කහපාටටද? බුද්ධශාසනය කියන්නේ කහපාට වස්ත්‍රවලින් සැරසුණු පුද්ගලයන් ගමන් කරනවා දකින්නට ලැබීමටද? යම්කිසි අදහසක් ගත්විට එය විසඳා පිරිසිඳ බැලිය යුතුයි.

මේ සම්බන්ධයෙන් කීමට කරුණු රාශියක් තිබේ. පසු කලක භික්ෂූහු මිනිසුන් රවටා බලය ලබන්නට, ගරු සත්කාර ලබන්නට සිතූහ. එනිසා ඔවුහු මෙබඳු නොඑක් මත පතුරුවන්නට පටන් ගත්හ. "බුද්ධශාසනය රකින්නෝ අපි වෙමු. අපෙන් තොරව, චීවරයෙන් තොරව බුදුසසුන් පවතී දැ?"යි ඔවුහු මිනිසුන් බිය ගන්වන්නට පටන් ගත්හ. වයස් ගතවූ පමණට, හිස තිකට පැසුණු පමණට, ඇඟ රැලි වැටුණු පමණට, ඇස කණ දුබල වූ පමණට, අත පය අවලංගු වූ පමණට මහලු තෙරුන් වහන්සේලා බුද්ධශාසනයට අයිති වාසිකම් කියන්නට පටන් ගත්හ. මේ ප්‍රයෝගයන් නිසා ලෝකයේ වැඩි දෙන මුළා වූහ. ගිහියන්ට බුද්ධශාසනය රැකිය නොහැකි බවත්, ඒ කවුරුනුත් වෙනුවෙන් භික්ෂූන් බුද්ධශාසනය රැක ගන්නා බවත් සිතන්නට ගිහි පැවිදි දෙපක්ෂයටම පුරුදු විය. නමුත් මේ රැක බලා ගෙන සිටින, මුර කරගෙන සිටින ශාසනය කුමක් දැයි සිතන්නට කවුරු වත් නතර නොවෙති.

ලෝකයෙහි සියල්ලන්ම බෞද්ධ භික්ෂූන් හැටියට පැවිදි වුවත් ඔවුනතර සත්‍යාවබෝධය ලැබූ එක පුද්ගලයකුත් නැත්නම්, සියල්ලෝම පාපෙයෙහි, අධර්මයෙහි ගැලී වෙසෙත් නම් ඔවුන් තුළ බුද්ධ ශාසනයක් පවතීයයි ඔබ සිතන්නෙහිද?

**කියවන්නා :** සැබැවින්ම නැත: ඔවුහු බුද්ධ ශාසනය නො රකිති.

කර්තෘ : එසේම, මේ ලෝකයෙහි එකම චීවරයක් නැතත්, කහපාට පටා අන්තර්ධානවුවත්, මනුෂ්‍යයෝ ධර්මයෙන් යුක්තනම්, ශීල, සමාධි, ප්‍රඥාවන් වඩත්නම්, සත්‍යාවබෝධය ලබත්නම්, ඔවුහු බුද්ධශාසනය නොරකිත්ද?

කියවන්නා : ඇත්තෙන්ම බුද්ධශාසනය රකින්නෝ ඔවුහුමය.

කර්තෘ : එසේනම් චීවරය නැතිදා බුද්ධශාසනය නැතැයි සිතීම කොතරම් මුළාවක්ද? චීවරය නැතිදා බුද්ධශාසනය නොව භික්ෂුවේශය නැතිවේ. භික්ෂුවේශය නැතිවූ පමණින්, එනම්, ඇඳුමක් නැතිවූ පමණින් සත්‍යය ලොවින් තුරන්වේයයි සිතීම ඉතාම ලොකු මුළාවකි. භික්ෂුවේශය නැතිවූ පමණින් සංඝරත්නය නැති නොවන බැව්ද තේරුම් ගතයුතුයි.

කියවන්නා : එතකොට, භික්ෂූන් නැතිව, ගිහියන්ට බුද්ධශාසනය රැකිය හැකිද?

කර්තෘ : බුද්ධශාසනය රැකීම නම් කුමක්ද? පාපයන්ගෙන් මිදීම, ධර්ම මාර්ගයෙහි ගමන් කිරීම, සිත පිරිසිදු කිරීම, බුද්ධශාසනය රැකීමයි. යම් කිසිවෙක් එසේ කරයි නම් හෙතෙමේ බුද්ධශාසනය රකියි. බුද්ධශාසනය පිටත රකින්නට තිබෙන යමක් නොව තමා තුළම රැකිය යුතු ධර්මයකි. ඉතින් භික්ෂූන් ගෙන් තොරව යමකුට බුද්ධශාසනය රැකිය නොහැකැයි කීමේ අදහස කුමක්ද? බුද්ධශාසනය රැකීමය කියන්නේ පන්සල් රැකීමටද? සාංඝික යන ව්‍යාජ නාමයකින් ලියා පදිංචිකරන ලද බූදලයන් රැක බලා ගැනීමටද? අද නම් බුද්ධශාසනයේ දියුණුවයයි කියනු ලබන්නේ ගමක් පාසා පන්සල් වැඩිවීමයි. වැඩි පිරිසක් නැතිව රැකිය නොහැකි දෙයක් ගැන බියවන්නාක් මෙන් මේ ගැනත් වැඩි පිරිසක් වුවමනායයි භය නොවිය යුතුයි. එක පුද්ගලයකුට, ඔබට, බුද්ධශාසනය තනිවම රැකිය හැක. එය ඔබගේ යුතුකමයි. "බුද්ධශාසනය රැකීම" යන වචනය තරම්

බෞද්ධයන් වරදවා තේරුම් ගත් වෙන වචනයක් භාෂාවේ ඇද්දැයි මම සැක කරමි. මේ රහස තේරුම් නොගැනීම නිසා අද ගිහි පැවිදි දෙපක්ෂයම ඉතා කනගාටුදායක තත්ත්වයක ජීවත් වෙති.

"අපි ගිහියෝ වෙමු. අපට ගුණදම් රකින්නට නුපුළුවන. බුදු සසුන රකින්නට නුපුළුවන. එය භික්ෂූන්ට භාරය" යි සිතා, ගිහි මිනිස්සු බුද්ධශාසනය රැකීමේ "කොන්ත්‍රාත්" වැඩය භික්ෂූන්ට භාරදී සිටිති. ඒ ගැන ඔවුහු භික්ෂූන්ට කෑම්, බීම්, ඇඳුම්, පැළඳුම්, ඉඳුම්, හිටුම්, සහ අනෙක් වුවමනා සියල්ලත් සපයති. එහෙයින් මේ "කොන්ත්‍රාත්" වැඩය හරියට නො කරන කල ඔවුහු භික්ෂූන්ට බැන වදිති. නොඑක් කපට, කෛරාටික කම්වලින් ධන සපයමින්, දුශ්චරිත කරමින් සිට, තමාට ඉඩ ඇති වේලාවක පන්සලට ගොස් පින් ගෙනෙන්නට භික්ෂුව ළඟ පින් එකතුකරගෙන තිබිය යුතුයයි ගිහියා සිතයි. භික්ෂුව දුස්සීල නම් ඔහුගේ ගබඩාවේ පින් නැත. එහි පින් නැතිවූ කල තමා පින් ගන්නේ කොතැනින් දැයි ගිහියා භයවී භික්ෂුවට බැන වදියි. හින්දු භක්තිකයෝ බමුණන්ට සංග්‍රහකොට ඔවුන්ගෙන් පින් ගන්නට සිතති. බමුණකු වරදක් කළ විට හින්දුවරු කෝපව ඔහුට බැන වදිති. බමුණා ළඟ පින් නැතිවීමෙන් තමන්ටත් පින් නැතිවේයයි ඔවුහු බිය වෙති. අද සාමාන්‍ය බෞද්ධයාගේ තත්ත්වය මීට දෙවෙනි නොවේ.

යම්කිසි භිකෂුවක් වරදක් කළවිට ඔහු බුද්ධශාසනය වනසතැයි ගිහියෝ කෑ ගසති. ගිහියා වරදක් කිරීමෙන් ඔහුත් බුද්ධශාසනය වනසන බැව් හෙතෙමේ නොසිතයි. ක්‍රිස්තියානි පූජකයෙකු වරදක් කළත්, මුස්ලිම්කාරයකු වරදක් කළත්, සැබැවින්ම එය බුද්ධශාසනය කඩ කිරීමකි. බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූයේ එක් පක්ෂයක පමණක් යහපත පිණිස නොවේ. උන්වහන්සේ සියල්ලන්ට සාධාරණය. එනිසා කවරකු වරදක් කළත් එය උන්වහන්සේගේ අවවාදය, ශාසනය නො රැකීමකි.

භික්ෂුවක් බරපතළ වරදක් කළ බැව් දැනගත් විට 'බුද්ධාගම පිරිහෙතැ'යි ක්‍රිස්තුභක්තිකයෝ ප්‍රීතියට පත්ව එය ඔවුන්ගේ පත්‍රවල පළකරති. ක්‍රිස්තියානි පූජකයකු එබඳු වරදක් කළ විට, 'ක්‍රිස්තියානිය පිරිහෙතැ'යි බෞද්ධයෝ ප්‍රීතියට පත්ව එයද ඔවුන්ගේ පත්‍රවල පළකරති. ඒ වරද කළ අවාසනාවන්තයා සියල්ලන්ට සාධාරණ සත්‍යය, ධර්මය අනුගමනය නොකිරීමෙන් විපතට පත්වූ බැව් ඔවුහු නොසිතති. අහෝ! අද ආගම්වල තත්ත්වය! බෞද්ධයෝ ධර්මය නොව බුද්ධාගම දියුණු කරති: ක්‍රිස්තු භක්තිකයෝ ධර්මය නොව ක්‍රිස්තියානි ආගම දියුණු කරති. ඔවුහු ධර්මය නැති කොට ආගම් දියුණු කරති. ඔවුහු ඒ ඒ ලේබල් අලවා ගත් පිරිස කොපමණදැයි ගණන් කරති. නමුත් සර්ව සාධාරණ ධර්මය, සත්‍යය ගැන නොසලකති. අද බුදුරාජාණන්වහන්සේ ජීවමානව ඇත්නම්, යම් කිසි ක්‍රිස්තියානි පූජකයකු වරදක් කළ විට, උන්වහන්සේ ඒ ගැන සංවේගයට පත්ව, ඔහුට අනුකම්පා කොට, ඔහු ඒ වැරදි මගින් බේරා ගෙන, හරිමඟෙහි ගමන් කරවන්නට වෑයම් කරන බැව්, අබ මල් රේණුවක පමණවත් සැකයක් නැතිව, අපි විශ්වාස කරමු. එසේ ම, ක්‍රිස්තුස් වහන්සේද ජීවමානව ඇත්නම්, අර වරද කළ භික්ෂුව ගැන කනගාටුවට පත්ව ඔහු එයින් මුදා, ඔහුට යහපතක් කරන්නට වෑයම්කරනු නො අනුමානයි. එහෙත් අද ඒ ආගම් ප්‍රකාශ කරන්නවුන්ගේ අදහස් කොතරම් පටුදැයි පුද්ගලිකදැයි සිතා බැලිය යුතුයි.

භික්ෂූන් වැරදි කිරීමෙන් බුද්ධශාසනය විනාශවෙතැයි සිතීම බලවත් මුළාවකි. මේ ලෝකයෙහි සියලුම භික්ෂූන් පාරාජිකාපත්තියට පැමිණ දුශ්ශීලයන් වුවත්, සිවුරු හැරියත්, බුද්ධශාසනය, එනම් සත්‍යය විනාශ නොවේ. එකකු වරදක් කළ බැවින් තවෙකකුගේ සත්‍යාවබෝධයට, නිවනට එයින් බාධාවක් වෙතැයි සිතා කලබල වීම ලොකු මුළාවකි. භික්ෂූන් වරද කරන නිසා අන්‍යයන්ට බුද්ධශාසනයෙහි යෙදෙන්නට,

ගුණ දම් රකින්නට, නිවන් දකින්නට ඇති බාධාව කිම? ශීලය, ධර්මය, සත්‍යයෙහි යතුර භික්ෂූන් අතේද? ශීලය, ධර්මය, සත්‍යය ගබඩාවක දමා ඔවුහු එය වසා ගෙන සිටිත්ද? භික්ෂූන් බුද්ධශාසනය නොරකිතැයි බැන වදිනවුන්ට මෙසේ කියන්නට කැමැත්තෙමි: "ඔබ ඒ දුර්වල භික්ෂුව ලවා බුද්ධශාසනය රක්කවන්නට සූදානම් වන්නේ ඇයි? බළලුන් ලවා කොස්ඇට බාවන්නට යන්නේ ඇයි? බුද්ධශාසනයට ඔබ එතරම් කැමැතිනම්, ඔබට එතරම් එය හොඳින් වැටහෙයිනම්, ඔබ එය නොරකින්නේ ඇයි? ගිහිගෙයි වෙසෙමින් බුදුසසුන් රැකිය නොහැකැයි ඔබ සිතන්නෙහි නම්, සියල්ල හැර දමා පැවිදිවී එය කරනු මැනවි."

**කියවන්නා:** මට තව කරුණක් දැනගන්නට තිබේ. සත්‍යය හා චීවරය අතර සම්බන්ධයක් නැති බැව් ඔබගේ කතාවෙන් පෙනේ. නමුත්, යම්කිසි ගිහියෙක් රහත්වීනම්, ඒ ගිහි වෙසින් ඔහුට සත් දිනකට වඩා ජීවත්විය නොහැකි බැව්ද, සත්දින ගතවන්නට පළමු පැවිදි නොවීනම් පිරිනිවන් පානා බවද තවත් පිළිගත් මතයකි. මේ ගැන ඔබ කුමක් සිතන්නෙහිද?

**කර්තෘ:** මෙය ද මට තේරුම් ගත නො හැකි මතයකි. රහත් ගුණය හා ඇඳුමක් අතර මෙබඳු සම්බන්ධයක් ඇතිවිය නො හැක. ඇඳුම උසස් දෙයක් හැටියට පෙනෙන්නේ අභ්‍යන්තරය පහත් පමණටය. ඥානයෙන්, ගුණයෙන් වැඩුණු පමණට බාහිර ඇඳුම් සුළු හැටියට පෙනෙයි. රහතන් වහන්සේ ඥානයෙන්, ගුණයෙන් අග තැන්පත් පුද්ගලයායි. උන්වහන්සේට ඇඳුම කුමක් වුවත් කම් නැත. සියලුම රහතන් වහන්සේලා අසවල් ඇඳුමින් පෙනීසිටිය යුතුයයි කීම ලොකු වරදකි. රහත් ගුණය විශේෂ ඇඳුමකට සීමාකිරීම ධර්මයක් නොවේ.

මෙය භික්ෂු පක්ෂයේ වාසියට ඇතිකර ගත් මතයක් බැව් පෙනේ. මේ ලෝකයේ ගුණධර්මයෙන් අගතැන්පත් කිසිවකුටත් භික්ෂු පක්ෂයට නොබැඳි, භික්ෂු ඇඳුමින් නොසැරසී සත් දිනකට වඩා ජීවත්විය නොහැකි බවත්, සත්දින ගතවන්නට පළමු භික්ෂු ඇඳුම නොඇන්දොත් ඔහු මරුට වසහවිය යුතු බවත් මෙහි අදහසයි. මෙයත් ධර්මයක්ද? අනෙක් මිනිසුන් අතර සුළු ගුණවතුන් සිටියද, හරි ගුණවතෙක් වෙයි නම්, ඔහු ස්වකීය පක්ෂයෙහිම විය යුතුයයි හැම ආගම් කාරයෝම සිතති.

මා සිතන හැටියට මේ අදහස බොහෝ දෙන වරදවා තේරුම් ගෙන තිබේ. රහත්වූ පුද්ගලයකු, වේශය කුමක් වුවත්, සත්දිනක් තබා එක මොහොතකුදු ගිහි ජීවිතයක් ගත නො කරන බැව්නම් ඇත්තකි. ගිහි ඇඳුමින් පෙනීසිටිය ද, පැවිදි ජීවිතය ගතකරන පින්වත්හුද අද පවා දක්නා ලැබෙති. සිවුරු පොරවාගෙන, භික්ෂු වේශයෙන් පෙනී සිටිනවුන් අතර ගිහි ජීවිතය ගතකරන්නෝත් දුර්ලභ නැත.

කියවන්නා ඃ ගිහි පැවිදි දෙපක්ෂයම සංඝරත්නයට අයත් වෙතොත් විනය පිටකය ඒ දෙපක්ෂයටමද?

කර්තෘ ඃ නැත. විනය පිටකය භික්ෂු, භික්ෂුණී දෙපක්ෂයට යි. එය සාමාන්‍යයෙන් ශ්‍රාවක සංඝයාට නොව විශේෂයෙන් භික්ෂු භික්ෂුණී දෙපක්ෂයේ සංඝයාටයි.

කියවන්නා ඃ එසේනම් සාංඝිකය ගිහි පැවිදි දෙපක්ෂයටම සාධාරණ ද?

කර්තෘ ඃ එයද එසේ නොවේ. භික්ෂු සංඝයාට පමණක් පවරන ලද්දක් භික්ෂුණී සංඝයාට හෝ වෙන කාහටවත් අයත් නොවේ. භික්ෂුණී සංඝයාට පමණක් පවරන ලද්දක් භික්ෂු සංඝයාටවත් අන්‍යයන්ටවත් අයත් නැත. සාමාන්‍යයෙන් ගිහි

පැවිදි දෙපක්ෂයට සාධාරණව යමක් කැපකරන ලද නම්, එය ඒ දෙපක්ෂයටම සමානය. එක් පක්ෂයකට පමණක් පවරන ලද්දක් තවත් පක්ෂයකට හිමිවිය නොහැක. එය ධර්මයට හෝ නීතියට නොගැළපේ. මෙය බෙදා තේරුම් ගතයුතුයි.

කියවන්නා : අද සාංඝික වස්තු ගැන ඔබගේ අදහස කෙසේද?

කර්තෘ : අද සාංඝික නාමයෙන් හඳුන්වනු ලබන වස්තූන් අතර ඇත්තවශයෙන් සාංඝික දේ ඉතාම දුර්ලභ බවත්, එයින් සියයට අනූගණනක් බරපතළ පුද්ගලික ඒවා බවත් මගේ අදහසයි. සතරදිගින් වඩින භික්ෂු සංඝයාටය කියා පූජා කළ ස්ථානය ටික දිනකින් එක නිකායක, එක පාර්ශ්වයක, එයිනුත් එක කුලයක, එක ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවක භික්ෂූන්ගේ පුද්ගලික බුදලයක් වෙයි. වෙන නිකායක හෝ, ඒ නිකායේම, එම පාර්ශ්වයේ වෙන ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පපරාවක භික්ෂුවක් එය පරිභෝග කරන්නට ආවොත්, කලකෝලාහලයෙන් හෝ නඩුමගට බැසීමෙන් ඔහු එතැනින් පන්නා දමනු ලැබේ. මෙය කවර නම් සාංඝිකයක්ද? දායකයෝද පන්සලක් සාදා 'අපි මෙය සාංඝික කරමුය' කියා එක නිකායක, එක පාර්ශ්වයක, එයිනුත් සිය කුලයේ එකම ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවකට බුදලයක් කොට පවරා දෙති.

අද සාංඝික යන ව්‍යාජ නාමයකින් හඳුන්වනු ලබන විශාල ධනයක් එයින් ලැබිය යුතු නියම ප්‍රයෝජනය නොලබා නිකරුණේ අඥාන ලෙස ආත්මාර්ථකාමී පුද්ගලයන් විසින් අපතයෙහි හරිනු ලැබේ. මේ ධනය මීට වඩා සියක් ගුණයකින් අර්ථවත් ලෙස පාවිච්චි කළහැකිව තිබේ. අද යම්තම්වත් සාංඝිකයයි කියහැකිව තිබෙන්නේ භික්ෂූන්ගේ පාලනය යටතේ නොව, සභා පාලනය යටතේ පවත්නා තැන්වලටය. අද 'සාංඝික' යනු පැවිදිවූවන්ගේ පුද්ගලික බුදලයකට ව්‍යවහාර කරන විශේෂ වචනයකි.

යම්කිසි දානචේතනාවක වටිනාකම පවත්නේ ආගම්භේද, ජාතිභේද, කුලභේදාදියෙන් හා පුද්ගලික අදහස්වලින් සිත තුරන්වූ පමණටය. සිත සීමාසහිතවූ පමණට දානයද සීමා සහිත වෙයි, විපාකයද සීමාසහිත වෙයි. සාංඝිකය එතරම් උතුම් දානයක් හැටියට ගණිනු ලබන්නේ එහි සීමා කිරීමක් නැති බැවිනි.

එක නිකායක පමණක් භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස ආරෝග්‍යශාලාවක් ගොඩනගන ලද්දේයි සිතමු. කෙසේවතුදු එය එක පාර්ශවයක භික්ෂූන්ගේ ප්‍රයෝජනය පිණිස ගොඩ නගන ලද්දකට වඩා අගනේ වෙයි. නමුත් ඒ ආරෝග්‍යශාලාව දෙනිකායක ප්‍රයෝජනය පිණිස ගොඩනගන ලද්දේ නම් වඩාත් අගනේ නොවේද?

කියවන්නා : ඔව්, එය වඩාත් අගනේ වෙයි.

කර්තෘ : ඒ ආරෝග්‍යශාලාව ලක්දිව තුන් නිකායටම සාධාරණව ගොඩනගන ලද නම්?

කියවන්නා : එය ඊටත් වඩා උතුම්.

කර්තෘ : නමුත් දැනට ඒ ආරෝග්‍යශාලාවේ ලක්දිව භික්ෂූන්ට මිස පිටරටින් පැමිණෙන සියම් බුරුමාදි භික්ෂූන්ට අවකාශයක් නැත. ඒ පිටරට සියලු භික්ෂූන්ටත් සමග ගොඩ නගන ලද නම් වඩාත් උතුම් නොවේද?

කියවන්නා : සත්තකින්ම එය එසේය.

කර්තෘ : දැනට මේ ආරෝග්‍යශාලාවට බෞද්ධ භික්ෂූන් හැර අන්‍ය ආගම්වල පූජකයෝ භාරගනු නොලැබෙත්. කිසිත් භේදයක් නැතිව අන්‍ය ආගම්වල පූජකයනුත් භාර ගෙන ආදරයෙන් කරුණාවෙන් සංග්‍රහ කරතොත් එය වඩාත් ශ්‍රේෂ්ඨ වැඩක් නොවෙයිද?

කියවන්නා : නමුත් ආගමානුකූලව එබඳු සාංඝිකයක් තිබේද?

කර්තෘ : මට වුවමනා කරන්නේ 'සාංඝික' යන ඒ ලේබලයවත්, ඒ පිළිබඳව ස්ථිර කරගත් ව්‍යවස්ථාවත් නොවෙයි. මධ්‍යස්ථව, සාධාරණව, නිදහස්ව, නොඑක් අදහස්වලට වාල් නොවී, ආගම්භේදයක් නැතිව, ධර්මානුකූලව මෛත්‍රී කරුණා සහගතව සිතන විට, එය වඩා ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බැව් ඔබට නොවැටහෙන්නේ ද?

කියවන්නා : ඒ සාංඝිකවල වගක් නැතිව, ආගම්භේදයක් නැතිව, නිදහස්ව, මෛත්‍රී කරුණා සහගතව, සාධාරණ ලෙස සිතන විට නම්, සැබැවින්ම එය ශ්‍රේෂ්ඨ බැව් පෙනෙයි.

කර්තෘ : එසේ නම් එය ශ්‍රේෂ්ඨ බැව් නොවැටහෙන්නේ ආගම් භේදයෙන් යුක්තව, වහල්ව, මෛත්‍රී කරුණාවත් නැතිව, අසාධාරණ ලෙස සිතනවිට බැව් එහි අදහසයි. ඒ කොයි හැටි වෙතත් කිසිත් ආගම්භේදයක් නැතිව, සියලු පැවිද්දන්ට සංග්‍රහකරන ආරෝග්‍යශාලාව එක ආගමක පැවිද්දන්ට සංග්‍රහකරන ආරොග්‍යශාලාවකට වඩා ශ්‍රේෂ්ඨ බැව් ඔබට පෙනෙයි.

ඒ ආරෝග්‍ය ශාලාවේ සියලුම රටවල, සියලුම ජාතිවල, සියලුම ආගම්වල ගිහි පැවිදි දෙපක්ෂයටම, එනම්, සාමාන්‍යයෙන් මනුෂය වර්ගයාට කිසිත් භේදයක් නැතිව එකම මෛත්‍රියෙන් කරුණාවෙන් සංග්‍රහ කරතොත් යටකී සියල්ලටම වඩා ශ්‍රේෂ්ඨ නොවේද?

කියවන්නා : සැබැවින්ම එය ශ්‍රේෂ්ඨය.

කර්තෘ : හොඳයි, මනුෂ්‍යයාට පමණක් නොව තිරිසන් සතාට පවා ආදරයෙන් කරුණාවෙන් එහි සංග්‍රහ කරතොත් ඊටත් වඩා උතුම් නැද්ද?

කියවන්නා : ඒකාන්තයෙන්ම එය උතුම්ය.

කර්තෘ : මෙසේ කිසිත් වෙනසක් නැතිව සියලු සත්වයන්ට උපස්ථාන කරන ආරෝග්‍යශාලාවකැයි කීමෙන් අදහස් කරන්නේ ඉඩමේ සහ ගොඩනැගිල්ලේ විශාලකම නොව අදහසේ සාධාරණකම සහ විශාලකමයි. ස්ථානය ඉතාම කුඩා එකක් විය හැක. ඒ ස්ථානයට දැරිය හැකි පමණින් කිසිත් භේදයක් නැතිව ක්‍රියා කරන බැව් එහි අදහසයි. දාන චේතනාවක වටිනාකම දියුණුවන හැටි ඔබට මෙයින් තේරුම් ගන්නට පුළුවන් වේයිය සිතමි.

කියවන්නා : අද සාංඝික වශයෙන් දස විසි නමකට, සියක් නමකට, දහස් නමකට දෙන දන් ගැන ඔබ කුමක් සිතන්නෙහිද?

කර්තෘ : අද සාංඝිකය කියා දන් දෙන ක්‍රමය ටිකක් දුර සිතා බලන්නකුට සිනහ උපදවයි. දායකයෙක් භික්ෂූන් දස නමකට දානයක් පිණිස ආරාධනා කරයි. ඒ දස නමට වේලකට යැපෙන්නට පමණ ආහාර පාන වර්ග සිය තිවසෙහි පිළියෙළ කරයි. එහෙත් ඒ දස නම ගෙදරට වැඩමවා ගෙනගිය පසු, සතර දිගින් වඩින මහා සංඝයාටය කියා ඒ දස නමට අර දානය පිළිගන්වයි. භික්ෂූහුද තමන් සැරියුත්-මුගලන් පරම්පරාවෙන් පැවැතෙන බැව් කියා ඒ උත්තමයන් සිහි කරගෙන දානය පිළිගන්වන්නට දායකයාට නියම කරති. තමන්ගේම ගුණයක් නැති බැවින්, ආත්ම ශුද්ධියක්, ආත්ම විශ්වාසයක් නැති බැවින්, සැරියුත්-මුගලන් ආදි උත්තමයන්ගේ නමට මුවාවී භික්ෂූහුද එය වළඳති. මෙය කුමන සාංඝිකයක්ද?

වරක් එක්තරා දායකයෙක් තම හිත මිත්‍ර භික්ෂූන් දස නමකට පමණ දවස් ගණනක පටන් ඒ ඒ තැනට ගොස් ආරාධනා කොට, ගෙදරට වැඩමවා "සාංඝික" දානයක්

දුන්නේය. ඒ දානයේදී ප්‍රධානව ක්‍රියා කළ භික්ෂූන් වහන්සේ කිසිත් පැකිළීමක් නැතිව, ඒ දානය සංඝරත්නයට සාංඝික වශයෙන් දෙන බැව්ද එහි මහත්ඵල මහානිසංසයද ප්‍රකාශ කොට දායකයා ලවා සාංඝික වාක්‍යය කියවූහ. ඒ දෙපක්ෂයම ඔවුනොවුන්ට වංචාකාරයෝ වූහ.

සමහරවිට තුන් නමක් වස් එළඹ සිටිනා පන්සලට වස් දන් ගෙන ගිය පසු, හදිසියෙන් එහි තවත් දෙනමක් සිටියොත්, "අපට සාංඝික දානයක් දෙන්ට ලැබුණා"යි දායකයෝ සතුටුව වාක්‍යය කියා අර පස් නමට ඒ දානය පිළිගන්වති. වාක්‍යය කීවත් නොකීවත් ඒ දානය අර පස් නම වළඳනා බැව් ඔවුහු දනිති. වාක්‍යය කීවත් නොකීවත් තවත් නමක් වැඩිපුර පැමිණියොත්, ඒ නමටද එසින්ම සංග්‍රහ කරන බැව්ද ඔවුහු දනිති. නමුත් සිත රවටා වැඩිපුර "පින්" ගන්නට වාක්‍යය කියා සාංඝික කරති.

එක්තරා පළාතක "ඌනපූරණ" සාංඝික දානයක් දුන් හැටි ඊට සම්බන්ධවූවෙක් මා සමග විස්තර කළේය.: පාත්‍රයෙන් බත්පිඩක් අනා වැළඳූ වහාම, ඒ ගත් බත් පිඩෙන්වූ අඩුව පිරෙන්නට එතනට බත් බෙදනු ලැබේ. මෙසේ වළඳා ඉවරවූ පසුත් පාත්‍රයෙන් කිසිත් අඩුවක් නොවූ බැව් දැක්ම ඔවුන්ගේ අදහසයි. ඒ පිනින්, මතු ජාතිවල කොපමණ වියදම් කළත්, අර පාත්‍රවල බත් අඩු නොවූවාක් මෙන් ධනයේ අඩුවක් නොවේවායි ඔවුහු ප්‍රර්ථනා කරති. මේ විහිළුවලට බුද්ධාගමේ නම එක් කිරීම කොතරම් කනගාටුදායක දෙයක්ද?

අද පවත්නා පරිදි, සියක් නමට, දහස් නමට දන් දෙන ක්‍රමය ඇත්තෙන්ම නුවණැතියන් සිනස්සන අඥාන වැඩ පිළිවෙළකි. පන්සිය නමකට "මහා සාංඝික දානයක්" දීමට පිළියෙළ කරනු ලැබේ. හැතැප්ම සිය ගණන් ඈතින් භික්ෂූහු දුම්රියෙන්ද, කාර්වලින්ද, බස්වලින්ද දහඩිය දමාගෙන, හති දමාගෙන අවුත්, කිසිත් ප්‍රීතියක් නැතිව එක වේලක් අහර

වළඳා ආපසු යති. ඒ දානය වෙනුවෙන් රුපියල් දහස් ගණනක් වියදම් වෙයි. නමුත් කිසිත් ප්‍රත්‍යක්ෂ අර්ථයක් නැත. ඒ භික්ෂූහු ධර්ම සාකච්ඡා සම්මේලනයකට වඩිත් නම්, සැබැවින්ම මෙය ඊටත් වඩා වියදම් කොට පැවත්විය යුතුයි. එහි ප්‍රත්‍යක්ෂ අදහසක් තිබේ. එහෙත් එක වේලක් කෑම පිණිසම මෙතරම් දුරකතර ගෙවාගෙන පැමිණීමේ අදහස කුමක්ද? මෙ බඳු ජාතියකත් යම්කිසි දියුණුවක් ඇතිවිය හැකිද? ඒ භික්ෂූන්ට තමතමන් වැඩ සිටින පළාත්වල ආහාරයෙන් අඩුවක් නැත. නමුත් ඒ දන් දෙන පළාතෙහි සාගින්න නිවා ගන්නට අහර නැති, චිළි වසා ගන්නට රෙදි කැබෙල්ලක් නැති අසරණයෝ බොහෝය. ඔවුන් ගැන කිසිත් නොසලකා මෙබඳු සිනහ උපදවන දේ කරන්නට අද බෞද්ධයෝ පුරුදුව සිටිති. සැබවින්ම මේ අඥාන සිරිත් ජාතික පරිහානියේ හේතුහු වෙත්. රට හදන්නට යන ජාතිහිතෛෂීන් මේවා ගැන සිතා බැලිය යුතුයි.

බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදීද, සිය ගණන් භික්ෂූන්ට මහ දන් පැවැත්වූ බැව් සඳහන් වෙයි. එය අද මෙන් නොඑක් පළාත්වලින් භික්ෂූන් එකතු කොට කිසිත් අදහසක් නැතිව කරන දන්දීමක් නොවීය. චාරිකාවේ හැසිරෙන බුදුරජාණන් වහන්සේත් සමග සිය ගණන් භික්ෂූහු වඩිති. ඒ පිරිස යම් පළාතකට පැමිණි විට, ඒ පළාත් වැසියන් විසින් උන්වහන්සේලාට සත්කාර කළ යුතුයි. එසේ නැතහොත් උන්වහන්සේලාට ජීවිතය රැක ගන්නට ක්‍රමයක් නැත.

ඒ ඒ පළාත්වල වැඩ සිටින භික්ෂූන්ට පළාත් වැසියන් විසින් සංග්‍රහ කළ යුතුයි. උන්වහන්සේලාගේ දුවදුක් සොයා බැලිය යුතුයි. එය ඔවුන්ගේ යුතුකමයි. නමුත් ආහාර පානාදියෙන් කිසිත් අඩුපාඩුවක් නැති භික්ෂූන් හැතැප්ම සිය ගණන් ඈතින් වැඩමවා, ඒ භික්ෂූන්ට කරදර කොට දන්දීමේ අදහස කුමක්ද? මෙසේ පන්සියක් නමට, දහස් නමට ප්‍රසිද්ධ දන් දීමේදී මුහුණ පාන්නට සිදුවන තවත් අපරාධයක් නම්

සත්වඝාතනයයි. මස් මාංශ වළඳන භික්ෂූන් සිය දහස් ගණනක් එක දිනක එක තැනකට දානයක් පිණිස රැස්වන බැව් දැනගත් විට මස්කඩකාරයෝ බලාපොරොත්තු සහිතව විශේෂයෙන් වැඩිපුර සතුන් මරති.

අවසන් කරන්නට පළමු, තව වචන ස්වල්පයක් කියන්නට මම කැමැත්තෙමි. මේ අදහස් වරදවා තේරුම් නො ගත යුතුයි. භික්ෂූන්ට දන්දීම නුවුවමනාය කියාවත්, නැවැත්විය යුතුය කියාවත්, සිහිනයකින් හෝ තේරුම් නොගත යුතුයි. සුසීල, දුස්සීල භේදය ගැන වාද නොකොට, වුවමනා අයට වුවමනා තැනදී දන්දීම බෝධිසත්ව ගුණයයි. දන් දෙන්නේ තමන්ට පින් ගැනීමට නොව ලබන්නාට සැප දීම පිණිසයි. අද බොහෝ දෙන පිනට කෑදර වීමෙන් මුළාවී නොඑක් විහිළු දේ කරති. අනවශ්‍යවූ දෙයක්, නිෂ්ඵල දෙයක්, ප්‍රත්‍යක්ෂ තේරුමක් නැති දෙයක් ආගමේ නම කියා ගෙන අඥාන ලෙස කිරීම පින්කමක් වන්නේ කෙසේද? පින්කමක් නම් අවශ්‍යවූ, ප්‍රඥා සහගතවූ ක්‍රියාවක් විය යුතුයි. පිනේ නමින් අද කරන මෙබඳු වැඩවලින් රාශියක්ම රටේ ජාතියේ, මනුෂ්‍යයන්ගේ අභ්‍යන්තර බාහිර දෙකේම පිරිහීමට හේතුවී පවත්නා බැව් නුවණැතියන්ට පෙනේ.

සංඝරත්නයට ගිහි පැවිදි දෙපක්ෂයම අයත් බැව් කීමෙන් නුවණ මද ගිහියකුට "අපිත් සංඝරත්නයට අයත් වෙමුය" යි අහංකාරව කතා කරන්නට ඉඩ ලබාගත හැක. නමුත්, ඒ අහංකාර සිතත් සමගම ඔහු සංඝරත්නයෙන් යොදුන් සිය දහස් ගණනක් ඈත් වන බැව් තේරුම් ගත යුතුයි. අමුතුම ජීවිතයක් ගත කරන පැවිද්දෙකුටත් සංඝරත්නයට අයත්වීම පහසු නොවේ. ඉතින් සාමාන්‍ය ගිහියෙකුට එහි අන්තර්ගතවීම කොතරම් අපහසු ක්‍රියාවක්ද? ගිහිපැවිදි දෙපක්ෂයම සංඝරත්නයට අයත්ය කියා ගිහියන් විසින් පැවිද්දන්ට පැවැත්විය යුතු සමාජ චාරිත්‍රයන්, ආචාර සමාචාරයන් යමකු

සැහැසි ලෙස ඉක්මවතොත් සැබැවින්ම එය ඉතා කනගාටුදායක කරුණකි. පැවිද්දාට ගිහියා විසින් ගරු කිරීම ශිෂ්ට සමාජයේ හැම කල්හි ම පවත්නා යහපත් සිරිතකි. මේ කරුණු නිසි පරිදි බෙදා, විසදා, නුවණින් තේරුම් ගත යුතුයි.

පිටකවරය : ජයසිරි සේමගේ

ISBN 955-20-823-9